රණවිරුවා

2023 ජනවාරි• 251 කලාපය

අත ඇස ගැටුණි එදවස රණබිමට හුරු
හිතවත මතක බොහොමයි පා තැබුව යුරු
සෙත සුව සදනු රිසියෙන් ලක් මවට ගරු
නැත කළ මෙහෙය අමතක දිවි තිබෙන තුරු

- ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ -

ක්‍රියාන්විත හේතූන් වත තුවාල ලැබූ අන්නිඛිය ධිමිදු සෙන් වැදුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා යුද්ධ හමුදාධිපති පසුගියදා එහි සංචාරයක නිරත විය.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

2023 සුබ නව වසරේ වැඩ අරඹමින්

2023 වර්ෂයේ පළමු වැඩකරන දිනය සනිටුහන් කරමින් සංවිධානය කෙරුණු උත්සවය ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි මස 02 වන දින පැවැත්විණ. එහිදී, නිලධාරීන් සහ සෙසුනිලයන්ගෙන් සැදුම්ලත් පෙළපාලිය අභිමුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පිළිවෙලින් ජාතික කොඩිය සහ යුද්ධ හමුදා කොඩිය ඔසවනු ලැබූහ. මෙම අවස්ථාවේදී විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීඩී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් රාජ්‍ය ප්‍රතිඥාව කියවන ලදී.

එහිදී, යුද්ධ හමුදාධිපති හටපිරිස් ආමන්ත්‍රණය කරමින්, යුද්ධ හමුදා සාමාජිකයන් පසුගිය දශක කිහිපය තුළ විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා කැපවීමෙන් සිදුකළ කාර්යභාරය අගය කළ අතර, රටේ යහපත වෙනුවෙන් යුද්ධ හමුදාවට පැවරී ඇති නව වගකීම් හමුවේ ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳවද අවධාරණය කළේය.

ගාල්ල නගර සභා පුරහල ප්‍රතිසංස්කරණය කෙරේ

වර්ෂ 1800 දක්වා දිගු ඉතිහාසයකට උරුමකම් කියන ගාල්ල නගර සභා පුරහල පසුගියදා ප්‍රතිසංස්කරණ කෙරිණි. එහි නගරාධිපති ප්‍රියන්ත ජී සහබන්දු මහතාගේ ඉල්ලීමකට අනුව 10 වන (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස් ඒ සඳහා තාක්ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වය ලබාදුන්හ. යුද්ධ හමුදාධිපති විසින් ලබාදුන් උපදෙස් මත සිදුකළ එහි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 76 ක් පමණ වැය වූ අතර, ඊට මූල්‍ය අනුග්‍රාහකත්වය ගාල්ල නගර සභාව විසින් ලබාදෙන ලදී.

10 වන (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ වත්මන් අණදෙන නිලධාරී මේජර් ආර්පීඒ රෝහණ එල්එස්සී ඇතුළු එම ඒකකයේ හිටපු අණදෙන නිලධාරීන් තිදෙනකුගේ සමීප අධීක්ෂණය යටතේ 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ව්‍යපෘතිය පසුගිය ජනවාරි 14 වන දින නිමවිය. එලෙස ප්‍රතිසංස්කරණය කරන ලද නගරසභා පුරහල අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය ජනවාරි 14 වන දින පැවති උත්සවයකදී ජනතා අයිතියට පත් කරන ලද අතර, එම අවස්ථාව සඳහා ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ කර්නල් සේනාවිධායක සහ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඑම්එස් කුමාර ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් පිරිසක්ද සහභාගී වූහ.

"මිහිඳු ආයුර්වේද සුව අරණ" ස්ථාපිත කෙරේ

යුද්ධ හමුදාධිපති ගේ අදහසකට අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව මානුෂීය මෙහෙයුමේදී රණක්ෂිතයට පත්ව අත්තිඩිය "මිහිඳු සෙත් මැදුර" සුවතා නිකේතනයේ දැනට නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටින වීරෝදාර රණවීරුවන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා "මිහිඳු ආයුර්වේද සුව අරණ" නමින් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් ඉකුත් ජනවාරි 11 වන දින ස්ථාපිත කෙරිණි. මෙම මධ්‍යස්ථානය විවෘත කිරීමේ අවස්ථාවට එම සුවතා නිකේතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ටීඑස් බාලසූරිය ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සමඟින් ආයුර්වේද වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩල සාමාජිකයෝ පිරිසක් සහභාගී වූහ. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් ප්‍රතිකාර ලබන රණවීරුවන් සමඟ පිළිසඳරක නිරතවෙමින් ඔවුන්ගේ සුවදුක් සොයා බලන ලද අතර, ඔවුන් වෙත ත්‍යාග පාර්සල්ද බෙදා දුන්හේය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, හටකාර්ය සම්පාදක අණයක මූලස්ථාන ආඥාපති, යුධෝපකරණ මාස්ටර් ජෙනරාල්, විධායක ජෙනරාල් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද එක්වූහ.

ඓතිහාසික 4 ගජබා රෙජිමේන්තුව යළි ස්ථාපනය කෙරේ

2007 වර්ෂයේදී යාන්ත්‍රික පාබල රෙජිමේන්තු ඒකකයක් බවට පරිවර්තනය කරනු ලැබූ 4 ගජබා රෙජිමේන්තුව නැවත ස්ථාපනය කරමින් එම ඒකකයේ සම්ප්‍රදායානුකූල ධජ ප්‍රදානෝත්සවය ඉකුත් ජනවාරි 20 වන දින සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබිය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තු අධිපති යුතිතනත් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිවීපී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය. ඒ අනුව ගජබා රෙජිමේන්තුව යටතේ ඇති 24 වන ඒකකය ලෙස 4 ගජබා රෙජිමේන්තුව යුග මෙහෙවරට එකතුවිය.

1987 අගෝස්තු 15 වන දින ස්ථාපනය කරනු ලැබූ 4 ගජබා රෙජිමේන්තුව මාතෘභූමියේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම උදෙසා සුවිශේෂී සේවාවක් ඉටු කළ ඒකකයකි. මෙහෙයුම් අවශ්‍යතා මත එම ඒකකය විසුරුවා හැර 2007 පෙබරවාරි මස 04 වන දින 3 යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ලෙස නැවත ස්ථාපනය කරන ලදී. වසර 23 කට ආසන්න කාලයකට පසුව යුද්ධ හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබූ යුද්ධ හමුදා නියෝගයක් මගින් ගජබා රෙජිමේන්තුවේ කණිෂ්ඨතම නිත්‍ය ඒකකය වන 24 ගජබා රෙජිමේන්තු ඒකකය විසුරුවා හැර 4 ගජබා රෙජිමේන්තුව ලෙස නැවත ස්ථාපනය කිරීමට කටයුතු යෙදිණි.

වර්ෂ 1993 - 1994 කාලය තුළ 4 ගජබා රෙජිමේන්තුවේ විධායක අධිකාරි වශයෙන් රාජකාරි කරනු ලැබූ වත්මන් යුද්ධ හමුදාධිපති එම බළඇණිය ප්‍රතිස්ථාපනය කිරීමේ ඓතිහාසික අවස්ථාවකට එක්වීම විශේෂත්වයකි.

මෙම උත්සවය සඳහා ආරක්ෂක සේනා (වත්නි) ආඥාපති, 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විධායක ජෙනරාල්, විශ්‍රාම දිවියට එළඹි 4 ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසු නිලයින් රැසක් සහභාගී වූහ.

යුද්ධ හමුදාධිපතිට මව් විදුහියගෙන් හරසර

යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිඑපී ආර්එස්පී එන්ඩියූ වෙත සිය මව් විදුහල වන මාතලේ විජය විද්‍යාලයෙන් පසුගියදා උපහාර පුදනු ලැබිය. ඒ නිමිත්තනේ ඉකුත් ජනවාරි 19 වන දින එම විද්‍යාලයේ සංවිධානය කෙරුණු අභිමානවත් උපහාර උත්සවයට සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත විද්‍යාලයීය ශිෂ්‍යභට කණ්ඩායම වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි. එම අවස්ථාවට විදුහල්පති රාජිත තික්ෂණ මහතා, ගුරුභවතුන් සහ ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

උපහාර පිදීමේ අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපති විසින් වර්ෂ 1886 ඉදිකරන ලද දිස්ත්‍රික්කයේ පැරණිතම බෞද්ධ විද්‍යාලය වූ එම විජය විද්‍යාලයේ නිර්මාතෘ සහ බෞද්ධ පුනරුදවාදියකු වූ ශ්‍රීමත් හෙන්රි ස්ටිල් ඕල්කට්තුමාගේ පිළිරුව වෙත පුෂ්පෝපහාර දක්වන්නටද අමතක නොකළේය. එහිදී එම පාසල් පරිශ්‍රයේදී සිසු සිසුවියන් හා ගුරුවරුන් සමඟින් තම අතීත පාසල් දිවියේ සොයුරු මතක ආවර්ජනය කළ හෙතෙම ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගන්නටද කටයුතු කළේය. එසේම පාසලේ අභිවෘද්ධිය උදෙසා සිසු සිසුවියන්ට ක්‍රීඩා උපකරණ, ශිෂ්‍ය භට බණ්ඩයට පාවහන්, පුස්තකාලයට පොත්පත් සහ විද්‍යාලයීය අරමුදලට මූල්‍ය දායකත්වයක් ද ලබාදෙන ලදී. එහිදී, යුද්ධ හමුදාධිපති එහි රැස්ව සිටි පිරිස අමතමින් තමන් එම විද්‍යාලයේ ගතකළ කාලයේ රසවත් තොරතුරු ඔවුන් හා බෙදාහදා ගන්නටද අමතක නොකළේය.

විද්‍යාලයේ අතිදක්ෂ ක්‍රීඩකයකු වූ යුද්ධ හමුදාධිපති එහි ශිෂ්‍යභට බණ්ඩයේ සාමාජිකයකු, විද්‍යාලීය බාලදක්ෂ කණ්ඩායමේ සාමාජිකයකු මෙන්ම ප්‍රධාන ශිෂ්‍ය නායකයකු ලෙසද කටයුතු කොට විද්‍යාලයට ඉමහත් කීර්තියක් අත්කර දුන් දීප්තිමත් ශිෂ්‍යයෙකි.

විරුවන්ට සවියක්වූ

"ගජබා විරුසවිය"

ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානය සහ එහි සේවා වනිතා ඒකකය එක්ව එම රෙජිමේන්තුවේ සේවයේ නියුතු, විශ්‍රාමික, සිවිල් සේවක සහ මියගිය සාමාජිකයින් අතරින් තෝරාගත් දරු දැරියන් 162 කු වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 21 වන දින එම රෙජිමේන්තු පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිවීපී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ගජබා රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මියගේ අදහසකට අනුව ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය යටතේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සිසු සිසුවියන් 102 කු, සාමාන්‍ය පෙළ සමත් සිසු සිසුවියන් 36 දෙනකු, විශ්වවිද්‍යාල වරම් ලැබූ සිසු සිසුවියන් 11 දෙනකු සහ තෝරාගත් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 13 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ සහ මූල්‍ය ආධාර පරිත්‍යාග කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති, 22, 52 වන සේනාංකවල සේනාංකාධිපතිවරු, යුද්ධ හමුදා විධායක ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, එහි සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්, සෙසුනිලයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

රග්බි සහ පාපන්දු ක්‍රීඩාවට නව ජවයක්

මෙරට රග්බි සහ පාපන්දු කණ්ඩායම් අතරින් කැපී පෙනෙන දක්ෂතා දක්වන යුද්ධ හමුදා රග්බි සහ පාපන්දු කණ්ඩායම් සඳහා නව ජවයක් ලබාදෙමින් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ ඉදිකරනු ලැබූ නව රග්බි සහ පාපන්දු ක්‍රීඩාපිටිය ඉකුත් ජනවාරි 04 වන දින යුද්ධ හමුදාධිපති සහ ගජබා රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ.

අභිනවයෙන් ඉදිකරනු ලැබූ මෙම ක්‍රීඩාපිටියෙහි නිර්මාණය කර ඇති ඩිජිටල් ලකුණු පුවරුව විවෘත කිරීමද යුද්ධ හමුදාධිපති විසින් එහිදී සිදුකරන ලදී. ඉන් අනතුරුව, යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ ලිලේඩියර් කේඑඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායකගේ ඇරයුමෙන් එහි පැවති සුහද රගර් තරඟයේ ක්‍රීඩකයින් හඳුනාගැනීම සිදුවිය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාධිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක්ද සහභාගී වූහ. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ හටපිරිස් මෙම මනරම් ක්‍රීඩාපිටිය ඉදිකිරීමට ශ්‍රමදායකත්වය සැපයූහ.

යුද්ධ හමුදාධිපති කණ්ඩුල දැකබලාගනී

පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ පසුගිය ජනවාරි 04 වන දින පැවති නව ක්‍රීඩාපිටිය විවෘත කිරීමේ උත්සවය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉන් අනතුරුව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මංගල වස්තුව වන නවවන කණ්ඩුල හස්ති පෝතකයා ද දැකබලා ගත්තේය.

පින්නවල අලි අනාථාගාරය සහ වනජීවී දෙපාර්තමේන්තුව සමඟ සමීප සහයෝගයෙන් යුතුව 2022 නොවැම්බර් මස 24 දින මෙම හස්ති පෝතකයා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත රැගෙන එනු ලැබිය. ශ්‍රී ලංකා පාබල හමුදාව දෙහිවල ජාතික සත්වෝද්‍යානය සමඟ එකඟතාවයෙන් පවතින නීති රීතිවලට අනුකූලව මෙම නව හස්ති පෝතකයාගේ භාරකාරත්වය ලබාගෙන තිබේ. ජාතික හා හමුදා උත්සවයන්හිදී වර්ණ හා ඓතිහාසික ගෞරව එක් කිරීම සඳහා අදාළ හස්ති පෝතකයා යොදාගනු ලබයි.

මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ පාඨමාලාව ඇරඹේ

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව විදේශ රටවල රැකියා අවස්ථා උදාකරදීමේ අරමුණින් විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් සකසන ලද "මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ පාඨමාලා අංක - 1" සමාරම්භක උත්සවය ඉකුත් ජනවාරි 09 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ.

සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ සංකල්පයකට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය වෙතින් ආරම්භ කරන ලද මෙම පාඨමාලාව බිම්බෝම්බ ඉවත් කිරීමේ රාජකාරි සඳහා විදේශයන්හි සෙදවිය හැකි සේවයේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයන් 500 දෙනකුගේ සහභාගීත්වයෙන් අදියර තුනක් යටතේ පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

නුදුරේදී විශ්‍රාම ගැන්වීමට නියමිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා උපසේවයට අයත් ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් 152 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන මෙම පාඨමාලාව 2023 ජනවාරි මස 12 වන දින බූ ඔය ඉංජිනේරු බලසේනා මූලස්ථානයේදී ආරම්භ වී 2023 පෙබරවාරි මස 06 වන දින අවසන් කිරීමට නියමිතව ඇත. ජාත්‍යන්තර නියෝජිත ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා විදේශ රැකියා සඳහා සෙදවීමෙන් රටට අවශ්‍ය විදේශ විනිමය ලබාගැනීමත් විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්ගේ විශ්‍රාමික ජීවිතය ආර්ථික දුෂ්කරතාවයකින් තොරව අර්ථවත් අයුරින් ගතකිරීමට අවස්ථාව සලසාදීමත් ප්‍රධාන අරමුණ කරගනිමින් මෙම පාඨමාලාව ආරම්භ කර ඇත.

පාඨමාලාවේ සමාරම්භක උත්සවයේදී, ඒ සඳහා සහභාගීවන්නන්ට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මූල්‍ය ප්‍රදානයක්ද සිදුකරනු ලැබිය. එම මූල්‍ය ප්‍රදානය යුද්ධ හමුදාධිපති ගේ සුරතින් බළලක් නිලධාරී I ඩබ්ලිව්එම් සිරිනන්ද වෙත ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් සීඩී විරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මෙන්ම ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු පිරිසක් සහභාගී වූහ.

"සෙනෙහස" තොරතුරු කේන්ද්‍රයෙහි උපදේශකවරු යුද්ධ හමුදාධිපති හමුවෙති

නාරාහේන්පිට මැනිංටවුන් හි පිහිටි "සෙනෙහස" අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රයෙහි උපදේශකවරු පිරිසක් පසුගිය ජනවාරි 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිඑපී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. එම කේන්ද්‍රයෙහි ප්‍රධාන අධීක්ෂණ නිලධාරිනී සහ රණවිරු සේවා අධිකාරියේ උප සභාපතිනී සෝනියා කෝපිපේගොඩ මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් මෙම නියෝජිත පිරිසට උපදේශක ළමා ස්නායු විශේෂඥ වෛද්‍ය සරාජ් විජේසේකර, ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ආසිරි හේවාමාලාගේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ වෛද්‍ය හර්ෂ දුලාරි විජේසේකර යන මහත්මීන් ඇතුළත් වූහ.

"සෙනෙහස" අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය, ආරක්ෂක අමාත්‍යාංශය සමඟින් රණවිරු සේවා අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන අතර, එමඟින් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියෙහි රාජකාරී කරනු ලබන සාමාජිකයන්ගේ පවුල්වල විශේෂ අවශ්‍යතා ඇති දරුවන් රැකබලා ගනිමින් ඔවුන්ගේ වැඩකටයුතු පහසු කිරීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව ලබාදෙන පුහුණු මධ්‍යස්ථානයක් ලෙසද කටයුතු කරයි.

'ෆ්ලෑෂ් කොම්' (FLASH COM) ගුවන්විදුලි සන්නිවේදන යන්ත්‍රය යුද්ධ හමුදාධිපති වෙත භාරදෙයි

යුද්ධ හමුදාවේ පාලන කටයුතු විධිමත්ම පවත්වාගෙන යාම සඳහා ගුවන්විදුලි සන්නිවේදන පද්ධතිවල අවශ්‍යතාවය සපුරාලමින් 10 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ හටපිරිස් විසින් එකලස් කරන ලද නව "ෆ්ලෑෂ් කොම්" (FLASH COM) නම් ගුවන්විදුලි සන්නිවේදන යන්ත්‍රය පසුගිය ජනවාරි 05 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිඑපී ආර්එස්පී එන්ඩීයූ වෙත නිල වශයෙන් භාරදෙන ලදී.

වර්තමාන යුද්ධ හමුදාවට විශ්වාසවන්ත සහ ආරක්ෂිත යුද සන්නිවේදන උපකරණවල අවශ්‍යතාවයන් පිළිබඳ අවබෝධ කරගත් සංඥා බලකාය යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් හා ප්‍රධාන සංඥා නිලධාරී ගේ සෘජු අධීක්ෂණයෙන් මෙම ගුවන් විදුලි සන්නිවේදන යන්ත්‍රය එකලස් කරනු ලැබීය. යුද්ධ හමුදාවේ පරිපාලනමය අවශ්‍යතාවයන්ට යොදාගැනීමේ අරමුණින් ආනයනික කොටස් භාවිතා කරමින් පහසුවෙන් රැගෙන යාමට හැකිවන පරිදි මෙම ගුවන්විදුලි සන්නිවේදන යන්ත්‍රය ශ්‍රී ලංකා සංඥා බලකායේ විශේෂඥයින් විසින් අඩු පිරිවැයක් දරමින් වැසිදියුණු කරනු ලැබ ඇත. 10 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්එම්බීඑම්ඩී හේරත් යූඑස්පී ප්‍රමුඛ එම ඒකකයේ හටපිරිස් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ එක්ව ක්‍රියාවට නැංවූ මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නිවේදන ක්ෂේත්‍රයේ තිරසාරභාවය සහ ආරක්ෂක නිෂ්පාදනය පිළිබඳ දිගුකාලීන සැලසුම්වල තවත් පියවරකි.

එකෙර මෙහෙයට වෛද්‍ය කණ්ඩායමක්

දකුණු සුඩානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් පවත්වාගෙන යනු ලබන දෙවන මට්ටමේ රෝහලෙහි සාමසාධක රාජකාරී සඳහා පිටත්ව යාමට නියමිත 9 වන වෛද්‍ය කණ්ඩායම ඉකුත් ජනවාරි 25 වන දින වේරහැර පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත සිය ගෞරවාචාරය පිරිනමනු ලැබූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ කර්නල් සේනාධිධායක සහ යුද්ධ හමුදා කාර්ය නියුක්ත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රිගේඩියර් පීඒසී ප්‍රනාන්දු යූඑස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ සපැමිණි යුද්ධ හමුදාධිපති එහිදී, පිටත්ව යාමට නියමිත සාමසාධක කණ්ඩායමේ අණදෙන නිලධාරි වෙත ජාතික ධජය, එක්සත් ජාතීන්ගේ ධජය, යුද්ධ හමුදා ධජය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා ධජය භාරදෙනු ලැබිය. නිලධාරීන් 17 ක් හා සෙසුනිලයින් 49 ක් සමඟ යුද්ධ හමුදා සාමාජිකයින් 66 දෙනකුගෙන් සමන්විත මෙම පිරිසට කර්නල් එම්පීඑස්ආර් අමරසේකර යූඑස්පී අණදීම සිදුකරනු ලබන අතර මේජර් ජේඒඩීඑස්එච් ජයසිංහ දෙවන අණදෙන නිලධාරී ලෙස කටයුතු කරයි.

මෙම කණ්ඩායමේ සංයුතියට වාපිටු භාර හෙදියන්, හෙදියන්, සත්කාර හෙදියන් (නාරිවේදය), ශල්‍යාගාර තාක්ෂණ ශිල්පීන්, භෞතික චිකිත්සකවේදීන් (DPM), විකිරණ (Xray) වේදීන්, විකිරණ (Xray) තාක්ෂණික ශිල්පීන්, දන්ත සහයකයන්, දන්ත කාර්මිකයන්, වෛද්‍ය සහයකින්, ඔසුසැල් කාර්මිකයන්, විද්‍යාගාර කාර්මිකයන්, විද්‍යාගාර තාක්ෂණ විද්‍යාඥයින්, සන්නිවේදන තාක්ෂණික ශිල්පීන්, සනීපාරක්ෂක සහයකයන්, පරිපාලන ලිපිකරුවන්, සූපවේදීන්, ගිලන් රථ රියදුරන්, සනීපාරක්ෂක රාජකාරි නියුතු පුද්ගලයින් සහ මෘත ශරීරාගාර සහයකයන්ගෙන් සමන්විතය. එම පිරිසට යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ සෙබළුන් 40 දෙනෙක්, යුද්ධ හමුදා සංඥා බලකායේ සෙබළුන් 02 ක්, ඉංජිනේරු සේවා බලකායේ සෙබළුන් 02 ක්, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සෙබළුන් 04 ක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය නියෝජනය කරමින් සෙබළකු ද ඇතුළත් වේ. මේ වනවිට දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි සඳහා යොදවා සිටින 8 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම එක්සත් ජාතීන්ගේ විධිවිධානවලට අනුකූලව ඔවුන්ට පැවරූ රාජකාරීන් සාර්ථකව නිමකර පෙබරවාරි මස 2 දින ආපසු සිය රට බලා පැමිණීමට නියමිතව ඇත.

යුද්ධ හමුදා මූල්‍ය අධ්‍යක්ෂ සිය ධූරයෙන් නික්ම යයි

අධ්‍යාපන අමාත්‍යාංශයේ නව ධූරයේ රාජකාරි භාරගැනීම සඳහා නික්ම යන යුද්ධ හමුදා මූල්‍ය අධ්‍යක්ෂ නිමල් කරුණාතිලක මහතා පසුගිය ජනවාරි 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

වර්ෂ 2008 සැප්තැම්බර් මස 8 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ධූරය සඳහා පත්කරනු ලැබූ නිමල් කරුණාතිලක මහතා වර්ෂ 2018 මාර්තු මස 21 දින යුද්ධ හමුදා මූල්‍ය අධ්‍යක්ෂ ලෙස පත්කෙරිණි. සිය ධූරයේ රාජකාරි භාරගත් දින සිට මේ දක්වා එතුමන්ගේ අමිල සේවය යුද්ධ හමුදාව වෙනුවෙන් ලබාදෙනු ලැබිය. මෙම සුහද හමුව සමාප්තියේ, යුද්ධ හමුදාධිපති නික්ම යන නිමල් කරුණාතිලක මහතා වෙත සිය කෘතඥතාවය පළකරමින් විශේෂ සමරු තිළිණයක්ද ප්‍රදානය කළේය.

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති 4 ශ්‍රීලංකාගුවන් සංචාරයක

ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී ඉකුත් ජනවාරි 03 වන දින එම මූලස්ථානයේ සහ ඒ යටතේ පාලනය වන 4 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායෙහි සංචාරයක නිරත විය. එහිදී, සියලු අංශ ආයතන නිරීක්ෂණය කළ හෙතෙම හටපිරිස්වල රාජකාරී කටයුතු සහ ඔවුනගේ සුඛසාධක අවශ්‍යතා පිළිබඳ සොයා බැලීය.

දිරිය දායකයගේ නිසට සෙවණක්

ඉකුත් කාලසීමාව තුළ ජාතික මට්ටමේ ජයග්‍රහණ රැසක් ලබා පසුව කාන්තා ජාතික ක්‍රිකට් සංචිතයේ (අවුරුදු 19 න් පහළ) සාමාජිකාවක් බවට පත්වෙමින් යාපනයේ චූල්ලිපුරම්හි වික්ටෝරියා විද්‍යාලයට සම්මාන ගෙන ආ සෙල්වරාසා කිරිස්ටිගා මෙනවියට නව නිවසක් ඉදිකරදීමට 513 වන පාබල බලසේනාවේ හටපිරිස් කටයුතු කරනු ලැබූහ. එහිදී, ඉදිකෙරුණු නව නිවස ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී විසින් පසුගිය ජනවාරි 06 වන දින එම ක්‍රීඩිකාව ඇතුළු ඇගේ පවුලේ සාමාජිකයන් වෙත භාරදෙන ලදී.

තියාහි පුණ්‍යායතනයේ නිර්මාතෘ සහ සභාපති වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතා විසින් මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබාදුන් අතර චූලිපුරම් කෝවිලේ භාරකරුවන් විසින් ඒ සඳහා අවශ්‍ය ඉඩම පරිත්‍යාග කරන ලදී. යාපනය ප්‍රදේශයේ අනෙකුත් ක්‍රීඩාලෝලීන් දිරිමත් කිරීමේ අරමුණින් මෙම නිවස ඉදිකිරීම සඳහා යුද්ධ හමුදා හටපිරිස්වල තාක්ෂණික දැනුම හා ශ්‍රම දායකත්වය ලබාදෙනු ලැබිය.

මෙහෙණින් වහන්සේලා 5000 ක් වෙනුවෙන් දානමය පිංකමක්

මිහින්තලේ දැනට ප්‍රතිසංස්කරණය කරමින් පවතින "අනුලාසෑය" අභියසදී මෙහෙනින් වහන්සේලා 5000 ක් සඳහා දානමය පිංකමක් ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මූලිකත්වයෙන් පසුගිය දෙසැම්බර් මස 26 වන දින සිදුකෙරිණි. මිහින්තලේ සහ ශ්‍රීපාදයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, වියට්නාමයේ මහකොමසාරිස්, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ඉදිරි නාඩත්තු පෙදෙස (උතුරුමැද) ආඥාපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් මෙම මාහැඟි පුණ්‍ය කටයුත්ත සඳහා සහභාගී වූහ.

පුනරුත්ථාපනලාභීන්ගේ සුහද එකමුතුවක්

අත්හිටියෙහි පිහිටි මිහිඳුසෙත් මැදුර සුවසහන මධ්‍යස්ථානයේ නේවාසිකව ප්‍රතිකාර ලබන පුනරුත්ථාපනලාභීන්ගේ සහ එහි කාර්යය මණ්ඩලයේ සුහදත්වය වර්ධනය කිරීම පිණිස ඉකුත් දෙසැම්බර් 20 වන දින සුහද හමුවක් පැවැත්විණ. ඊට අන්තර් ආයතන අත්පන්දු තරඟාවලියක්, හැඩියාවන් විදහා දැක්වීම පිණිස වූ සංගීත ප්‍රසංගයක් හා සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ඇතුළත් විය.

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සංචාරයක

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී පසුගියදා එම මූලස්ථානය යටතේ ඇති සේනාංක හා ඒකකවල සංචාරයක නිරත විය. ඒ අනුව ඉකුත් දෙසැම්බර් 22 වන දින 12 වන ගැමුණු හේවා බළඇණියේ ක්‍රියාත්මක හා පාලන කටයුතු පිළිබඳ සොයා බැලූ හෙතෙම එම හටපිරිස් හමුවී ඔවුන්ගේ රාජකාරි ස්වභාවය හා පාලන අවශ්‍යතා පිළිබඳ සුහද කතාබහකද නිරත වූවේය. එම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ඒ කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද එම අවස්ථාවට එක්විය.

තවද, ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති ඉකුත් ජනවාරි මස 5 සහ 6 යන දෙදින තුළ 22 වන පාබල සේනාංක මූලස්ථානයේ සහ ඒ යටතේ පාලනය වන ඒකකයන්හිද සංචාරය කළේය. එහිදී, 221, 222 සහ 223 වන පාබල බලසේනා සහ 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය, 15 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, 5 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය. සිය සංචාරයේදී එම හටපිරිස්වල පාලන අවශ්‍යතා, රාජකාරි ස්වභාවය ආදිය පිළිබඳ සොයාබැලූ හෙතෙම ඔවුන් සමඟද සුහද කතාබහක නිරත විය.

ගුවන් සංග්‍රාමික පුහුණු පාඨමාලා අංක 25 සාර්ථකව අවසන්

නිකවැව ගුවන් සංග්‍රාමික පුහුණු පාසල වෙතින් පවත්වන ලද ගුවන් සංග්‍රාමික පුහුණු පාඨමාලා අංක 25 සාර්ථකව හදාරන ලද හටපිරිස් විසිර යාමේ උත්සවය පසුගිය ජනවාරි 11 වන දින පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සහභාගී විය.

මෙම පාඨමාලාව සඳහා 1 වන බලකාය යටතේ රාජකාරියෙහි නියුතු නිලධාරීන් තිදෙනකු සහ සෙසු නිලයින් 140 දෙනකු සහභාගී වූහ. එහි දක්ෂතම ශිෂ්‍යයා ලෙස ලාන්ස් කෝප්‍රල් ජීනරත්න ජේඑස්සී ද, දක්ෂතම වෙඩික්කරු ලෙස කෝප්‍රල් බණ්ඩාර ඩබ්ලිව්එම්ඩීඑන් ද සහතික හිමිකර ගත්හ. විසිරයාමේ උත්සවය සඳහා 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ගුවන් සංග්‍රාමික බලසේනාවේ සේනාවිධායක, යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

ආසේමු (මූලසිව්) ආඥාපති සේනාංක සංචාරයක

ආසේමු (මූලසිව්) ආඥාපති මේජර් ජෙනරාල් යුඩි විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී පසුගියදා එම මූලස්ථානය යටතේ පාලනය වන සේනාංකවල සංචාරයක නිරත විය. ඒ අනුව ඉකුත් දෙසැම්බර් 26 වන දින 59 වන පාබල සේනාංකයේද ජනවාරි 11 වන දින 68 වන පාබල සේනාංකයේද සංචාරය කරමින් එහි හටපිරිස්වල රාජකාරී ස්වභාවය හා ඔවුනගේ අවශ්‍යතා පිළිබඳ සොයාබලමින් ඔවුන් සමඟ සුහද කතාබහකද නිරතවිය. එම අවස්ථාවට 59 සහ 68 වන පාබල සේනාංකවල සේනාංකාධිපතිවරුද එක්වූහ.

දිවි සවියට සත්කාරයක්

ආසේමු (මූලසිව්) හි රාජකාරී සිදුකරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ සේවය අගය කිරීම වෙනුවෙන් රු.5000.00 ක් වටිනා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් එහි ආඥාපති මේජර් ජෙනරාල් යුඩි විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 06 වන දින එම මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ.

"අපි පටන් ගනිමු" පැළ බෙදාදීමේ වැඩසටහනක්

උදා වූ 2023 වර්ෂය ආරම්භ කරමින් ආරක්ෂක සේනා (බටහිර) වෙතින් ඉකුත් ජනවාරි මස 02 දින යුද්ධ හමුදා ජනපදය තුළ පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ ඒකක වෙත කොස්, මී සහ මහෝගනී ඇතුළු පැළ බෙදාදීමේ වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.

"අපි පටන් ගනිමු" යන තේමාව යටතේ ඉඩම් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද "ජාතික ගෙවතු වගා" තරඟයට සමගාමීව මෙම කාලීන වැදගත් වැඩසටහන බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීඩී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මඟපෙන්වීම යටතේ සංවිධානය කරන ලදී. පැළ ලබාදීම කළුතර ප්‍රාදේශීය අඩවි වන කාර්යාලය මඟින් සිදුකෙරිණ.

අඩුආදායම්ලාභීන් සඳහා කිරිපිටි පරිත්‍යාගයක්

සීමාසහිත ෆොන්ටෙරා බ්‍රෑන්ඩිස් ලංකා සමාගම විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක් යටතේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා කිරිපිටි පැකට් 4536 ක් බෙදාදීමට ක්‍රියාකරන ලදී. හරිත කෘෂිකර්ම ක්‍රියාන්විත මධ්‍යස්ථානය සහ ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) මෙම කටයුත්තට දායකවිය. ඒ යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක ප්‍රාදේශීය බලප්‍රදේශයට අයත් තවත් අඩුආදායම්ලාභී පවුල් 80 ක් සඳහාද පසුගිය ජනවාරි 05 වැනි දින කිරිපිටි පැකට් බෙදාදීමට ක්‍රියාකෙරිණි. ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට සීමාසහිත ෆොන්ටෙරා සමාගමේ දකුණු ආසියානු කළමනාකාර අධ්‍යක්ෂ යච්චාන් විග්නේෂ්වරන් මහතා ඇතුළු පිරිසක්ද එක්වූහ.

ආසේමු(මධ්‍යම) ආඥාපති 12 වන පාබල සේනාංකයේ සංචාරයක

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පසුගිය ජනවාරි 12 සහ 13 යන දෙදින තුළ 12 වන පාබල සේනාංක බලප්‍රදේශයේ නිරීක්ෂණ සංචාරයක නිරතවිය. එහිදී, ඓතිහාසික වැඩිහිටි කන්ද හා කතරගම දේවාලය වැඳපුදාගත් හෙතෙම ඉන් අනතුරුව 12 වන පාබල සේනාංක මූලස්ථානය, 121 හා 122 වන පාබල බලසේනා මූලස්ථානවලද 23 වන ගජබා රෙජිමේන්තුව, 20 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව හා 18 ගැමුණු හේවා රෙජිමේන්තුවේද සංචාරය කරමින් එහි හටපිරිස් හමුවී ඔවුනගේ රාජකාරි හා පාලන අවශ්‍යතා පිළිබඳව සොයාබැලීය. මෙම අවස්ථාවට 12 වන පාබල සේනාංක සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීසී, 121 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ब्रिगේඩියර් එල්ජේඑල්බී උඩෝවිට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ब्रिगේඩියර් කේඑම්එන් කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී මෙන්ම ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක්

ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය තුළ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා ඔවුන් වෙත පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජනවාරි 05 වන දින පැවැත්විණි. මේ යටතේ ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව බදුල්ල දෙමෝදර සවිදම් දෙමළ විද්‍යාලයේ දුවා දරුවන් 50 දෙනකු වෙත අදාළ පාසල් උපකරණ කට්ටල බෙදාදීම සිදුකෙරිණි. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ब्रिगේඩියර් ප්‍රධාන මාණ්ඩලික ब्रिगේඩියර් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට එම මූල කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් ඩබ්ලිව්ඒජේ හේමචන්ද්‍ර ආර්එස්පී හා ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් ඩීආර්ඩීකේ කොහොම්බන් ඇතුළු නිලධාරී සෙසුනිල රැසක් සහභාගී වූහ.

දෙවසරක අභිමානය සමරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය

අම්බලන්ගොඩ, කරන්දෙණිය ප්‍රදේශයේ ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ 2 වන සංවත්සරය පසුගිය ජනවාරි මස 02 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් රැසක් එම බලකායේ කර්නල් සේනාධිපතියක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එස්එම් අමෙසේකර ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්වූයේ සියලු නිලයින්ගේ සාමූහික එකමුතුවෙනි. එහිදී, ආගමික වතාවත් මධ්‍යයේ ඇරඹි සංවත්සර කටයුතු අතර බලකාධිපති වෙනුවෙන් පිරිනැමුණු සම්මාන පෙළපාලිය, ගටපිරිස් ඇමතීම, සියලු නිල දිවා භෝජනය බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේදී පැවති සුහද හමුව ප්‍රධාන විය.

තවද, අභිනවයෙන් ඉදිකරන ලද නිලධාරි විවේකාගාරය හා සෙසුනිල භෝජනාගාරය විවෘත කිරීමද සංවත්සර උත්සවයට සමගාමීව සිදුකෙරිණ. කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා සහාපතිනී ශාන්ති අමෙසේකර මහත්මිය, මධ්‍යස්ථාන සේනාධිපතියක ත්‍රිගේඩියර් පීආර්තිලේ බණ්ඩාර ආර්එස්පී මෙන්ම එකක අණදෙන නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් එම අවස්ථාවට එක්වූහ.

> සරුසාර හෙට දවසකට පාර කියන යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය අද වනවිට මෙරට කෘෂි ආර්ථිකය නගාසිටුවීමෙහිලා උරදරා සිටිනුයේ දැවැන්ත කාර්යභාරයකටය. දෙවසරක් වැනි කෙටි කාලයක් තුළ නව සංකල්පයක් බිහිකරමින් අප රටතුළ විප්ලවීය වෙනසක් ඇතිකිරීමට එම බලකාය සමත්ව ඇති බව පවසනුයේ අතිශයෝක්තියෙන් තොරවය. දෙස රැකි දෑත්වලින් දෙස ගොඩනගන අපූර්ව හරහා එම බලකාය යුද්ධ හමුදාවටද සමස්ත රටටමද පෙන්වාදී ඇත්තේ කදිම ආදර්ශයකි

ආබාධිත වීරුවන්ට කෘත්‍රිම පාද

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් පාද අහිමිවී දැනට විශ්‍රාම ගන්වා සිටින කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සෙසුනිලයින් 10 දෙනකු වෙත කෘත්‍රිම පාද ලබාදීමේ වැඩසටහනක් පසුගිය ජනවාරි 21 වන දින එම රෙජිමේන්තු දේශන ශාලාවේදී පැවැත්විණ. මෙම වැඩසටහනෙහි සම්බන්ධීකරණ කටයුතු කෞෂාල් සංජය පෙරේරා යන අය විසින් සිදුකරන ලද අතර, දුලිනි සරත්චන්ද්‍ර, සඳුනි උඩගේ, ජයරුවන් දිසානායක, යන මහත්ම මහත්මීන් සහ රෙසඳුල් දිසානායක ඇතුළු දානපතීන් විසින් මූල්‍ය ආධාර හා පූර්ණ දායකත්වය ලබාදුන්හ.

කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාධිපතියක ත්‍රිගේඩියර් ඩීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් හා මගපෙන්වීමෙන් එම රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑම්එස්ඩී දිසානායක ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

එනෙරින් පිදුම් ලැබ

ඉංජිනේරු සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්චිලල්ජ් අමරපාල ආර්ඩබිලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී පිලිපීනයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ 2022 වසරේ හොඳම ආදි ශිෂ්‍යයාට හිමි සම්මානයෙන් පිදුම් ලබා ඇත.

ජාතික ආරක්ෂක පරිපාලන නිත්‍ය පාඨමාලා - 56 (2022/2021) තුළදී ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කැපී පෙනෙන දක්ෂතාවයන් හඳුනාගැනීම සිදුකෙරේ. එහිදී, ඉංජිනේරු ජාතික ආරක්ෂාව, සංවර්ධන සහ ඉදිරිපත් කිරීම් යන ක්ෂේත්‍රවලදී මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි දක්වා තිබූ සුවිශේෂී දක්ෂතාවයන් හඳුනාගත් පිලිපීනයේ ජාතික ආරක්ෂක විද්‍යාලය මඟින් ඔහුව ගෝලීය මට්ටමින් ඇගයීමට ලක් කරන ලදී.

තවද, හෙතෙම 2020/2021 වසරේ එහි පැවති *"National Security Administration Regular Course - 56"* පාඨමාලාවට සහභාගී වී ඉන් හොඳම නිබන්ධනය සඳහා රන් පදක්කම සහ අධ්‍යයන විශිෂ්ටත්වය වෙනුවෙන් වූ ලෝකඩ පදක්කම දිනාගනිමින් යුද්ධ හමුදාවට කීර්තියක් අත්කරදී ඇත. ඔහු ලද ජයග්‍රහණ හා ඇගයීම් වෙනුවෙන් "රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.

61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ පළමු නිල සංචාරය

61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබිලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ඉකුත් ජනවාරි 13 වන දින 612 පාබල බලසේනාව, 12 වන ඉංජිනේරු බලකාය සහ 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායෙහි සංචාරයක නිරතවිය. මෙම සංචාරයේදී 612 වන පාබල බලසේනාධිපති සහ අණදෙන නිලධාරීන් ගේ පිළිගැනුම් මධ්‍යයේ එහි යපැමිණි සේනාංකාධිපති වෙත ඔවුන්ගේ මෙහෙයුම් සහ පරිපාලන කටයුතු පිළිබඳව සවිස්තරාත්මක දැනුවත් කිරීමක් ද සිදුකළහ. එහිදී, එම හටපිරිස්වල රාජකාරි කටයුතු හා පරිපාලන අවශ්‍යතා, වෙනත් ගැටළු සබැඳිව සේනාංකාධිපතිගේ අවධානය හිමිවිය.

සංවත්සරය නිමිත්තෙන් ලේ දන්දීමේ වැඩසටහනක්

15(සෙවි) ගජබා රෙජිමේන්තුවේ 26 වන සංවත්සර දිනයට සමගාමීව ලේ දන්දීමේ වැඩසටහනක් යාපනය ශිෂ්‍යණ රෝහලෙහි වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව ඉකුත් ජනවාරි 17 වන දින එම ඒකකයේදී පැවැත්විණ. මේ සඳහා 52 වන පාබල සේනාංකය සහ ඒ යටතේ ස්ථාපිත පාබල බලසේනා සහ ඒකකයන්හි රාජකාරි නියුතු අයවළුන් අතරින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් 79 දෙනකු සහභාගී වූහ.

මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලාව

මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ උසස් පාඨමාලාව අංක 30 පසුගිය වසරේ නොවැම්බර් 08 වන දින සිට දෙසැම්බර් 06 වන දින දක්වා කුකුලේගඟ සාමයාධක මෙහෙයුම් ආයතනයේදී පැවැත්විණ. එහිදී, 2 ශ්‍රීලංකාආබමු ඒකකයට අනුයුක්තව රාජකාරි කරන සෙ/2කිවි03647 කෝප්‍රල් දිසානායක ඩිඑම්පේමේ යන කොනොනි ත්‍රිවිධ හමුදා සෙසුනිලයින් 33 දෙනකු අතරින් ප්‍රථම ස්ථානයට පත්විය. තත් කොනොනි මීට පෙරද මූලික උපදේශක පුහුණු පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමි කරගරනීමටද සමත් වී ඇති දක්ෂ සෙබළෙකි.

සායන නිවසක් ඉදිකිරීමට මුල්ගල තබයි

නැගෙනහිර කලාපයේ අසරණ වූ ජනතාවගේ ජීවන තත්ත්වය තංචාලීමේ සමාජ සුබසාධනය අඛණ්ඩව සිදු කරමින් 11 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් කොහොඹගස්තලාව, මඩකලපුව මංගලගම සහ අම්පාර මායිමේ ගැහිනි මාතාවන් සඳහා දීර්ඝකාලීන අවශ්‍යතාවක් වූ සායන නිවසක් ඉදිකිරීම ආරම්භ කෙරිණ. නව සායන නිවස ඉදිකිරීමේ අවශ්‍යතාව ප්‍රක්ෂේපණය කිරීමෙන් පසු එක්සත් රාජධානියේ පදිංචි නදීර කහටපිටිය මහතා, "අපි මනුස්සයෝ" පුණ්‍ය පදනමේ සාමාජික තනෝජ් තියගම මහතා සහ සඟිකලා මෙනවිය සම්බන්ධ කර ගනිමින් මෙම සායන නිවස ඉදිකිරීමට මූල්‍ය අනුග්‍රහය දැක්වීමට ඉදිරිපත් විය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති විසින් ඉකුත් ජනවාරි 17 වන දින ඒ සඳහා මුල්ගල තබන ලදී.

පාසල් ළමුන් සඳහා දිවා ආහාර වේලක්

1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ හටපිරිස් විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගනු ලැබූ පාසල් 3 ක් සඳහා ඉකුත් ජනවාරි 18 වන දින දිවා ආහාර වේලක් ලබාදෙන ලදී. මෙම වැඩසටහන සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි පාසල් අතුරින් පාසල් 3 ක පාසල් ළමුන් 59 දෙනකු සඳහා මෙම දිවා ආහාර ලබාදීම සිදුකළ අතර, 143 පාබල බලසේනාවේ බලසේනාධිපති තුමන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළඇණියේ හටපිරිස් මේ සඳහා දායකත්වය ලබාදී ඇත.

වැඩිහිටියන් සඳහා දිවා ආහාර වේලක්

ධර්මපුරම් ප්‍රදේශයේ පිහිටා ඇති නාමසිවාය වැඩිහිටි නිවාසයේ නේවාසිකව රැඳිසිටින වැඩිහිටියන් සඳහා දිවා ආහාර වේලක් ලබාදීම සහ ඔවුන් හට අවශ්‍ය ඇඳුම් බෙදාදීමේ සත්කාරයක් පසුගියදා සිදුකෙරිණි. නත්තල් දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ මෙම කටයුත්ත 572 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේඩීපීපී විමලරත්න ආර්ඩබ්ලිඑම්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු අතර, මෙම අවස්ථාවට 57 වන පාබල සේනාංකයේ නිලධාරීන් හා සෙසුනිලයින් රැසක්ද සහභාගී වූහ.

රුක් රෝපණය කිරීමේ වැඩසටහන්

66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අදහසකට අනුව 661 වන පාබසේමු යටතේ පාලනය වන 5 (සෙව්) යාපාරෙ ඒකක බලප්‍රදේශයේ අරසකුලපුරම් වැව ආශ්‍රිතව පැළ රෝපණය හා බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි මස 01 වන දින සංවිධානය කරන ලදී. එහිදී, මහෝගනී හා කුඹුක් පැළ 50 බැගින් රෝපණය කෙරිණි. මෙම වැඩසටහන සඳහා 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 661 පාබසේමු බලසේනාධිපති හා තවත් නිලධාරීන්, සෙසුනිලයින් මෙන්ම අරසපුරකුලම් ගොවි සමිතියේ සභාපති ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.

121 පාබල බසේමු බලප්‍රදේශයට අයත් මොණරාගල දිස්ත්‍රික්කයේ වත්තේගම - කැබැලිත්ත රක්ෂිතයේ හෙක්ටයාර 600 ක භූමි ප්‍රමාණයක් නැවත වගා කිරීමේ ව්‍යාපෘතියක් පසුගිය දෙසැම්බර් මස 13 වන දින සිට ජනවාරි මස 03 වන දින දක්වා සිදුකරන ලදී. මේ සඳහා කොහොඹ, මී, කුඹුක්, දං, වීර, පලු, කෙලඹු, සියඹලා, මහෝගනී, බුරුත, ඇත්, දෙමට යන ගාක පැල 60,000 කට අධික ප්‍රමාණයක් රෝපණය කරන ලදී. තවද, මෙම වැඩසටහන සඳහා 121 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 18 ගැහේබ සහ 20 ශ්‍රීලංසිරෙ ඒකකයන්හි නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

653 වන පාබල බලසේනාවේ 13 වන සංවත්සරය

653 වන පාබල බලසේනාවේ 13 වන සංවත්සරය පසුගිය දෙසැම්බර් 07 වන දින එහි බලසේනාධිපති ත්‍රිගේඩියර් ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී යුඑස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් ලෙස සමරන ලදී.

එහිදී, මන්නාරම මාන්තොට විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දිවා දානය පිරිනැමීම ඇතුළුව ආගමික වතාවත් රැසක් සිදුවිය. තවද, බළසේනාධිපති වෙත කඳුවුරු මුරයක් පිරිනැමීම, බලසේනාධිපති විසින් සියලු හවපිරිස් ඇමතීම හා සියලු නිල භෝජන සංග්‍රහයද එහිදී විශේෂ තැනක් ගන්නා ලදී.

හාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්

64 වන පාබල සේනාංකයේ රාජකාරි නියුතු සිවිල් සෙවක මහතුන්ගේ සේවය අගයමින් ඔවුන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 25 වන දිනට යෙදී තිබූ නත්තල් දිනයට සමගාමීව සිදුකෙරිණ. 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ පුද්ගලික සම්බන්ධීකරණය මත ගයාන් විමලසූරිය යන අය ඊට අනුග්‍රාහක දායකත්ව දැක්වීය.

ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ වෙළඳසැලක් විවෘත කෙරේ

යුද්ධ හමුදා සෙබළුන්ගේ වෘත්තීය දැනුම වර්ධනය කිරීම පිණිස රණවිරු සම්පත් කේන්ද්‍රය මගින් පුරා වසරක කාලසීමාවක් පවත්වන ලද ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ පාඨමාලාව 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් කොනොනියකු විසින් සාර්ථකව හදාරන ලදී. ඔහුගේ වෘත්තීය දැනුම උපයෝගී කරගනිමින් එම ඒකකයට අයත් සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුඛසාධනය උදෙසා ඒකක අණදෙන නිලධාරී මේජර් අයිජීආර් ධම්මික ගේ මගපෙන්වීම මත ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ වෙළඳසැලක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරිණ. එම ජංගම දුරකථන වෙළඳසැල 144 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලිෆ්ටිනන් කේඑම්ඩී කොඩිතුවක්කු විසින් ඉකුත් ජනවාරි 11 වන දින විවෘත කරන ලදී.

නේවාසික දරුවන් වෙනුවෙන් පරිත්‍යාග රැසක්

මාන්කුලම් ප්‍රදේශයේ පිහිටා ඇති යහපත් එඩේරාගේ කන්‍යාරාමයේ නේවාසිකව රැඳී සිටින ළමුන් 33 දෙනකු සඳහා දිවා ආහාර වේලක් සහ ඔවුන් හට අවශ්‍ය පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 25 වන දින පැවැත්විණ. මෙම පරිත්‍යාග සඳහා මූල්‍ය දායකත්වය කැනඩාවේ පදිංචි බෙනඩිට් තෝමස් මහත්මිය විසින් ලබාදුන්නය. 571 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලිෆ්ටිනන් කේජීසීඑම්එච් ගම්ලත් ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීහු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

බළඇණි පුහුණු උපදේශක සංස්කරණ පාඨමාලාව 2022 - II වන අදියර

මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසල වෙතින් පවත්වන ලද බළඇණි පුහුණු උපදේශක සංස්කරණ පාඨමාලාව 2022-II වන අදියර පසුගිය දෙසැම්බර් මස 01 වන දින ආරම්භ කර දෙසැම්බර් මස 30 වන දින සාර්ථකව අවසන් කරන ලදී. එහිදී, පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස සෙ/380818 ලාකෝ කරුණාමුණි කේඑම්එන්කේඩබ්ලිව් ඇගයීමට පාත්‍ර විය.

මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්

යක්කල රණවිරු ඇපරල් ආයතනයෙහි රාජකාරියේ නියුතු නිලධාරි සහ සෙසුනිලයින් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් එම ආයතන පරිශ්‍රයේදී පසුගිය දෙසැම්බර් මස 28 වන දින පැවැත්විණ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරිණී හර්ෂණී ආරියරත්න මහත්මිය විසින් මෙම වැඩසටහන මෙහෙයවනු ලැබුවාය. මත්ද්‍රව්‍ය වර්ග, ඒවා මත්ද්‍රව්‍ය භාවිතය සඳහා සමාජය පොලඹවනු ලබන ආකාරය හා අධික ලෙස මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ පුද්ගලයින් පුනරුත්තාපනය කර නැවත සමාජගත කිරීම පිළිබඳ එහිදී පැහැදිලි කෙරිණ. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා පුනරුත්තාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශය - ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී කර්නල් ඩීජීඩබ්ලිව් ද සිල්වා, මත්ද්‍රව්‍ය නිවාරණ සහයක සුරේෂ් නිරෝෂණ මහතා සහ මත්ද්‍රව්‍ය නිවාරණ සහයිකා සදුනි උදයංගනී මහත්මියද සහභාගී වූහ.

අවැසි මොහොතක සරණක් වෙමින්

මුන්දම්පිටිය, මන්නාරම යන ලිපිනයේ පදිංචි පාදයක් අහිමි හිටපු එල්ටීටීඊ සාමාජිකයකු වන සේවියර් ඇන්තනී සිල්වෙස්ටර් යන අය වෙත ගාරදීම ඉකුත් දෙසැම්බර් 25 වන දින 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ඒඩීඑස් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. 541 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ 12(සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරි මේජර් ඒඑස් අමරතුංග ගේ අධීක්ෂණය යටතේ එම ඒකක භටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් මෙම නාන කාමරයක් සහිත වැසිකළි පද්ධතිය ඉදිකෙරිණ. තවද, එම නිවැසියන් හට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ විශ්වවිද්‍යාල සුදුසුකම් ලබා ඇති ඔහුගේ දියණියට මූල්‍යමය ආධාරයක්ද පිරිනැමීම එහිදී සිදුකෙරිණ.

යුද්ධ හමුදා රෝහල වෙත මුව ආවරණ තොගයක් පරිත්‍යාග කෙරේ

නුගේගොඩ ප්‍රදේශයේ පදිංචි රවින් උදය විජේසිංහ සහ සමන් විජේසිංහ යන පරිත්‍යාගශීලීන් විසින් මනා ප්‍රමිතියකින් යුත් මුව ආවරණ ලක්ෂ 2 ක තොගයක් නාරාහේන්පිට ප්‍රදේශයේ පිහිටි කොළඹ යුද්ධ හමුදා රෝහල වෙත ඉකුත් දිනයක පරිත්‍යාග කරන ලදී. මෙම පරිත්‍යාග වැඩසටහන කොළඹ යුද්ධ හමුදා රෝහලේ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ ප්‍රිගේඩියර් ජේපී විතානාච්චි ආර්ඩබ්ලිව්පී යූඑස්පී ප්‍රමුඛ එම අධ්‍යක්ෂ මණ්ඩලයේ හටපිරිස් විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.

අවැසි මොහොතේ උපකාරයක්

පසුගිය ජනවාරි මස 09 වන දින කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඇති වූ සුළු සේවක වැඩවර්ජනය හේතුවෙන් එහි දෛනික කාර්යයන් පවත්වාගෙන යාම සඳහා 01 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලකායේ හටපිරිස් විසින් සිය සහය ලබාදෙන ලදී. එහිදී 143 වන පාබල බලසේනාවේ ආඥාපතිවරයා සහ 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලකායේ අණදෙන නිලධාරී විසින් භාරදී ඇති හදිසි රාජකාරී කටයුතු සම්පව අධීක්ෂණය කරන ලදී.

ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ උපදෙස් සහ මඟපෙන්වීම මත එම මූලස්ථානයේ සේවයේ නියුතු හටපිරිස් 100 ක ගේ සහභාගීත්වයෙන් වව්නියා දිස්ත්‍රික් මහා රෝහලේ ලේ බැංකුව වෙත රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 24 වන දින පැවැත්විණ.

නව වසරේ දිවියට අත්වැලක් වෙමින්

2023 නව වසරේ රාජකාරී ආරම්භ කිරීම නිමිත්තෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සංවිධානය කළ තේ පැන් සංග්‍රහයක් පසුගිය ජනවාරි 02 වන දින සේවා වනිතා ඒකක ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ සේවා වනිතා ශාඛාවේ සභාපතිනී චිත්‍රාණී ගුණරත්න මහත්මිය හා යුද හමුදා සේවාවනිතා සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය ඇතුළු එම ඒකක නිලධාරීන්, නිලධාරිණියන් හා සෙසුනිලයින් මෙන්ම සිවිල් සේවක මහත්ම මහත්මීන් රැසක් ඊට සහභාගී වූහ.

තේ පැන් සංග්‍රහයෙන් අනතුරුව 8 වන ගජබා රෙජිමේන්තුවට අයත් මාණ්ඩලික සැරයන් සිල්වා කේඩබ්ලිව්එන්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී රණවීරුවාගේ අඩක් වැඩ නිමකර ඇති නිවසේ ඉහිරි වැඩ කොටස නිමකර ගැනීම සඳහා රු.450000.00 ක මුදලක් පරිත්‍යාග කෙරිණ. තවද, විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් දැනට වෛද්‍ය හේතුන් මත විශ්‍රාමිකව සිටින සැරයන් සමත් කුමාර ඒ යන රණවීරුවාගේ ප්‍රයෝජනය සඳහා විදුලි රෝද පුටුවක් පරිත්‍යාග කිරීමද යුද හමුදා සේවා වනිතා ඒකකයේ රාජකාරී නියුතු සිවිල් සේවක මහත්ම/මහත්මීන් 55 දෙනකු හට වියළි සලාක ඇතුළත් ත්‍යාග පාර්සල් ලබාදීමද එහිදී සිදුකෙරිණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් රෝද පුටු පරිත්‍යාගයක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් වසර 24 කට අධික කාලසීමාවක් තම උදාරතර සේවය ලබාදුන් සෙ/9කිසු02319 ලා/කෝ නිමල් රාජපක්ෂ ආර් යන රණවීරුවාගේ අසනීප තත්වයේ පසුවන දියණිය වෙනුවෙන් රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී. සේවා වනිතා ඒකකයේ සභාපතිනී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 11 වන දින සේවා වනිතා ඒකක කාර්යාලයේදී මෙම මාහැඟි කටයුත්ත සිදුකෙරිණ.

තවද, එම කොනොනිගේ වයස අවුරුදු 04 ක් වයසැති දියණිය උපතේදීම මොළයේ ඇතිවූ රෝගී තත්වයක් හේතුවෙන් දීර්ඝකාලීනව ප්‍රතිකාර ලබමින් සිටින අතර, ඇවිදීමට නොහැකි තත්වයෙන් පසුවේ. ඒ අනුව ඇයගේ අනෙකුත් ප්‍රතිකාර කටයුතු සඳහා මාසිකව විශාල මුදලක් වැය දැරීමට සිදුවීම හේතුවෙන් තත් කොනොනිගේ මාසික වැටුපෙන් ඇයහට රෝද පුටුවක් මිලදී ගැනීමට නොහැකි බැවින්, ඔහු විසින් එම ඒකකයෙන් කරන ලද ඉල්ලීමකට අනුව රෝද පුටුවක් පරිත්‍යාග කිරීම සිදුකරන ලදී. එමෙන්ම තත් දියණියගේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් වැය දැරීම සඳහා වසර 05 ක කාලසීමාවක් සඳහා මාසිකව රුපියල් 20000.00 ක බැගින් වෛද්‍යාධාර මුදලක් ලබාදීමට සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් උපදෙස් ලබාදෙන ලදී.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයට මූල්‍ය පරිත්‍යාගයක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් වාර්ෂිකව සුබසාධන ව්‍යාපෘතීන් රාශියක් සංවිධානය කර පවත්වනු ලබයි.

එම රණවිරු සුභසාධන ව්‍යාපෘතීන් සඳහා මූල්‍ය දායකත්වය ලබාගැනීමේ අරමුණ ඇතිව, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මඟපෙන්වීම යටතේ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව වෙතින් වර්ණවත් සංගීතමය වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 06 වන *"HAVELOCK SPORT CLUB"* ක්‍රීඩාංගනයේදී පැවැත්විණ.

ඒ සඳහා දිවයිනේ ජනප්‍රිය වාදක කණ්ඩායම් වන *"2 FORTY 2"* සහ *"DADDY"* සංගීත කණ්ඩායම් මෙන්ම දිවයිනේ ජනප්‍රිය ගායක ගායිකාවන් කිහිප දෙනකුගේ සහභාගීත්වයෙන් *"BLUE BELL NIGHT - 2022"* පවත්වන ලදී.

එහිදී, එම ප්‍රසංගයෙන් ලද ලාභාංශ මුදලින් රු:1,000,000.00 ක මුදලක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සිදු කරනු ලබන සුභසාධන කටයුතු සඳහා යොදා ගැනීම පිණිස විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී නාන්දනී සමරකෝන් මහත්මිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය වෙත ඉකුත් ජනවාරි 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පිරිනමන ලදී.

දිවියට සවියක් ඉගෙනුමට දිරියක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් රුපියල් මිලියනයකට ආසන්න වටිනාකමකින් යුත් වියළි සලාක සහ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජනවාරි 25 වන දින හෙරලියාවල කඳවුරේදී පැවැත්විණ.

එහිදී, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව යටතේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් 38 දෙනකු සඳහා රුපියල් 7,500.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක මළුව, 2023 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමට නියමිත දූ දරුවන් සඳහා දරුවන් සඳහා රුපියල් 3,000.00 ක් වටිනා පාසල් උපකරණ කට්ටල 100 ක් බෙදාදීමට කටයුතු කෙරිණ. තවද, 2023 වර්ෂයේ අධ්‍යන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත දූ දරුවන් 132 දෙනකු සඳහා රුපියල් 5,000.00 ක් වටිනා පාසල් උපකරණ කට්ටල 132 ක ප්‍රමාණයක් බෙදාදීමද සිදුවිය.

රට දිනවා දිවි දිනුමට අනතීත

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ සේවා වනිතා සභාපතිනී ශාන්ති අතේසේකර මහත්මිය හා එම සේවා වනිතා ශාඛා සාමාජිකාවන්ගේ සහයෝගය ඇතිව අඩුආදායම්ලාභී පවුල් සඳහා එළුවන් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජනවාරි 23 වන දින පනාගොඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු බලකා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ප්‍රදේශයේ ආර්ථික දුෂ්කරතා ඇති ශ්‍රීලයුක්තපබ සහ සිවිල් පවුල්වල සෙසුනිලයින් ගේ පවුල් 17 ක් වෙත එහිදී එළුවන් බෙදාදෙන ලදී. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට අනෙකුත් රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනියන්ද ශ්‍රීලයුක්තපබ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක් එක්වූහ.

කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව එම රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතු ආර්ථික අපහසුතා ඇති සිවිල් සේවක මහතුන් 102 කු හට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 22 වන දින කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මෙන්ම කාලතුවක්කු හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනී චාමා වනසිංහ මහත්මිය සහභාගී වූහ.

සුභ මොහොතින් තනතුරු ලැබ

ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 16 වන සභාපතිනිය ලෙස ශම්මි ජයවර්ධන මහත්මිය පසුගිය ජනවාරි මස 12 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුභ මොහොතින් වැඩ භාරගනු ලැබුවාය. එම අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

එළැබි නව වසරට සෙත් පතමින්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මඟින් පසුගිය ජනවාරි 07 වන දින නව වසරට සෙත් පතමින් හා අපොස උ/පෙළ විභාගයට පෙනී සිටින දූදරුවන් හට සෙත්පතා ආශීර්වාදාත්මක බෝධිපූජා පිංකමක් කැළණි රජමහා විහාරයේදී සංවිධානය කරන ලදී. මෙම පුණ්‍ය කටයුත්ත ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී හා එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශෂිකා හේරත් මහත්මියගේ සහභාගීත්වයෙන් පැවැත්වූහ

සිංහ රෙජිමේන්තු සේවා වනිතාවෙන් මාහැඟි පරිත්‍යාගයක්

සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ රාජකාරි කරනු ලබන සියලුම සිවිල් සෙවක මහතුන් හට වියළි සලාක ඇතුළත් ත්‍යාග පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් මස 30 වන දින පැවැත්විණ. මෙම වැඩසටහන සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, එම සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ඔම්ලා ජයවර්ධන, සිංහ රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ නිලධාරීන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් සිදුකෙරිණ. මෙහිදී, සිවිල් සෙවක මහතුන් 57 දෙනකු සඳහා රු.6500.00 ක් වටිනා වියළි සලාක ඇතුළත් පාර්සලය බැගින් ප්‍රදානය කරන ලද අතර, එහි සම්පූර්ණ වටිනාකම රු.370,500.00 ක් විය.

විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් කැරොල් ගී උසංගයක්

නත්තල් දිනයට සමගාමීව, විජයබාහු පාබල රෙජිමේන්තුවේ කිතුනු සාමාජිකත්වය විසින් සංවිධානය කරන ලද නත්තල් කැරොල් සන්ධ්‍යාව අධ්‍යක්ෂ ජෙනරාල් මාණ්ඩලික මෙන්ම විජයබාහු පාබල රෙජිමේන්තුවේ කර්නල් සේනාධිධායක මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්පී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා බෝයගනේ විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේ "ද සැලියුට්" ශාලාවේදී පැවැත්විණ. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනී කුමුදු මානගේ, එහි ක්‍රිස්තියානි සංගමයේ සාමාජිකයින්, ඔවුන්ගේ දූ දරුවන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවට නව සභාපතිනියක්

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 13 වන සභාපතිනිය ලෙස හිමාලි පුස්සැල්ල මහත්මිය එම රෙජිමේන්තු නිලධාරි නිවස්නයේදී පසුගියදා සුබ මොහොතින් වැඩ භාරගනු ලැබුවාය. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ ලේකම් ස්වර්ණලතා ඒකනායක මහත්මිය ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ අහිමංසල 2 සංචාරය

සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මිය කඹුරුපිටියේ පිහිටි අහිමංසල 2 සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණශූරයට පත් රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා පසුගියදා සංචාරයක නිරත වූවාය. එහිදී, එම රණවිරුවන් හට සෞඛ්‍ය සම්පන්න කෙටි ආහාර වේලක් ලබාදීමටද ක්‍රියාකෙරිණි. එම අවස්ථාවට සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ මෙන්ම නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද සහභාගී වූහ.

සේවා බලකා සේවා වනිතාවෙන් මාහැඟි පරිත්‍යාගයක්

3 වන යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරි මේජර් කේසීකේ ජයසිංහ පීඑස්සී එල්එස්සී ගේ මෙහෙයවීමෙන් පසුගියදා අහිමංසල 1 හි සංචාරයක් සංවිධානය කෙරිණි. සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේඩී වනිගසේකර යූඑස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු මෙම සංචාරයේදී එහි නේවාසික රණවිරුවන් වෙත සනීපාරක්ෂක ද්‍රව්‍ය, කුෂන් පුටු කවර ඇතුළු පරිත්‍යාගයක් රැසක්ද පිරිනමනු ලැබූහ.

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 73 වන සංවත්සරයට සමගාමීව එම රෙජිමේන්තුවට අයත් ක්‍රියාත්මක රාජකාරීන්හි යෙදී සිටියදී මියගිය රණවිරුවන් 52 කගේ පවුල්වල ඥාතීන් වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ පාර්සල් පිරිනැමීමේ වැඩසටහනක් පැවැත්විණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව සංවිධානය කෙරුණු මෙම වැඩසටහන එම සේවා වනිතා ශාඛාවේ ලේකම් සමන්හි ගුණසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් දියත්කෙරිණ.

පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් ඉගෙනුමට අත්වැලක්

ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව මඟින් පාසල් උපකරණ ප්‍රදානය කිරීමේ වැඩසටහනක් එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පසුගියදා පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) හි ආඥාපති සහ පොලිස් හේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ඉනෝකා ඉලංගකෝන් මහත්මියද සහභාගී වූහ.

කාන්තා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ශ්‍යාමලී විජේසේකර මහත්මියගේ මඟපෙන්වීම යටතේ 7 වන බළඇණියේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජීආර්ඒඅයිඑම්කේ ගමිලත් ආර්එස්පී ගුණස්සී පීඑස්සී ඇතුළු සියලු නිලධාරීන් හා සෙසුනිලයින් විසින් ආර්ථික අපහසුතා සහිත දුවා දරුවන් හට සහනයක් සැලසීමේ අරමුණින් කන්කසන්තුරේ ඌරණි කණිෂ්ඨ විද්‍යාලයේ දරුවන්ට අවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 10 වන දින එම පාසලේදී පැවැත්විණ. තවද, මීට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ 7 වන බළඇණියේ සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ දරුවන් සඳහා වියළි සලාක ඇසුරුම් සහ පාසල් ද්‍රව්‍ය බෙදාදීමක්ද 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේදී පැවැත්විණ.

ඉල්ලන කෑම...

ඔන්න මේ ලෝකේ පහලවෙලා මහා බ්‍රහ්මයා මිනිසා ඇතුළු සියලු සත්වයන්ටම ආයුෂ ලබාදෙන්න කැඳෙව්වා. පනුවට, මෙරුවට, තරියට, හාවට, උකුනට, මදුරුවට මේ ආදී සැම සත්වයකුටම ආයුෂ දුන්නා. නමුත් මේ හැම දෙනාගෙම ආයුෂ කියන්න ගියොත් බොහොම කාලයක් යන නිසා කරා වස්තුවට අදාළ අයගේ ආයුෂ විතරක් කියන්නම්, සතුන්ට මෙහෙම දීල මිනිහට අවුරුදු 30 කුයි හරකට 50 කුයි, බල්ලට අවුරුදු 30 කුයි බකමූණට අවුරුදු 20 කුයි දීල ඉවර කළා. අපි වෙනුවෙන් හිය නියෝජිතයට මේ අවුරුදු 30 මදි වගේ ඇඹරි ඇඹරී හිටියා. සැහෙන වැඩක් කරලා හිටිය නිසා බ්‍රහ්මයට පිකක් තදවෙලා හිටියෙ. "ඇයි යෝධයො මෙතන ඇඹරි ඇඹරී ඉන්නේ. යන්නෙ නැද්ද මනුෂ්‍ය ලෝකෙට" කියලා ඇහුවම මිනිහා කිව්වා අවුරුදු 30 මදි කියලා. නමුත්, බ්‍රහ්මයා කිව්වා ආයුෂ චක්‍ර ලේඛණයට අනුව තමයි දුන්නේ, දැන් කරන්න දෙයක් නැහැ කියලා. මේ අතර ගොනා හිත හිත ඉදලා තියෙන්නේ අවුරුදු 50 ක් එක එකාට බර ඇදලා මැරෙනවට වැඩිය පික කලක් ජොලියෙ ඉදලා මැරෙන එක හොඳයි කියලා. ඒක හිත්දා ගොනා එක පයින්ම කැමති වුනා අවුරුදු 20 ක කාලයක් ආපසු දෙන්න. ගොනා උනාට මිනිහට වැඩිය මොලකාරයා. වැඩකරන්න වුනාම වැඩ කරන්න කන්න, බොන්න, නාන්න වෙලාවක් නැහැ. තෙමෙන වෙලාවක වුනත් කරන්නේ ඕග් වෙනකම් එළියෙ. ගාල් වෙන්නෙ අඳුර වැටෙනකොට. තවත් කියන්නත් බැරිනම් අප්සට් ගොඩක් නිසා ඒ අවුරුදු 20 තැගි කිරීම ඌට හරි භාග්‍යයක්.

බල්ලත් අවුරුදු 30 ක් ලැබීම ගැන ගුල් අප්සට් පිට හිටියෙ. මේක ඇහිලා බල්ලත් අවුරුදු 20 ක් වුනත් මිනිහට දෙන්න කැමති වුණා. මොකද ඌ දන්නවා අවුරුදු 30 ක් තැන තැන චාටර් වෙලා, බඩට හරි කැමක් නැතුව කොල්ලන්ගෙන් ගල්පාරවල් කකා, රෑ තිස්සේ ගෙවල් දොරවල් රකින්නයි, කිරුවෙ නැත්නම් අයිතිකාරයගෙන් බැනුම් අහන්නයි, දොරපොලු පාරවල් කන්නයි තියෙන වදේ. ඒක හින්දා අවුරුදු 10 ක් ජොලියෙ ඉදලා මැරුනම ඇති කියලා තමයි අවුරුදු 20 ක් මිනිහිට දුන්නෙ. බකමූණත් මහ කමකට නැති චරිතයක් නිසා අවුරුදු 20 ක් මේක ගෙවන්නෙ කොහොමද කියලා ඉන්නකොට තමයි මේ චාන්ස් එක ආවෙ. රෑට නිදි නැතුව කෑම හොයන්නයි දවල්ට මුල්ලකට වෙලා ඉන්නයි, හරි වැරදි දෙකටම හුම්... ගාන්නයි කැමති නැති නිසා අවුරුදු 10 ක්ම මිනිහට තැගි දුන්නා.

පස්සෙ බ්‍රහ්මයා මිනිහට අවුරුදු 80 කුයි, හරකට අවුරුදු 30 කුයි, බල්ලට අවුරුදු 10 කුයි, බකමූණට අවුරුදු 10 කුයි දෙන්න චක්‍රලේඛණය වෙනස් කරලා කථිටිය ආපහු මේ ලෝකෙට එව්වා. ඉතින් මිනිහට ජීවිතේ පටන් අරන් අවුරුදු 30 ක් වෙනකම්ම කුරුල්ලෙක් මිටෙන් ඇරිය වගේ සොම්මය හිටියා. ලව්කලා, චිත්‍රපටි බැලුවා, ගමන්කිමන් ගියා, හොඳට ඇන්දා, කෑවා, බීවා දැන් ගෙවන්න තියෙන්නෙ අර හරකා දුන්න අවුරුදු 20 යි. අනේ පව්... දැන් නියමෙට බර අදිනවා. ගැනි කියන කියන වැඩ කරනවා. ඒ මදිවට කෑම බීම ගේන්න ඕනෙ. ළමයි ඉල්ලන දේ ගේන්න ඕනෙ. හාල්පිටි සීනි කරගහගෙන එන්න ඕනෙ. තව ගෙවල් හදන සිමෙන්ති, ගල්, වැලි, පස් අදින්න ඕනේ. හරියට කරත්තයට බැන්දට හපන්. බ්‍රහ්මයට වුනත් හරි දුකයි. නමුත් එයා බලෙන්ම ඉල්ල ගත්ත නිසා දැන් වූ ලේව්. අර දුන්න අවුරුදු 30 ජොලියෙ ඉදලා මැරෙන්නෙ නැතුව මෝඩයා කරගත්තු වැඩේට. දකින ගොනුන්ටත් හිනා. යාන්තම් නොමැරී ඉඳිලා ඒ අවුරුදු 20 ගෙවෙනකොටම ලැබුවෙ බල්ලගෙ 20 යි. ඒක ඊට හපන් බව තේරුනේ පස්සෙ. තනිකර වොචර් වැඩක් (මුර වැඩක්) වගෙ. ගැනි එහෙ මෙහෙ යනවද බලන්න ඕනෙ. ගෙදර කෙල්ලො ටික කොල්ලන්ගෙන් පරිස්සම් කරගන්න ඕනෙ. කොල්ල පිස්සු නටයිද බල්න ඕනෙ. තනිකරම බලු වරියාව. අනික හදාගත්ත ගේ දොර බඩුමුට්ටු හොරුන් ගෙනයයිද කියලා රෑ දෙගොඩ හරියෙ නැගිටලා බලන්න ඕනෙ. වත්ත පිටියෙ බුලත්, පුවක්, කෙසෙල්, රඹුටන් ආදිය රැකගන්න නිදි නැතුව සොකඩ අදින්න ඕනෙ. මාර සිකුරුටියක් දෙන්න වුනේ. බල්ලගෙ වැඩේ තනිකරම කරන්නත් වුනේ ඔන්න ඒ අවුරුදු 20 දී.

බොහොම අමාරුවෙන් ළමයි දිගනල දීලා එකලාසයක් වෙනකොට දැන් අවුරුදු 70 යි වයස. ඒ වුනාට තව මදියි කියලා බකමූණගෙන් ගත්ත අවුරුදු 10 අදින්න එපැයි. ඒ වෙනකොට දනිස්වල ඔකටි ඔෝපර් ගිහිල්ලා. හරියට ඇවිදින්නත් බැහැ. කනේ මයික් එක අප්සෙට් වෙලා කතාවක් බහක් හරියට ඇදලා දෙන්නේ නැහැ. ඇතුළෙ හරියට බොයිල් වෙනවා, තෙල් පිච්දෙනවා, බැටරි චාර්ජ් නැහැ. එක පාරට නවතින්න බැහැ. බ්‍රේක් ලයිනර් ගෙව්ලා. මුළු බොඩියම අප්සෙට්. ඔහේ මුල්ලකට වෙලා තමයි ඉන්නේ. ඒක වුනේ අර බකමූණගෙන් ගත්ත අවුරුදු 10 නිසා. කවුරුහරි කෑවද කියලා ඇහුවොත් කෑවෙ නැතත් ඇහෙනවා අඩු නිසා හුම්... කියනවා. නෑවද කියල ඇහුවම නෑවෙ නැතත් හුම්... කියනවා. මෙතනින් කවුරුහරි ගියාද කියල ඇහුවාමත්, ඇහුවත් පේන්නෙ නැති වුනත් හුම්... කියනවා. හරි දේටයි වැරදි දේටයි හැමදේටම හුම් කියල උත්තර දෙන කාලෙ තමයි ඔය බකමූනගෙ අවුරුදු 10.

තිහ අසූව කරගත්ත එක ගැන දැන් හිතල පලක් නැහැ. වුන දේ වුනාවේ. මිනිහට මේ සේරම වුනේ තණ්හාව නිසා. කොහොම වුනත් හැම මිනිහෙක්ම අවුරුදු අසූවක් හිටියොත් මේ චරිත හතරනම් රඟපාන්න ඕනෙ. ඕක තමයි ජීවිතේ කියන්නේ.

සටහන :-
මා/සාර්යන් බණ්ඩාර බිඩිලිවිත්මිත්

දෙස රැකි වෙහෙරමහා කුලයේ දිරිය දියණිවරු

උතුරු නැගෙනහිර ක්‍රියාන්විත නිමෙහි වෙසෙන දහස් ගණන් සෙබළ මුළු අතරේ කාන්තා නියෝජනයද සැලකිය යුතු තරමය. පිරිමින් හා කරටකර හිඳිමින් වෙනත් කිසිදු වෘත්තීයක කාන්තාවකට නොදෙවෙනි වූ අනුපමේය මෙහෙවරක නිරතව හිඳින ඔවුන්ද සැබැවින්ම දේශයේ මුර දේවතාවියන්ම වන්නේය. එහෙත් අවාසනාවකට සෙබළුන් ලැබූ ඇගයීම්වලට සාපේක්ෂව සෙබළින්යන්ගේ මෙහෙවරට ඇගයුමක් ලැබුණු බවක් නොපෙනේ.

මෙරට පැවති දශක තුනක යුද ගැටුම හේතුවෙන් 26,000 කට වැසි රණවිරුවන් පිරිසක් මියගොස් තිබේ. එහෙත් ඔවුන් අතර රණවිරුවරියන් 25 දෙනකුද සිටින බැව් දන්නේ කීයෙන් කී දෙනාද? රණබිම තුළ රණවිරුවන් කළ කී සුරුවිරුකම් පිළිබඳ අපි කොතෙකුත් කතා කොට ඇත්තෙමු. ඒ අතරින් ඇතැමුන් වෙනුවෙන් වෙන වෙනම උපහාර උත්සව පවත්වා පිළිරු පවා ඉදිකොට ඇත. එසේම, රණවිරු සැමරුම් උත්සවවලදී මෙන්ම වෙනත් සෑම උත්සව කටයුත්තකදීම පාහේ රට වෙනුවෙන් ජීවිත පූජාකළවුන් වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් පැවැත්වීමද අනිවාර්යය චාරිත්‍රයක්ව පවතී. එනමුත් එසේ සිහිකරන රණවිරු ගොත්තට රණවිරුවරියන්ද ඇතුළත්ව ඇති බැව් දන්නේ කීයෙන් කීදෙනාද?

අද වනවිට යුද හමුදාව තුළ සැලකිය යුතු කාන්තා නියෝජනයක් පවතින අතර, ඔවුනතින් සිදුවන මෙහෙවර වත්මන් යුද හමුදාවට සුවිශාල ශක්තියක් එක්තැන්කොට ඇත්තේය. නිලධාරිනියන් සෙබළියන් ලෙස ඔවුහු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් සිය සේවාව ලබාදෙන අතර, එහිදී ක්ෂේත්‍ර, පරිගණක, නීති, වෛද්‍ය, විගණන, කෘෂි, ක්‍රීඩා, ඇගලුම්, රියදුරු, සූපවේදී, රූපලාවන්‍ය, කලා ආදී බොහෝ ක්ෂේත්‍ර ඔස්සේ ඔවුනගෙන් ඉටුවනුයේ පුරෝගාමී මෙහෙයකි.

ජනිතව වෙහෙර මහ දෙව් කුසයට ආව
එඩිතර දියණියනි දැය රැකුමට ආව
පෙළහර පෑවමුත් යුද බිමකට යාව
කව් පදවැල් හිඟයි නුඹ වෙනුවෙන් ලිව

යුද්ධය පැවති සමයේ 90% ක්ම කාන්තා දායකත්වය හිමිවූයේ ක්‍රියාන්විත අවශ්‍යතා වෙනුවෙනි. එහිදී විටෙක බංකරයක අවිදරා සිටින ඇය තවත් විටෙක මාර්ග බාධකයක පරීක්ෂා කිරීම්වලය. තවත් විටෙක ක්ෂේත්‍ර වෛද්‍ය මධ්‍යස්ථානයක තුවාලලත් සහෝදර සගයින්ට ප්‍රතිකාර ලබාදෙමිනි. එසේම, ක්‍රියාන්විත පරිසරයේම

මව්බිම වෙනුවෙන් දිවිදුන් ප්‍රථම විරවරිය.

සෙ/2ආර්00077
ලා/කෝ රූපවතී එච්එම්

(1996.08.09 දින කීරමලේ හිදී ත්‍රස්තවාදීන් විසින් වල්ල කළ වෙඩි ප්‍රහාරයකට ලක්වීමෙන්)

හිඳිමින් අනෙකුත් හටපිරිස්වල වැටුප්, සුබසාධක ආදී පාලන අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ඔවුන් ලබාදුන් මැදිහත්වීමද අභිමතය. කිම්බෝම්බවලට ගොදුරුව, වෙඩි ප්‍රහාරවලට ලක්වීමෙන් හෝ මරාගෙන මැරෙන ප්‍රහාරවලින් එලෙස ඔවුන් ත්‍රස්තවාදීන්ගේ ඉලක්ක බවට පත්ව අවාසනාවන්ත ලෙස දිවියෙන් සමුගත්තේ දිවා රෑ නොතකා එවන් කටයුතුවල නිරත වෙද්දීය.

යුද්ධය තිහිසුණුව පැවති කාලවකවානුවේදී සිය දරුවන් ස්වාමිපුරුෂයින් බාරේ නිවෙස්වල තබා තිරිත්දෑවරුන් එලෙස ගිනිඅවි අතදරා ක්‍රියාන්විත පරිසරයේ දිවි ගෙවීම දෛවයේ සරදමක් වැනිය. එදවස විරු සෙබළියන් උතුර නැගෙනහිර මායිම්වල ගිනිඅවි අතදරා නිදිවර්ජිතව රෑය පහත් කරද්දී එවැනිම වයසේ පසුවූ කොතෙක්නම් කාන්තාවන් තම දූ පුතුන් තුරුළු කරගනිමින් ළබැඳියන්ගේ උණුසුමට ගුලිව සුවසේ පසුවන්නට ඇත්ද?

යුද්ධය අවසන්ව මේ ගෙවෙනුයේ 14 වන වසරය. එම කාලසීමාව තුළ යුද්ධයේ සියලු නටඹුන් වියැකී ගොස් ඇතිවා සේම ඊට සෘජුව හා වක්‍රව දායක වූ බොහෝ පිරිසක් හමුදා සේවයෙන්ද ඉවත්ව ගොස් ඇත. නමුත්, කාලය කොතෙක් ඉක්ම ගියද ක්‍රියාන්විත වටපිටාව පහව ගියද යුද්ධය හමුවේ එදවස විරු සෙබළියන්ගේ මෙහෙවර කිසිවකුට අමතක කළ හැකිද? නා කපන වර්ෂාවේදීද, තිත්ත කළුවර රෑයවල්හිදීද, හිරිගඩු පිපෙන සීතලේද, පිනි වැටෙන හිම්දිරියේද ඔවුහු සිය සුකොමල දෑත්වලට ගිනි අවි රැගෙන ශාපලත් යුද්ධය හමුවේ දුක් විත්දාහ. ඉහත සියලු දුක්ඛ දොමනස්ස මැද වුව තම රට වෙනුවෙන් එලෙස සිදුකළ කැපවීම හරහා ගම්‍යවනුයේ සැබවින්ම ඔවුන් විහාර මහා දේවියගේ පරපුරේ දියණියන් බවය.

වාර්ෂිකව පැවැත්වෙන ජාගත් කාන්තා දිනය නිමිත්තෙන් මෙරට කොතරම් සැමරුම්

සෙ/2ආර්58860
කෝපුල් ද සිල්වා ඊවන්

1997.01.02 දින කිරුඇණ්ඩෙලි හිදී ත්‍රස්තවාදීන් විසින් අටවන ලද ක්ලේමෝ බෝම්බයකට හසුවීමෙන් (පොලිස් හේවා බලකායේ දිවිදුන් ප්‍රථම සෙබළිය)

සෙ/2ආර්00153
ලා/කෝ කුමුදුනී හේවිවන්පි

1997.01.02 දින කිරුඇණ්ඩෙලි හිදී ත්‍රස්තවාදීන් විසින් අටවන ලද ක්ලේමෝ බෝම්බයකට හසුවීමෙන්

සෙ/ආර්00024
ලා/කෝ ස්වර්ණලතා ආර්සි

1997.01.02 දින කිරුඇණ්ඩෙලි හිදී ත්‍රස්තවාදීන් විසින් අටවන ලද ක්ලේමෝ බෝම්බයකට හසුවීමෙන්

සෙ/2ආර්00260
ලා/කෝ අජන්තා ආර්එම්

1997.03.06 දින වම්නතිව හිදී රාජකාරි කරමින් සිටියදී මෝටාර් ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්00936
ලා/කෝ ශ්‍රියානි දිපිකා වස්

1997.03.06 දින වම්නතිව හිදී රාජකාරි කරමින් සිටියදී මෝටාර් ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්01487
ලා/කෝ අබේසිංහ කේපී

1997.12.02 දින මුරුක්කන් හිදී ශ්‍රියාන්විත රාජකාරීන් සඳහා යමින් සිටියදී ත්‍රස්තවාදීන් වල්ල කළ ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්01367
ලා/කෝ කවින්ලතාරාවිච් එම්විත්

1997.12.02 දින මුරුක්කන් හිදී ශ්‍රියාන්විත රාජකාරීන් සඳහා යමින් සිටියදී ත්‍රස්තවාදීන් වල්ල කළ ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්01798
ලා/කෝ තයනා තුෂාරි ගුඩ්

1998.02.06 දින කොළඹ මැලේසියේ මාර්ග බාධකයේදී මරාගෙන මැරෙන බෝම්බයකට හසුවීමෙන්

සෙ/2ආර්01799
ලා/කෝ ධර්මවර්ධන එම්බිම්වරුසේ

1998.02.06 දින කොළඹ මැලේසියේ මාර්ග බාධකයේදී මරාගෙන මැරෙන බෝම්බයකට හසුවීමෙන්

සෙ/2ආර්01329
ලා/කෝ රත්නායක ආර්එම්ටීසේ

1998.03.13 දින පුත්තූර් හිදී රාජකාරි කරමින් සිටියදී ත්‍රස්තවාදීන් වල්ලකළ ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්01504
ලා/කෝ එදිරිසූන්දර සම්බන්ධසේකේ

1998.03.13 දින පුත්තූර් හිදී ට්‍රැක්ටර් රථයකින් රාජකාරි සඳහා ගමන් කරමින් සිටියදී මෝටාර් ප්‍රහාරයකට ලක්වීමෙන්

සෙ/2ආර්01471
ලා/කෝ රත්නායක ආර්එම්පිරිස්

1998.03.20 දින කොඩිකාමම් හිදී ත්‍රස්තවාදීන් විසින් අටවන ලද ක්ලේමෝ බෝම්බයකට හසුවීමෙන්

**“නා කපන වර්ෂාවේදීද,
තිත්ත කළුවර
රැයවල්හිදීද, හිරිගඬු
පිපෙන සීතලේද,
පිනි වැටෙන හිමිදිරියේද
ඔවුහු සිය සුකොමල
දෑත්වලට ගිනි අවි රැගෙන
ශාපලත් යුද්ධය හමුවේ
දුක් වින්දාහ. ඉහත සියලු
දුක්ඛ දොමනස්ස මැද වුව
ඔවුන් තම රට වෙනුවෙන්
එලෙස සිදුකළ කැපවීම
හරහා ගම්‍යවනුයේ
සැබවින්ම ඔවුන් විහාර
මහා දේවියගේ පරපුරේ
දියණියන් බවය.”**

උත්සව පැවැත්වුවද සාකච්ඡා, දේශන, වැඩමුළු, පෙළපාලි ආදිය රටපුරා සංවිධානය කෙරුණද ඒවායේ රණවිරු කාන්තාව පිළිබඳ එතරම් කතා කෙරෙන බවක් නොපෙනේ. බොහෝ විට ඒවායේ කතා කෙරෙණුයේ ගෘහණිය පිළිබඳවය. කාර්යාලයේ හෝ කම්හලේ වැඩ කරන කාන්තාව පිළිබඳවය. නොඑසේනම් ගම්බද ගෙවිළිය පිළිබඳවය. යුද්ධයේ නිමාවත් සමඟම රණවිරු කාන්තාවන්ගේ මෙහෙවරද අවසන්ව ඇති බවක් යමෙක් සිතනවා වන්නට පුළුවන. නමුත් රණවිරු භූමිකාව යනු එක් කාලයකට, අවස්ථාවකට පමණක් සීමාවන්නක් නොවන අතර එය රජේ හා ජනතාවගේ ආරක්ෂාව යහපත පිණිස අඛණ්ඩව පවතින්නකි. වර්තමානයේ ආටෝපයෙන් පිරී නුදු විලාසිතා අතර, වල්මත් වූ ඇතැම් යෞවනියන් හැල්මේ දුවන නාගරික සමාජයේ කෙළිබඩු බවට පත්ව ඇත. අනේකවිධ හරසුන් ගහි සිරිත් වෙලාගනිමින් හැඳිච්චකම් පස්ස දෙරින් පලවා හැර කය මෙරට තබා මනසින් සුරංගනා ලෝකවල ජීවත්වන ඔවුන් අතර විරු සෙබළිය යනු ආදර්ශමත් කාන්තා ප්‍රතිමූර්තියකි. යුද සෙබළිය යනු පැය 08 ක සේවා මුර, සතිඅන්ත නිවාඩු නොතකා කිසිවිට සමතැන් නොඉල්ලූ තම අයිතිවාසිකම් වෙනුවෙන් අරගල නොකළ අයෙකි. රුදුරු ගිනිඅවි ගැටෙන කිමක වැලි දූවිලි අතර, හිඳ මි විසිහතර පැයේ සේවයට කැපවූයේ තම පුද්ගලික ජීවිතයේ බොහෝ දේ කැපකරමිනි. නුසුරුදු කිමක ගෙවූ සුපුරුදු දිවිය තුළ වුවද ඇය ඉසිලූ දුක්ගිණි කන්දරාව අපමණය. එදවස ඔවුන් තම දෙමාපිය සහෝදර සහෝදරියන්ගෙන් පමණක් නොව තම දුවා දරුවන්, ස්වාමිපුරුෂයන්ගෙන් පවා වෙන්ව දුෂ්කර පරිසරයන්හි දින සති මාස ගෙවන ලද්දේ මරණ වරෙන්තුවක්ද අත තබාගෙනය.

සටහන
ලුතිනන් කර්නල් සුවිත් වීමින්ද එදිරිසිංහ

සෙ/2ආර්00191
ලා/කෝ ආරියවතී වම්

1999.01.25 දින කෝපායි හිඳ සිටල් වැසියන් එසින් බිම සතුරාගේ නිතු වගාවිමක ත්‍රස්තවාදීන් එසින් අරවන ලද බෝම්බයකට හසුවීමෙන්

සෙ/4ආර්00553
ලා/කෝ එදේවර්ධන පිවඩ්

1999.10.25 දින උයිලතුරුම් හිඳ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/5ආර්00210
ලා/කෝ මල්කාන්ති පීආර්වස්

2000.05.24 දින වාකවිලාන් හිඳ කාලතුවක්කු ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/5ආර්00292
ලා/කෝ දමයන්ති පිවඩ්බලිම

2000.05.24 දින වාකවිලාන් හිඳ කාලතුවක්කු ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/5ආර්00453
සැරයන් පුෂ්පමාලා පීබීවස්

2000.05.24 දින වාකවිලාන් හිඳ කාලතුවක්කු ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/59427
ලා/කෝ ගුණතිලක ඩීවස්වස්පී

2006.04.28 දින කොළඹ යුද්ධ හමුදාධිපතිවරයාට වැල්ල වූ මරාගෙන මැරෙන බෝම්බයට හසුවීමෙන්

සෙ/4ආර්00147
කෝප්‍රල් පද්ම කුමාරි අයිරම්මි

2007.04.02 දින අම්පාර කොණ්ඩුවදුවාන කඳවුර ඉදිරිපිට මාර්ග බාධකයේදී බසයක් තුළ බෝම්බයක් පුපුරා යාමෙන්

සෙ/4ආර්01418
ලා/කෝ දිල්රක්ෂි වම්කේප්

2008.09.09 දින වව්නියාව 211 බසේමු කඳවුර තුළට ත්‍රස්තවාදීන් ඇතුල්වී කළ ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/4ආර්01240
ලා/කෝ පියදාස පීවල්

2008.09.09 දින වව්නියාව 211 බසේමු කඳවුර තුළට ත්‍රස්තවාදීන් ඇතුල්වී කළ ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/3ආර්01626
ලා/කෝ තිලංකා කුමාරි ආරච්චි

2009.02.09 දින වික්වමඩු හිඳ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/5ආර්01440
ලා/කෝ සෙල්වරාණි වම්වම්වල්

2009.02.09 දින වික්වමඩු හිඳ ත්‍රස්තවාදීන්ගේ ස්ලේමේ ප්‍රහාරයකට ඉක්මෙන්

සෙ/5ආර්01302
ලා/කෝ හෙළකුමාරි වස්වම්කේවිපී

2009.02.09 දින වික්වමඩු හිඳ ත්‍රස්තවාදීන්ගේ ස්ලේමේ ප්‍රහාරයකට ඉක්මෙන්

නිකොටින්වලට කළ හැකි විපත

දුම්කිම වඩාත් ප්‍රචලිතව දක්නට ලැබුනේ පළමුවන ලෝක මහා යුද්ධයෙන් (1914-1918) පසුවය. විශේෂයෙන් යුද්ධ කාලයේ කාන්සිය නිවාගැනීම සඳහා යුද භටයෝ සිගරට් දුම් ඉරුහ. අද බාල, මහලු, ගැහැණු, පිරිමි කවුරුත් සිගරට් දුම් උරති. අද මෙය මෝස්තරයක් බඳුය. ලොව පුරා බෙහෙවින් ප්‍රචලිතව ඇති මෙය තමා විසින් උවමනාවෙන් මාරයා ළංකර ගැනීමක් බව වටහා ගෙන නැත.

සිගරට්හි බහුලව අඩංගු වන්නකි. නිකොටින්ය. සෑම සිගරට් උගුරකම මිලිග්‍රෑම් 1 සිට 3 දක්වා නිකොටින් දක්නට ඇත.

ලංකාවේ නිපදවන සිගරට්වල නිකොටින් මිලිග්‍රෑම් ප්‍රමාණයන් මෙසේ දක්වා ඇත.

ප්ලේයර්ස් ගෝල්ඩ් ලීෆ්	0.8
මැටර්හෝන්	1.2
ක්‍රිස්ටල්	1.2
ෆෝර්සස්	1.7
කැප්ස්ටන්	1.1

පිටරට නිෂ්පාදිත සිගරට් වර්ගයන්හිද මිලිග්‍රෑම් 1.2 සිට 0.8 දක්වා නිකොටින් ප්‍රමාණයක් අඩංගු වේ. නිකොටින් වැඩිවීම නිසා ශරීරයේ රුධිර පීඩනය වැඩිවෙයි. ස්නායු උත්තේජනය කරන බැවින් හෘද ස්පන්දන වාර ගණන වැඩිවෙයි. සාමාන්‍යයෙන් මිනිත්තුවකට විසිවාරයක් පමණ වැඩිවෙයි. මේ නිසා දිනකට හෘද ස්පන්දනය බෙහෙවින් වැඩිවන අතර, හෘදය අධිකව ක්‍රියා කෙරේ. මෙය රුධිර නාලවල හැකිලීමද ඇතිකරයි. එක් සිගරට්ටුවක් අතේ ඇඟිලිවල හා පාදයේ ඇඟිලිවල උෂ්ණත්වය 10F න් පහතට බසින බව දැක්වේ.

නිකොටින් ශරීරයට අවශ්‍යයි පවත්නා අදහස විද්‍යාත්මක ලෙසින් නොපෙනෙන බව පෙන්වා දෙයි. *(Cigarette Smoking DHEW Publications Washington D.C 1974)* සිගරට් දුම සමඟ *C10 H14N2* නම් මාරාන්තික ක්ෂාරීය පදාර්ථයක් ද ශරීරයට ඇතුළුවේ. සිගරට් දුම පෙනහලු පිළිකාවලට ප්‍රධානතම හේතුවකි. මුළු ලොවම පෙනහලු පිළිකාවලට ගොදුරු වී ඇති අතර, මෙරට සිගරට් පානය කරන වේගය බලන විට පෙනහලු පිළිකා අතින් ලොව ප්‍රමුඛස්ථානයක් නොගනිතැයි කිව නොහැකිද? දුම්පානය හා පිළිකා රෝග අතර පවතින්නේ දැඩි සම්බන්ධතාවයකි. පෙනහලු, හෘදය, මුඛය, ශ්වාසනාලය, ආදී ශරීරයේ තවත් නොයෙකුත් ඉන්ද්‍රියයන් සම්බන්ධිත රෝගවලට ප්‍රධානම හේතුකාරකයකු ලෙස දුම් පානය දැක්වේ.

සිගරට්වල පිළිකා උපදවන බහුවක්‍රාකාර කාබන් වෙයි. හයිඩ්‍රජන් සයනයිඩ්, කාබන් මොනොක්සයිඩ් මෙයින් වඩාත් ප්‍රධානය, දුම්කොළ පිළිස්සීමෙන් මතුවන කාබන් මොනොක්සයිඩ් ශරීරයට බෙහෙවින් විෂදායකය. එවැන්නකුගේ ශරීරයේ කාබන් මොනොක්සයිඩ් ප්‍රමාණය වාතයේ ප්‍රමාණයට වඩා දහස් ගණනින් වැඩිය.

පෙනහලු පිළිකා රෝගීන්ගෙන් 90% කටත් වඩා සිගරට් පානය කරන්නන් බව හෙළිවී ඇත. පළවන යුද සමයෙන් පසු පෙනහලු පිළිකා රෝගීන් බහුලව දක්නට ලැබිණි. දුම්පානය නතර කරලීම හෘදයාබාධ සම්බන්ධයෙන් වැදගත් වන අතර, හෘද රෝගවලින් මියයාම වඩාත් දුම්පානය කරන්නන් අතර, වන බවද කියවෙයි.

ශ්වාසනාලය, ආමාශය, ආශ්‍රිත රෝග නිසා දුම්පානය කරන්නන්ගේ සුවවීම ප්‍රමාදව සිදුවෙයි.

දුම්පානය වුවමනාවෙන්ම ජීවිතය කෙටි කර ගැනීමකි. දිනකට සිගරට් පැකට් දෙකකට වඩා බොන්නකුගේ ආයුෂ කාලය අවුරුදු 8.3 කින් අඩු වෙයි. ඇත්තෙන්ම දුම් පානයට පුරුදු වන්නා අනෙකුත් මත්ද්‍රව්‍ය, මත්කුඩු ආදියට පහසුවෙන්ම පෙළඹෙයි. මවක් සිගරට් බොන කළ දරුවන්ට බ්‍රොන්කයිටිස් හා නිමෝනියා ආදී රෝග පහසුවෙන් වැළඳේ. දුම්පානය කරන මව ලෝකයේ මිලියන තුනක් දරුවන්ගේ ජීවිත අවුරුදු පතා අනතුරට පත්කරති. සිගරට් දුම නිසා දරුවාට වන හානිය විශාලය. සිගරට් නොබොතත් බොන අය ළඟ සිටින්නාට ද හානි සිදුවෙයි.

දුම්පානයේ හානිදායකත්වය අවබෝධ කරදිය යුතු වේ. සිගරට් පැකට්වල දුම්කොළ හානිය සඳහන් කිරීම අනිවාර්ය කරුණක් වන්නේය. දුම්පානය වළකාලිය යුතුයැයි කවුරුන් කීවත් දුම්පානය ප්‍රචාරය සඳහා ව්‍යාපාරයන් ගෙනයන ප්‍රාචාරාත්මක වැඩපිළිවෙල ද ඉතා විශාලය.

සිගරට් දුම්කිම සදහටම නැතිකර දැමීම ජනතාවගේ සුඛසෙත රැකගැනුමට ගත හැකි හොඳම මඟ යැයි මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සොබ්‍ය නිලධාරී පවසා සිටී.

1998 ජනවාරි "මහගර්" සඟරාවේ ඇසුරිනි..

යුග දිවියේ අන්‍යෝන්‍ය ගැලපීම

විවාහ වීමේදී අන්‍යෝන්‍ය ගැලපීමේ නිවැරදිකම නොතැකීම ආදරය අවහිර කරන බාධකයකි. අන්‍යෝන්‍ය කැමැත්ත යනු අන්‍යෝන්‍ය ගැලපීම නොවේ. කැමැත්ත තාවකාලිකය. එහෙත් ගැලපීමේ හෝ නොගැලපීමේ ප්‍රතිඵල සදාකල්හි විඳින්නට සිදුවේ.

සියයට සියයක්ම ගැලපෙන දෙදෙනෙක් නොමැත. නොගැලපෙන දෙදෙනෙක්ද නැත. එහෙත් දෙදෙනාගේ සමානකම් සියයට පනස් එකකට වඩා වැඩි විය යුතුය. දෙදෙනාගේ අසමානකම් සියයට හතලිස් නවයකට වඩා අඩුවිය යුතුය.

යම් යුවලක් අතර සියයට පනස් එකකට වඩා වැඩියෙන් ඇත්තේ සමානකම්ද? අසමානකම්ද? යුග දිවිය ගතකරන විට ඒ වැඩිපුර ඇති සමානකම්, අසමානකම් හෝ තව තවත් වර්ධනය වේ.

අත්දැකීම් හා පරිණත බව අඩු යොවුන් සිත බොහෝවිට මෙහෙයවනු ලබන්නේ බුද්ධිය විසින් නොව හැඟීම් විසිනි. ඒවා යහපත් අවේගයන්ද විය හැකිය. කෙසේ වුවද එම ආවේනික ස්වභාවය හේතුකොටගෙන පහසුවෙන් හා ඉක්මණින් පෙනෙන්නේ නොගැලපෙන දේ පවා ගැලපෙන දේ ලෙසට වැරදියටය.

තමාට වඩාත්ම ගැලපෙන තැනැත්තා කවුරුන්දැයි ගවේෂණය කරගත හැකි වනුයේ ප්‍රතිලිංගිකයන් උපරිම සංඛ්‍යාවක් නිරීක්ෂණය කර බැලීමෙන් පසුවය.

ගැලපෙන කෙනෙක් සොයාගන්නට ඔත්තුවක්

ඒ සඳහා අවංකව, සංවාදශීලීව, සදාචාරාත්මකව නිදහස්ව ඇසුරු කර බැලිය යුතුය. එසේ ඇසුරු කිරීමේදී කිසිවකුව දිනා ගැනීමේ අරමුණ මුළුමනින්ම බැහැර කළ යුතුය. පෙම්වතකු හෝ පෙම්වතියක බවට පත් නොවී හැඟීම්වලට වහල් නොවී ඇසුරු කළ යුතුය. මෙය කෙසේවත් ලේසි පහසු දෙයක් නොවේ. මන්දයත් ලිංගික ආශ්වාදය ලැබීමටත්, ආලයෙන් පෙළෙන්නටත් අවිවාහකයන් පෙළැඹෙන්නේ, ප්‍රතිලිංගිකයන්ව රිසි සේ ඇසුරු කිරීමට පහසුකම් වැඩි වූ විටය. එවැනි දේට පෙළැඹුණු විට, වඩාත්ම ගැලපෙන්නට තෝරා ගැනීමේ අවස්ථාව අහිමි වෙයි. එම අනතුරෙහි අවාසිය සිහියෙහි ධාරණය කර ගතහොත් එම අනතුර වළක්වා ගත හැකිවෙයි. යමෙකුව ඇසුරු කළ යුත්තේ තමා සහ අනෙකා සැබැවින්ම ගැලපේද නැද්ද යන වග දෙදෙනා විසින්ම තේරුම් ගැනීමට අන්‍යෝන්‍ය සහයවීමේ අරමුණින් මිස අනෙකාව කෙසේ හෝ හිමිකර ගැනීමේ අරමුණින් නොවේ. යම් දෙදෙනකු කෙසේවත් නොගැලපේ නම් ඒ බව තේරුම් ගැනීමට දෙදෙනාම එකිනෙකාට අවංකව සහය වුවහොත්, එම අව්‍යාජ සන්නිවේදනය විසින් ගොඩනඟනු ලබන අන්‍යෝන්‍ය ක්‍රියා කරන දෙදෙනකු අතර එවැනි අව්‍යාජබවක් මතු නොවේ.

බොහෝ විට තරුණ තරුණියන් තුළ ඇත්තේ හොඳම

ප්‍රතිලිංගිකයකුව හිමිකර ගැනීමේ තරගයකි. අන්‍යෝන්‍ය ගැලපීම නිවැරදිව සිදුවීම සඳහා එය බාධාවකි. ප්‍රතිලිංගිකයන්ව දිනා ගැනීම සඳහා ඇතැම් විටක සමලිංගික කණ්ඩායම් තුළ අන්‍යෝන්‍ය සහයෝගයක්ද තරගකාරීත්වය වෙනුවට ආදේශ වෙයි. තරගකාරී ලෙස සිදු වූවත් උපක්‍රමශීලීව සහයෝගයකින් සිදු වුවත් ප්‍රතිලිංගිකයකුව දිනා ගැනීමේ වැයම අයහපත්ය. වඩාත් සොඳුරු වන්නේද වෙනත් සාමූහික සහයෝගයකි. එනම් වඩාත් හොඳින් ගැලපෙන තැනැත්තන් එකිනෙකාට හඳුනාගනු ලැබීම සඳහා ලිංග භේදයකින් තොරව පුද්ගලයන් අතර සහයෝගයෙන් ක්‍රියාත්මක විය යුතුය.

තමා සමඟ විවාහ වන්නැයි යදින හෝ බල කරන තැනැත්තා ඉතා ආත්මාර්ථකාමියෙකි. එවැනි තැනැත්තා හෝ තැනැත්තිය වනාහි විවාහ කරගැනීමට කොහෙත්ම නුසුදුස්සෙකි. තමාව අතහැර තමාට වඩා වැඩියෙන් ගැලපෙන තැනැත්තෙකුව විවාහ කර ගන්නට ඔබට හෘදයාංගමව නිදහස දෙන තැනැත්තා යහපත් කෙනෙකි.

විවාහ කර ගන්නේමැයි ඔබ කිසිවෙකුට කොතෙක් පොරොන්දු දී තිබුණා වුවත්, නොගැලපෙන බව හැඟේ නම්, පොරොන්දු කඩ කිරීම වරදක් නැතැයි මම සිතමි. තමාගේ නොහැකියාවන්, දුබලකම් හා නොගැලපීම් රහසිගතව සඟවමින් තමාගේ හැකියාවන්, හපන්කම් හා ගැලපීම් පමණක් අනෙකාට ඒත්තු ගැන්වීමට වැයමක් විවාහපේක්ෂක තරුණ තරුණියන් අතර තිබේ. වඩාත්ම ගැලපෙන අයකු ලැබීම සඳහා මෙය බාධාවකි. සිදුවිය යුත්තේ තම දුබලකම් අනෙකාට තේරුම් ගැනීම සඳහා තමා අවංකව හෙළිදරව් වීමය. ඔබගේ නොගැලපීම්, දුර්වලකම් හා දුර්ගුණයන් ආදිය තේරුම්ගත් පසුත්, ඔබ සමඟ විවාහ වීමට එම තැනැත්තා හෝ තැනැත්තී කැමති වේ නම්, එම කැමැත්ත පහසුවෙන් වෙනස් නොවේ. දීර්ඝකාලීන වී පවතියි.

විවාහ කර ගන්නේමැයි ඔබ කිසිවෙකුට කොතෙක් පොරොන්දු දී තිබුණා වුවත්, නොගැලපෙන බව හැඟේ නම්, පොරොන්දු කඩ කිරීම වරදක් නැතැයි මම සිතමි. තමාගේ නොහැකියාවන්, දුබලකම් හා නොගැලපීම් රහසිගතව සඟවමින් තමාගේ හැකියාවන්, හපන්කම් හා ගැලපීම් පමණක් අනෙකාට ඒත්තු ගැන්වීමට වැයමක් විවාහපේක්ෂක තරුණ තරුණියන් අතර තිබේ. වඩාත්ම ගැලපෙන අයකු ලැබීම සඳහා මෙය බාධාවකි.

හෙළිදරව්ව එක් අයෙකුගෙන් පමණක් සිදුවීම ප්‍රමාණවත් නැත. දෙදෙනාගෙන්ම අන්‍යෝන්‍යව සිදුවිය යුතුය. තමන්ගේ දරුවාට විවාහවීමට කෙනකු සෙවීමේදී මව්පිය විධිහිටි නැදෑ ආදීන් උනන්දුවක් දක්වනුයේ ධනය, උගත්කම, පරපුර, ආගම, නිලය, කුලය, හඳහන ආදියෙහි සමානකම් සලකා ගැලපීම මැනීමටය. දරුවා වැඩි අවධානයක් යොමු කරනුයේ රූපය හා චරිතය ගැනය. එහෙත් තෝරා ගැනීම නිවැරදි වීම සඳහා ඒ දෙවර්ගයටම වඩා බලපාන්නේ විවාහපේක්ෂක දෙපලගේ අධ්‍යාත්මික, අනන්‍යතාවයන්ගේ ගැලපීමය. එනම් ජීවිත අරමුණ, පරමාදර්ශයන්, ආකල්පයන්, රුචි අරුචිකම්, වර්යා රටාවන් ආදියෙහි ගැලපීමය. පුද්ගල වර්ගයේ නොහොත් පුද්ගල ගුණයේ ගැලපීමය.

එහෙත් කුමන නොගැලපීම වුවත් ප්‍රබල ගැලපීමක් බවට පත් කරන්නට අන්‍යෝන්‍ය අවශ්‍යතා බවට හා අන්‍යෝන්‍ය නිදහසට හැකිය.

1995 දෙසැම්බර් "මුතුහාර්" සඟරාවේ
රංජිත් පෙරේරා සහ අය විසින් සංස්කෘත ලිපියක් ඇසුරිනි.

උතුම් ගුණයට පැතුම් කළඹක්

5 වන (සෙව්) ගජබා රෙජිමේන්තුවේ රාජකාරියෙහි නියුතු ලාන්ස් කෝප්‍රල් දීරසිංහ ආර්කේඩීඑස් යන කොනොනි වෙත පසුගිය දිනක හොරොව්පතාන මහජන බැංකු පරිශ්‍රයේ ඇති *'ATM'* යන්ත්‍රය අයල තිබී රුපියල් 70,400.00 ක මුදලක් හමුවී ඇත. එහිදී, ඔහු විසින් බැංකු කාර්ය මණ්ඩලයේද සහයෝගය ඇතිව එම මුදල කඩිනමින් අදාළ හිමිකරු සොයා ආපසු ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව 623 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ උපදෙස් මත 5 වන (සෙව්) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් එච්එම්ආර්ඩීකේ හේරත් හා බැංකු කළමනාකරු ඉදිරියේදී එම මුදල එහි අයිතිකරු වන හොරොව්පතාන ප්‍රදේශයේ පදිංචි ජවුෆර් මොහොමඩ් මුසාෆර් මහතා වෙත භාරදීමට ක්‍රියා කෙරිණ. ලාන්ස් කෝප්‍රල් දීරසිංහ ආර්කේඩීඑස් කොනොනි විසින් ඉටුකළ මෙම උතුම් මෙහෙයට "රණවිරුවා" ද මෙසේ සුබපැතුම් අක්කරයි.

නව යොවුන් වියේ දරුවන් හිවැරුදිව හඳුනාගැනීම සඳහා

මනෝවිද්‍යාත්මක අත්වැලක්

දරුවන් නව යොවුන් පත්වීම ආරම්භ වන්නේ වයස අවුරුදු 12 සිට 20 දක්වා කාල පරාසය තුළය. මෙහිදී, ඇතැම් දරුවන් ඉහත වයස් ඛණ්ඩයට අයත් වුවද ඔවුන් "ළමුන්" ලෙසත්, දරුවන් කොටසක් "වැඩිහිටියන්" ලෙසත් හැඳින්විය හැක. එහෙත් නූතන මනෝව්‍යාවට අනුව හැසිරීම්, ශාරීරික ලක්ෂණ හා මොළයේ වර්ධනය අනුව නව යොවුන්වියේ පසුවන පුද්ගලයන්ගේ මොළය වැඩිහිටි සහ ළදරු මොළයන්ට වඩා වෙනස්ය.

ඒ අනුව නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ ගතිලක්ෂණ වන්නේ,

1. නවීන දෑ සොයා යෑම
2. හොඳ තර්ක බුද්ධියක් පැවතීම
3. හදිසි තීරණ ගැනීම
4. ආවේගශීලී බව
5. දෙමාපියන්ගේ ඇසුරින් මිදී නව යහළු යෙහෙළියන් වෙත වඩාත් සමීප වීම

නමුත්, දෙමාපියන් හැටියට ඔබ දැනගත යුතු වන්නේ මෙය සාමාන්‍ය ගතිලක්ෂණයන් බවයි. එහෙත් මෙම ලක්ෂණ දෙමාපියන් අවබෝධ නොකරගැනීම නිසා ගැටලුකාරී තත්ත්වයක් ඇතිවිය හැක.

උදාහරණ :- දරුවන් ආවේගශීලී වන අතර හදිසි තීරණ ගැනීම නිසා ඇතිවිය හැකි ගැටලු පිළිබඳව දරුවාට අවබෝධයක් නැත,

මෙම ලක්ෂණ ඇතිවීමට මොළයේ වර්ධනය බලපානු ලබයි. මෙම අවස්ථාව වනවිට ආවේග ඇතිවීම පිළිබඳ මොළයේ කොටස් හොඳින් වර්ධනය වෙමින් පවතින අතර, ආවේග පාලනය කරගැනීමේ කොටස් වර්ධනය වී අවසාන වන්නේ වයස අවුරුදු 25 ක් පමණ වනවිටදීය.

යමක් කිරීමට පෙර වැඩිහිටියන් එමඟින් ලැබෙන ප්‍රතිවිපාක ගැන පළමුව සිතුවද, නව යොවුන්වියේ පසුවන තරුණයන් එහි ඇති ආස්වාදය ගැන ප්‍රථමයෙන් සිතන අතර ප්‍රතිවිපාක පිළිබඳ අවධානයට යොමු කරනු ලබන්නේ දෙවනුවය.

එය මෙසේ අර්ථ දැක්විය හැක. නව යොවුන්වියේ දරුවකුගේ මොළය ආවේග සම්බන්ධයෙන් හොඳ Accelerator එකක් තිබුනද Brake එකක් නැති වාහනයක් වැනිය.

මෙම අවදියේදී ඔවුන් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට පටන්ගැනීමයි. එම අවස්ථාවේදී දෙමාපියන් සමඟ පෙර තිබූ සම්බන්ධතාවයේ ස්වරූපය වෙනස් වේ. බොහෝ දෙමාපියන්ට මෙය අසාමාන්‍ය අවස්ථාවක් ලෙස සිතෙන අතර නමුත්,

එය සාමාන්‍ය ක්‍රියාවලියකි. එය නව යොවුන්වියේ දරුවන් වැඩිහිටියකු වීමට ලබාගන්නා පෙර සූදානමකි. එනම්, ඔවුන්ගේ වර්ධනයේ කොටසකි.

නව යොවුන්වියේ දරුවන්ට කැමති ආකාරයට ක්‍රියාකිරීමට ඉඩ හැර දෙමාපියන් විසින් බලා සිටීම කළ යුතුද යන්න විග්‍රහ කිරීමේදී ඔවුන් සඳහා දෙමාපියන් විසින් නිසි ආරක්ෂාව සහ මගපෙන්වීම කිරීම අනිශයින්ම වැදගත්වන නමුත් ඔවුන් සමඟ ක්‍රියාකිරීම වෙනස් කළ යුතුයි.

උදාහරණයක් ලෙස පෙර දරුවා අධ්‍යාපන කටයුතුවලදී ඔබ ඔහු ළඟට ගෙන පාඩම් කියා දුන්නේනම් දැන් ඔහුට තනිවම පාඩම් කිරීමට අවස්ථාව ලබාදී අධීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. එසේ නොමැතිව පෙර ආකාරයට අනුව ක්‍රියා කිරීමට ගියහොත් දරුවාට එය කරදරයක් වනු ඇත.

එබැවින් දරුවට නිදහසේ වැඩිහිටියකු ලෙස ක්‍රියාකිරීමට අවස්ථාව ලබාදීම අනිවාර්යය වන අතර, එය තුළින් ගැටලුවලට මුහුනදීමටත් ඒ සඳහා පිළියම් සෙවීමට ඔහු විසින්ම උත්සාහ දරනු ඇත.

නව යොවුන්වියේ දරුවන් තමාගේ අදහස පිළිබඳව ඉතා සංවේදී වන අතර තමන් පිළිබඳ දෙමාපියන් පෙර නිගමනයට පැමිණ ක්‍රියාකරනවා යන්න හැඟීගියහොත් තර්ක කිරීම, කතා කිරීම ප්‍රතික්ෂේප කිරීම, ඒ සඳහා ප්‍රතිවිරුද්ධ දේ කිරීමට පෙළඹිය හැක.

උදාහරණයක් වශයෙන් පාසල් ගොස් නිවස වෙත පැමිණීමේදී කුමන හෝ කරුණක් නිසා ප්‍රමාද වුවහොත් ඒ බව සොයා බැලීමකින් තොරව පූර්ණ නිගමනයට පැමිණ දෙමාපියන් විසින් තම දරුවා දුම්පානය වැනි දෑ කරනවා ඇත කියා පූර්ණ නිගමනයන්ට එළඹීම නිසාම දරුවා විසින් ඒ සඳහා පසුව යොමු වුවහොත් නැවත එම ප්‍රශ්න අසන අවස්ථාව වනවිට ඒ සඳහා අසත්‍ය ප්‍රකාශ කිරීමය වැඩි ඉඩක් ඇත.

එවැනි වරදක් ඇත්ත වශයෙන්ම දරුවා අතින් සිදුවී ඇතිනම් පළමු දරුවා සන්සුන්කර, ඉන් අනතුරුව ඒ පිළිබඳ විවෘතව දරුවා සමඟ සුහදශීලීව කතා කොට එහි ආදීනව නිවැරදිව අවබෝධ කරදෙන්න.

දරුවාගේ ගැටළු හඳුනාගැනීමට උපකාර විය යුත්තේ කෙසේද?

සමහර අවස්ථාවලදී දරුවා යම් ගැටළුවක සිටින බව දෙමාපියන් වන

අප විසින් අවබෝධ කර ගත්තේ නම් එය,

1. පාසලේ අනෙකුත් දරුවන් සමඟ ඇති වූ ගැටළුවක්ද?
2. පාඩම් වැඩ නිසා ගැටළුවක්ද?
3. නැත්නම් වෙන කුමක් හෝ වෙනත් කරුණක් නිසාද?

යන්න නිවැරදිව ඔහු සමඟ කතාකොට අවබෝධ කරගැනීමෙන් අනතුරුව ඒ සඳහා ඔහු තුළ තිබෙන විසඳුම් එකින් එක අසා දැනගත හැකිය. ඒ සඳහා ඔහුව විසඳුම් නොමැතිව සිටින බැව් හැඟීගියහොත් එම ගැටළුව සඳහා විසඳුම් රාශියක් ඇති බව ඔහුව වටහා දිය යුතුයි.

උදාහරණයක් ලෙස,

ගැටළුව	විසඳුම්
දරුවට වෙනත් ළමයකු විසින් අනවශ්‍ය විහිළු කිරීම	1. ගුරුවරයකුට කීම 2. එය මඟහැරීම 3. එසේ පැවසූ ළමයාටද විහිළුවක් කිරීම

ඉන් අනතුරුව එම විසඳුම් පිළිබඳව ළමයා සමඟ එකින් එක කතා කිරීම ගුරුවරයාට දැනුම්දීම තුළින් අනෙක් ළමයින්ද තරහා විය හැකිද? යන්න ඔහුගෙන් විමසීම හා ඒ සඳහා නිවැරදි තීරණයක් ගැනීමට උපකාරී වේ. එසේම මඟහැරීම, ඔහුට පෙරලා විහිළුවක් කිරීම තුළින් ප්‍රශ්න දුරදිග නොයන බව අවබෝධ කරදිය හැකිය.

කණ්ඩායම් වශයෙන් දරුවන් සිටින විට වගකීමෙන් වැඩ කිරීමට අවබෝධ කරදීම,

නව යොවුන්වියේ දරුවන් කණ්ඩායම් වශයෙන් සිටීමේදී නොයෙකුත් වැරදිවලට පෙළඹීමේ සම්භාවිතාවය වැඩිවීමට හේතුව යහළුවන් සියලුදෙනා විසින් යම් කටයුත්තක් සඳහා පෙළඹවූ විට තමාද නොදැනුවත්වම ඒ සඳහා යොමුවීම හා ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කිරීමට ඇති නොහැකියාවයි. එහිදී, දරුවාට නිවැරදිව තීරණ ගැනීමට ඔහුම කියාදිය යුතුය. උදාහරණයක් ලෙස උද්ඝෝෂණයට සහභාගී වීම ගැන අපි සිතමු. එවැනි දෙයකට යොමුවීම නිසා අනාගතයේ ඔහුට සිදුවිය හැකි ප්‍රතිපලයන් ගැන දරුවා සමඟ අදහස් හුවමාරු කරගත යුතුය.

අවසාන වශයෙන් අප මතක තබාගත යුත්තේ නව යොවුන්වියේ දරුවන් ආවේගශීලී වුවද ආවේග පාලනය කර ගැනීම සඳහා වූ ක්‍රියාවලිය සඳහා වූ මොලයේ වර්ධනය වෙමින් පවතින බවයි. මෙය නව යොවුන්වියේ දරුවන් නිවැරදිව හඳුනාගැනීමට රුකුලක් වන බව නොඅනුමානය.

සටහන :-
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක
ගෞර,
(මනෝවිද්‍යා උපදේශක)
ශ්‍රීලංකා යුද හමුදාව
hemantharatnayake20gr@gmail.com

අපේ ජාතික ගීයේ පුරාණය

රටක ජාතික ගීය ලෙස සලකණු ලබන්නේ නිල වශයෙන් පිළිගැනීමකට ලක්ව ඇති දේශාභිමානී ගීතයක් හෝ උසස් තත්ත්වයේ සංගීතමය නිර්මාණයකි. රටක අනන්‍යතාවය විදහාපාන ජාතික ගීය තම මව්බිම පිළිබඳ භක්තියක්, ඇල්මක්, ගෞරවයක් මෙන්ම පක්ෂපාතීත්වයක්ද ජනිතකරවන අතර, අපද ශ්‍රේෂ්ඨ යුද්ධ හමුදාවක් ලෙස සියලු නිල උත්සව ආදියෙහි අවසානය සංකේතවත් කරන්නේද ඉහත කරුණු මුල්කරගෙන ජාතික ගීය ගායනා කිරීමෙනි. 74 වන ජාතික නිදහස සමරනු ලැබූවද "ශ්‍රී ලංකා මාතා" යන පදවලින් ආරම්භ වුවද එදා "නමෝ නමෝ මාතා" යන පදවලින් ඇරඹුණ ශ්‍රී ලංකාවේ පළමු ජාතික ගීය හා එහි විකාශනය විවර කිරීම මෙම ලිපියේ අරමුණයි.

1911 දී පාදුක්ක ප්‍රදේශයේ උපත ලබා ගාල්ල මහින්ද විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස කටයුතු කළ ආනන්ද සමරකෝන් ගුරින් විසින් 1940 දී නිර්මාණය කරන ලද "නමෝ නමෝ මාතා" ගීතය මුල්ම වරට ගායනාකරන ලද්දේ එම පාසලේම සිසුන් පිරිසක් විසිනි. ඒ සංගීත ප්‍රායෝගික අභ්‍යාසයකදීය. ගීතය මුල් වරට එළි දක්වනු ලැබුවේ "කුමුදුනී" නමැති ගී පොතක් මගිනි. එම පොතේ රචකයාද සමරකෝන් ගුරින්මය. එසේම, එම ගීතය නාද රටා සංගීතය මුසුව පරිපූර්ණ ගීතයක් හැටියට මුල් වරට අසන්න ලැබුණේ ගුවන් විදුලියෙනි. එකල ජාතික ගීය නොවූවද මෙම ගීතය රසිකයන් අතර ජනප්‍රිය ගීතයක් වූ අතර ගීතය තැටිගත කළ සාමාගම වූයේ එච්.එම්.වී සමාගමයි.

1948 අප රටට, බ්‍රිතාන්‍ය කිරීටය විසින් නිදහස ලබාදීමට නියමිත බවට වූ ආරංචිය දසන පුරා පැතිරී ගිය අතර, එය මහත් උත්සවාකාරයෙන් සැමරීමට හා ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක, ශ්‍රීමත් ලලිත රාජපක්ෂ, ඊ.එල්. නුගවෙල හා ජේ.ආර්. ජයවර්ධන යන ඇමැතිවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන ලදී. එවක බොහෝ දේශානුරාගී ගී කවි කිහි වී තිබූ යුගයක් වන

ආනන්ද සමරකෝන් ගුරින්

අතර, පිබෙව් ජාතික එස් මහින්ද හිමි නිර්මාණය කළ "දිනේ දිනේ සිරිලක ජාතික ආලේ" නමැති ගීතයද මෙරට නිල නොලත් ජාතික ගීයක් ලෙසට වැදගත් තැනක් ඉසිලීය. එකල මෙරට නිල ජාතික ගීය ලෙස පිළිගනු ලැබුවේ "God Save the king" යන අරුත් ඇති බ්‍රිතාන්‍ය ජාතික ගීයයි. ජාතික නිදහස් නිල උත්සවයේදී ජාතික ගීය ලෙස ගායනා කිරීමට දේශානුරාගී ගීතයක්, ගීත නිර්මාණ තරගයකින් තෝරා ගත යුතු බව උක්ත විද්වත් මණ්ඩලයේ අදහස විය. ඒ සඳහා විනිසුරු මඩුල්ලක්ද පත් කරන ලදී.

ගම්පොල පී.බී. ඉලංගසිංහ නොතාරිස් රාලහාමි විසින් රචනාකරන ලද "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා" යන ගීතය එම නිර්මාණ තරගයේ ප්‍රථම ස්ථානයට තේරුණු අතර

සමරකෝන් ගුරින්ගේ "නමෝ නමෝ මාතා" යන ගීතය දෙවන ස්ථානයට තේරීපත් විය. ඒ අනුව 1948 පෙබරවාරි 4 වන දා ප්‍රථම නිදහස් නිල උත්සවය මහනුවර දළදා මාළිගා භූමියේ පැවති අතර, එහිදී මෙරට ජාතික ගීය ලෙස ගායනා කරන ලද්දේ "නමෝ නමෝ මාතා පාලා යස මහිමා" යන ගීතයයි. ඒ අනුව මෙරට පළමු ජාතික ගීය වන්නේ ගම්පොල පී.ඩී. ඉලංගසිංහ නොතාරිස් රාලහාමි විසින් රචනාකරන ලද "ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා"යන ගීතයයි. ඒ අනුව බලන කළ අද අප ගායනා කරණු ලබන්නේ අප රටේ පළමු ජාතික ගීයද නොවේ.

වසරක් ගෙවී ඊළඟ වසර උදාවිය. 1949 පෙබරවාරි 04 වනදා මෙරට දෙවෙනි නිදහස් නිල උත්සවයේ කටයුතු සම්පාදනය වීම ඇරඹිණි. පෙර වසරේ, එනම් පළමු නිදහස් උළෙලේ ගායනා කරනු ලැබූ ජාතික ගීය, නිර්මාණ තරඟයේ ප්‍රථම ස්ථානයට පත්වීම පිළිබඳ, යම් විරෝධතාවක් එල්ල විය. එයට හේතුව වූයේ එම ගීතය නිර්මාණය කළ පී.ඩී. ඉලංගසිංහ නොතාරිස් රාලහාමි මෙන්ම ගීතය සංගීතවත් කළ ලයනල් එදිරිසිංහයන් එම විද්වත් විනිසුරු මඩුල්ලේම සාමාජිකයින්ව සිටීමයි. එම හේතුවෙන් පෙර වසරේ ගීත නිර්මාණ තරඟයෙන් දෙවන ස්ථානයට පත් ආනන්ද සමරකෝන් ගුරින්ගේ "නමෝ නමෝ මාතා" ගීතය නිතරඟයෙන්ම ප්‍රථම ස්ථානයට පත් වූ අතර, 1949 පෙබරවාරි 04 වන දා සිට අඛණ්ඩව අද දක්වාම එම ගීතය මෙරට ජාතික ගීය ලෙස පැමිණ සිටී. මෙරට නිදහස ලැබීමේ වර්ෂ පූර්ණ සංවත්සරය 1949 පෙබරවාරි 04 වන දා, (අද නිදහස් චතුරශ්‍රය ලෙස හැඳින්වෙන) "ටොරින්ටන් චතුරශ්‍රය" භූමියේ උත්සවාකාරයෙන් පැවැත් වූ අතර, මෙම ගීතය කොළඹ මියුසියස් බාලිකා විදුහලේ සිසුවියන් පිරිසක් විසින් ගායනාකරන ලදී. එම රාජ්‍ය නිල උත්සවයේදී සිංහල, දමිළ, අරාබි හා ඉංග්‍රීසි භාෂාවලින් ලියැවුණු "නිදහස් පණිවුඩය" සහිත මංජුසාව එහි අලුතින් ඉදිකිරීමට නියමිත වූ නිදහස් මන්දිර ගොඩනැගිල්ලේ අත්තිවාරමේ තැන්පත් කිරීමෙන් අනතුරුව, වසර 133 ක බ්‍රිතාන්‍ය යටත් විජිත යුගය සංකේතවත් කරමින් සුදු පරවියන් 133 දෙනකු මුදා හැරීම නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා අතින් සිදුවන ලදී.

මේ සියල්ල සිදුවෙද්දී "නමෝ නමෝ මාතා" ගීතයේ නිර්මාතෘවරයා වූ ආනන්ද සමරකෝන් ගුරින් සිටියේ ඉන්දියාවේය. මාස ගණනාවක් තිස්සේ පැවැත්වුණු චිත්‍ර ප්‍රදර්ශනයකින් පසු ඔහු



ආනන්ද සමරකෝන් ගුරින් විසින් රචිත ජාතික ගීය මුල්වරට එළිදක්වනු ලැබූ "කුමුදිනි" නමැති ගී පොත

සමරකෝන් ගුරින්ට ඊළඟ සිත් රිඳුම වන්නේ මෙම ගීතයේ පද පෙරළියක් තමාගේ කිසිම අනුදැනුමකින් තොරව සිදුකිරීමෙනි. 1953 සිට මෙම ජාතික ගීය ආණ්ඩුවේ ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුකරන ලදී. ඉන්පසු මෙම ගීතයේ ආරම්භක කොටස වූ "නමෝ නමෝ මාතා" යන්න රාජ්‍ය නායකයාට දෝෂ ගෙන දෙන්නේයැයි එකල මතයක් ගොඩනගා ගත් පිරිස්වල මඟපෙන්වීම යටතේ එවක බලයේ සිටි රාජ්‍ය නායකයා විසින් එම පද කිහිපය වෙනුවට "ශ්‍රී ලංකා මාතා" ලෙස පද පෙරළියකට ලක්කරන ලදී.

ලංකාවට පැමිණ සිටුණේ 1949 වසරේ මැද භාගයේදීය. තමා විසින් නිර්මාණය කළ දේශාභිමානී ගීතය තම මව්බිමේ ජාතික ගීය බවට පත්ව තිබීම සතුටට කරුණක් ලෙස දැණුනද ඉන් පසු එක දිගට සිදුවූ සිදුවීම් තුළින් සමරකෝන් ගුරින් මහත් සේ කලකිරීමකට මෙන්ම සිත් තැවුලකටද පත් විය.

මෙම ගීතය වෙනුවෙන් රුපියල් 1250 ක පාරිතෝෂික දීමනාවක් රජය විසින් ලබාදෙන බවට ප්‍රකාශයට පත්කරන ලදී. එහෙත් මෙම ගීතය මුලින්ම "කුමුදුනී" ගී පොතේ ප්‍රකාශකයා විසින් ප්‍රසිද්ධියට පත්කළ සිදුවීම මත එම පාරිතෝෂික දීමනාව එම ප්‍රකාශකයාට ලැබිය යුතු බවට එච්.එම්. වි සමාගම විසින් උසාවියේ නඩුවක් ගොණු කළේය. කෙසේ හෝ උසාවියේ අවසාන තීන්දුව වූයේද මෙම දීමනාව එම ගීතය එළිදක්වපු පොතේ ප්‍රකාශකයාට ලැබිය යුතු බවයි. එම සිදුවීම සමරකෝන් ගුරින්ට සිත් වේදනා ඇති කරවන්නක් විය.

සමරකෝන් ගුරින්ට ඊළඟ සිත් රිඳුම වන්නේ මෙම ගීතයේ පද පෙරළියක් තමාගේ කිසිම අනුදැනුමකින් තොරව සිදුකිරීමෙනි. 1953 සිට මෙම ජාතික ගීය ආණ්ඩුවේ ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුකරන ලදී. ඉන්පසු මෙම ගීතයේ ආරම්භක කොටස වූ "නමෝ නමෝ මාතා" යන්න රාජ්‍ය නායකයාට දෝෂ ගෙන දෙන්නේයැයි එකල මතයක් ගොඩනගා ගත් පිරිස්වල මඟපෙන්වීම යටතේ එවක බලයේ සිටි රාජ්‍ය නායකයා විසින් එම පද කිහිපය වෙනුවට "ශ්‍රී ලංකා මාතා" ලෙස පද පෙරළියකට ලක්කරන ලදී.

අවසානයේ මෙම සියලු සිත් වේදනා දරාගෙන සිටි ඒ අසහාය නිර්මාණකරුවගේ හදිසි මරණයට හේතුව අධික ලෙස නිදි පෙති මාත්‍රාවක් ශරීර ගතවීමෙන් බවට වූ මරණ පරීක්ෂකවරයාගේ වාර්තාවත් සමඟ තවත් ශෝකාන්තයක නිමාවක් කාලයේ වැලි තලාවෙන් වැසී ගියේ යග එදා 1948 පෙබරවාරි 04 දා පළමු නිදහස් නිල උත්සවයට ගායනා කළ පී.ඩී. ඉලංගසිංහ නොතාරිස් රාලහාමි විසින් නිර්මාණය කළ ගීය මෙන්ම සමරකෝන් ගුරින් විසින් නිර්මාණය කර පසුව පද පෙරළියකට ලක්ව අද දක්වාම ලංකාවේ ජාතික ගීය ලෙස ගායනා කරන ගීයද "නමෝ නමෝ මාතා" යන පදවලින් ම ආරම්භ වීමනම් දෛවෝපගත සිදුවීමකි.

සමරකෝන් ගුරින් නැසී ගියද ඔහුගේ නම කාමත් නොනැසී තිබේ. අභිමානවත් ලෙස සමරණ මෙම 75 වන ජාතික නිදහසේදී මෙම සිහිපත් කිරීම දේශය වෙනුවෙන් අසීමිත කැපකිරීම් කළ ආනන්ද සමරකෝන් ගුරින්ට උපහාරයක්ම වේවා!

සටහන -
මේජර් එම්ඩී කාමිණී වීරවර්ධන ශ්‍රීලංකා,
මාර්ග II (ශ්‍රීලංකා කලාලාපාර්ශ්ව හා ප්‍රකාශනාලය)
ත්‍රිකුණාමලය විශේෂඥ විග්‍රහලේඛන ලෝකය හා සංවර්ධන අංශය,

මරාගෙන මැරුණු "කමලනීගේ මව කී කතාව"

2009 වසර අගභාගය වන විට යුද්ධයේ ගිනියම් උණුසුම සම්පූර්ණයෙන්ම පහව තිබිණි. එය වූ කලී තිස්වසක් තිස්සේ වැළලී තිබූ යාමයේ බලාපොරොත්තු සෑම හදවතක් තුළම අසීමිතව ඉහළට එසවෙන්නට වූ කාලයයි. එවක මා සේවය කළේ මුලතිව් දිස්ත්‍රික්කයේ "ඔඩිඩන්කුලම්" ප්‍රදේශයේ වූ කඳවුරකය. A-9 මාර්ගයේ "මාන්කුලම්" හන්දියෙන් හැරී "මල්ලාවි" දෙසට යන්න හමුවෙන කළුපාලමෙන් එහා එම ප්‍රදේශය පිහිටා තිබුණි. ත්‍රස්තවාදය නිමවීමෙන් පසු මුලතිව් ප්‍රදේශය පුරා නැවත පදිංචි කිරීම් ආරම්භ වූයේද එම කාලවකවානුව තුළදීමය. ඒ අනුව මා රාජකාරි කළ ප්‍රදේශය ආශ්‍රිතවද එතෙක් අතැර දමා තිබූ විශාල භූමි ප්‍රදේශයක යළි පදිංචි කිරීම් සිදු කරන්නට නියමිතව තිබිණ. ප්‍රදේශයේ ඉඩම්වල මුල් පදිංචිකරුවන් ඊට විසි වසරකට පමණ එපිටදී එම ප්‍රදේශ වලින් පලාගොස් තිබුණේ එවක පැවති යුද ගැටුම් නිසාමය.

එක්තරා දිනෙක උදෑසනින්ම උතුරේ අවතැන් කඳවුරුවල සිටි එම ජනතාව බස්රථවලින් මාගේ කඳවුරු බලප්‍රදේශය වූ "ඔඩිඩන්කුලම්" වෙත රැගෙන විත් තිබිණ. දශක දෙකකට ආසන්න කාලයක් තේකවිධ දුක්ඛ දෝමනස්සයන් අත්විඳි ඔවුන් යළි තම උරුම නිජභූමි කරා පැමිණි ප්‍රථම අවස්ථාව එය විය. රජයෙන් ලද සිමෙන්ති කොට්ට සහ ටකරන් තහඩු කිහිපයක්ද දින දෙකතුනකට ප්‍රමාණවත් වියළි ආහාරද හැරෙන්නට කිසිවක් ඔවුන් සතු නොවීය. තම සේසතම ගමන් මලු දෙකතුනක අසුරාගත් ඔවුහු පාළුවට ගොස් තිබූ තම හිමිකඩවල් දෙස බලා සිටි අයුරු අතිශය හැඟුම්බරය. එම හිමි කොටස් එවක සම්පූර්ණව තිබූ සුන්දර මතක ඔවුන්ගේ මුහුණුවල සටහන්ව තිබිණ.

කෙසේ හෝ සෑම අයකුම පාහේ එහි පැමිණි මොහොතේ පටන්ම තම තමන්ගේ ඉඩම්වල හැකි අයුරින් සිය නිවාස ඉදිකර ගැනීමට යුතුසුලු වූහ. නමුත් එම කාර්ය ලෙහෙසි පහසු නොවූයේ එම හිමි කොටස් සෑම එකක්ම පාහේ අධික ලෙස වල්කිහිව තිබීමත් එහි කටු අකුල්, වේ හුඹස් මෙන්ම සර්පයින් පවා බහුලව සිටීමත් හේතුවෙනි. එහි ඇතැම් ඉඩම්වල පෙරදී හිමි බෝම්බ පවා තිබී ඇති අතර යුද්ධය නිමාවුවද සාමාන්‍ය ජනතාව ඒවායේ පදිංචි කරවීම පමාවී තිබුණේද එම බෝම්බ සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතුව තිබූ හෙයිනි. මා සිටි කඳවුරු බලප්‍රදේශයේ නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ සොයා බැලීමේ වගකීම ඒ වනවිට මා වෙතද පැවරී තිබුණු අතර එවක මා කටයුතු කරන ලද්දේ ඒකක දෙවන අණදෙන නිලධාරීවරයකු ලෙසය. ඒ අනුව ප්‍රදේශය පුරා ඇවිදිමින් ඔවුන්ගේ අඩුපාඩු සොයාබලමින් එම සිවිල් ජනතාවට උපකාර කිරීමට මා ඇතුළු පිරිස ක්‍රියාකරන ලද්දේ රාජකාරිය ඉක්මවා ගිය මානුෂීය හැඟීමකිනි.

එදින දහවල වෙද්දී ක්‍රමයෙන් තම තමන්ගේ හිමි කොටස්වල හැකි පමණින් ඒ ඒ පවුල් විසින් තාවකාලික නිවාස ඉදිකරන්නට විය. නමුත්, ඒ අතර සිටි එක් මහලු කාන්තාවක් වසර හයක පමණ වන දියණියක තුරුළු කර ගනිමින් තමන්ට අයිති හිමි කොටසෙහි පසෙක වාඩිවී ගෝකී අයුරින් බලා සිටින අයුරු මාහට නිරීක්ෂණය විය. ඒ වනවිට කිසිදු ඉදිකිරීමක් සිදුනොකර තිබූ එහි ඔවුන් රාත්‍රිය කෙසේ ගතකරන්නේදැයි මාතුළ වූයේ කුතූහලයකි. ක්‍රමයෙන් අඳුර වැටීමටද ආසන්නව පැවති ඒ මොහොතේ ඊට පෙර මෙම අසරණ පවුල

වෙනුවෙන් සෙවණක් තනාදීම සිදුකළ යුතුම කාර්යයක් බවට එහිදී මාහට අවබෝධ විය. ඒ අනුව වහාම කඳවුරෙන් අමතර හටපිරියක්ද ගෙන්වාගත් මම අවවීන් සොයාගත් දැවදඬු උපයෝගී කොට ගනිමින් ඔවුන් වෙනුවෙන් සැලකිය යුතු තරමේ සෙවණක් තනාදීමට කටයුතු යෙදීමි. එකී නිවසේ ඉදිකිරීම් සිදුවන අතරතුර පෙර කී මහලු කාන්තාව කුඩා දියණියද තුරුළුකර ගනිමින් ඒ දෙස බලා සිටින්නට වූයේ තුෂ්ණීම්භූතවය. විශේෂයෙන්ම කිසිදින ඇ අපේක්ෂා නොකළ තරමේ උපකාරයක් හමුදා සාමාජිකයන් අතින් සිදුවනු දැකීම ඇයට දරාගත නොහැකි තරම් විය. කඳුළු පිරි දෙනෙතින් ඒ දෙස බලා සිටින ඇගේ හදවත තුළ මොකක්දෝ දුක්බර කතාවක් සඟවාගෙන ඇති සෙයක් පෙන්නුම් කළාය.

එම කටයුත්ත නිමකර හටපිරිසද සමග කඳවුරට පැමිණි මා රාත්‍රියේ කෑම පාර්සල් කිහිපයක්ද සූදානම් කොටගෙන යළි එම ප්‍රදේශය නිරීක්ෂණය කරන්නට වූයේ තවදුරටත් එකී ජනතාව වෙනුවෙන් කිරීමට තරම් උපකාරයක් ඇත්දැයි සොයාබලන අටියෙනි. එහිදී මා පෙර කියූ මහළු කාන්තාවටද කෑම පාර්සලයක් ලබාදීමේ අදහසින් එහි යද්දී දුටුවේ ඇය කුඩා දියණියද තුරුළු කරගනිමින් නිවස ඉදිරිපිට සුපුරුදු ඉරියව්වේම වාඩිවී හිස් අහස දෙස අරමුණකින් තොරව බලාසිටින අයුරුය. එහිදී ඇයගේ පශ්චාත්තාපය පිළිබඳ තවදුරටත් නොවිමසා සිටීමට මාහට නොහැකි විය. ඒ අනුව දෙමළ දන්නා සොල්දාදුවකුගේ සහායෙන් මම ඇය හා කතා කරන්නට උත්සුක වූයෙමි. එහිදී දැනගත් දෙයින් මා තුළ හටගත්තේ දැඩි කම්පනයකි.

කිසිවකුගේ හවිහරණක් නොමැතිව වුවද තම මිනිපිරිය හදාවඩා ගනිමින් ඇය ජීවිතයට මුහුණ දෙන්නට දරන වෑයම කොතරම් අගනේදැයි මට සිතුණි. විශේෂයෙන්ම ත්‍රස්තවාදීන් විසින් එවක හමුදාව පිළිබඳ එම ජනතාව තුළ මවා තිබුණේ අතිශය භයානක චිත්‍රයකි. නමුත් හමුදාව මෙවන් මානුෂීය ගති ඇත්තවුන් බව සිය නිවස සාදාදෙන තෙක්ම එකී මහලු කාන්තාවද දැන නොසිටියාය. ඇයට වැඩිපුරම දරාගත නොහැකිව තිබුණේද එයමය. සැබවින්ම යුද්ධය හමුවේ උපන් ගම්බිම් සේම හදවත්ද වල්බිහිවූ තිබූ සෙයකි. ඒවා ශුද්ධ පවිත්‍ර කොට ගුණදම් පිදෙන යහපත් ශාඛ වගාකළ යුතු නොවේදැයි මට සිතුණි. ඒ සඳහා බීජ හිටවන්නට හොඳින් අකුරු ඇඳෙන පෑනකටද පුළුවන. ඉතිහාසයේ කොහේ හෝ සිදුවූ වරදකට කිසිදු හේතුවකින් තොරව වන්දි ගෙවන එකී කාන්තාව පිළිබඳ මා තුළ හටගත්තේ අසීමිත අනුකම්පාවකි.

"කමලනී" නම් ඇගේ දියණිය ඊට වසර තුනකට පමණ පෙරදී මරාගෙන මැරෙන කාන්තාවක ලෙස කොටි සංවිධානයට බැඳී ජීවිතය අහිමි කරගත් තැනැත්තියකි. ඇගේ සැමියාද ඒ වන විට ඇයව අතහැර ගොසිනි. අවසානයේ මියගිය තම දියණියගේ එකම දරුවා රැකබලා ගැනීමේ වගකීම පැටවී ඇත්තේ මෙම මහලු මවටය. කිසිවකුගේ හවිහරණක් නොමැතිව වුවද තම මිනිපිරිය හදාවඩා ගනිමින් ඇය ජීවිතයට මුහුණ දෙන්නට දරන වෑයම කොතරම් අගනේදැයි මට සිතුණි. විශේෂයෙන්ම ත්‍රස්තවාදීන් විසින් එවක හමුදාව පිළිබඳ එම ජනතාව තුළ මවා තිබුණේ අතිශය භයානක චිත්‍රයකි. නමුත් හමුදාව මෙවන් මානුෂීය ගති ඇත්තවුන් බව සිය නිවස සාදාදෙන තෙක්ම එකී මහලු කාන්තාවද දැන නොසිටියාය. ඇයට වැඩිපුරම දරාගත නොහැකිව තිබුණේද එයමය.

සැබවින්ම යුද්ධය හමුවේ උපන් ගම්බිම් සේම හදවත්ද වල්බිහිවූ තිබූ සෙයකි. ඒවා ශුද්ධ පවිත්‍ර කොට ගුණදම් පිදෙන යහපත් ශාඛ වගාකළ යුතු නොවේදැයි මට සිතුණි. ඒ සඳහා බීජ හිටවන්නට හොඳින් අකුරු ඇඳෙන පෑනකටද පුළුවන. ඉතිහාසයේ කොහේ හෝ සිදුවූ වරදකට කිසිදු හේතුවකින් තොරව වන්දි ගෙවන එකී කාන්තාව පිළිබඳ මා තුළ හටගත්තේ අසීමිත අනුකම්පාවකි. රාත්‍රියේ කඳවුර වෙත ගිය මා හට නින්ද අහලකටවත් නොපැමිණි ඒ මොහොතේ එම දවස තිස්සේ අත්විඳි එකී හද දවන අත්දැකීම මා අතින් නිදිවර්ජිතව පද වැලකට ගැලපුනේ ඉතිරිටමය.

ඉරාගෙන පපු කුහර දවයි ගිනියම් දුකට
දරාගනු බැහැ ගලන කඳුළු නවතනු කෙලෙස
සොරාගෙන ගියත් දරු යෙනේ මහදෙන් එපිට
පුරා තුන්හිස් පැයේ මැවෙයි නුඹේ රූ නෙතට

එළිපත්තෙ ඉඳන් උඹ කිව කව් ගී ඇසූ
පිළිකන්නෙ කොහොඹ ගහ තාම ඒ වගේමයි
හැමදේම නැතිවෙලා මගේ ළඟ ඉතිරිවුණු
එකම දේ උඹ නොමැති වියෝ දුක විතරමයි

බදා කොටිටය පැදුර තෙමා කඳුළින් වැතිර
නිදා නොනිදා උන්නු දවස් කොතරම් ඇතිද
මැරීගෙන ජීවිතේ යදින මිනිසුන් අතර
මරාගෙන මැරි ලැබූ එක දෙයක් තියනවද

එදා උඹ වෛර බැඳි හමුදාවෙ කොලු රෑන
මෙදා මගෙ පැල්කොපේ ඇටෙච් හැරි හරි පුදුම
අනේ උඹ හිටිය නම් ලොකු දුවේ අද දවස
සත්තමයි පුදන්නෑ ජීවිතේ ඔය විලස

විනේ කළවුන් කවුද කොහෙද අද හිඳින්නේ
අනේ මොන එහෙකටද උඹ විහින් නැතිවුණේ
මරාගෙන මැරුනෙ උඹ එකවරයි කමලිනී
මම තාම මැරි මැරි ඉපදෙනව මගෙ දුවේ

සටහන:
ලුතිනන් කර්නල් සුවිත් වික්‍රම්ද එදිරිසිංහ

"යුද්ධ හමුදාධිපතිතුමන්ගේ ආශිර්වාදය මත ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ රසඥතාවය වෙනුවෙන් උසස් මට්ටමේ චිත්‍රපට ප්‍රදර්ශණය කිරීම අපි ආරම්භ කළා"

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ අධිකරණ අමාත්‍යාංශයේ මාධ්‍ය උපදේශක ආචාර්ය හර්ෂ බී අබේකෝන්

ආචාර්ය හර්ෂ අබේකෝන් මහතා මේ වනවිටත් රාජ්‍ය මාධ්‍ය සේවාවේ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන අතර, ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැලණි විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය හා එම විශ්වවිද්‍යාලයේම අන්තර්ජාතික සම්බන්ධතාවයන් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ඇතුළු තවත් විශ්වවිද්‍යාලයන් රැසක උපාධි අධ්‍යයනයන් නිමකර ඇති ප්‍රාමාණික විද්වතෙකි. එමෙන්ම ඔහු දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශයේ බාහිර කථිකාචාරවරයකු ලෙසද කටයුතු කරයි. දැනට ඔහුගේ මූලිකත්වයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් ආරම්භකර ඇති චිත්‍රපට ප්‍රදර්ශණයන් සම්බන්ධව අළලා ඔහු සමඟින් සිදුකරන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවකින් අනතුරුව මෙම විශේෂාංග ලිපිය "රණවිරුවා" පාඨක ඔබ සැමගේ රසඥතාවය වෙනුවෙන් සම්පාදනය විය.

ප්‍රශ්නය :- ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ රසඥතාවය වෙනුවෙන් චිත්‍රපට ප්‍රදර්ශණය කිරීමට ඔබගේ මූලිකත්වයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කර තිබෙනවා. මේ පිළිබඳව යමක් දැනගන්න කැමතිමි?

පිළිතුර :- ශ්‍රී ලංකාව කියන්නේ අවුරුදු තිහකට අධික කාලයක් යුද්ධයක් සමඟ කටයුතු කරපු රටක්. එදා රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව ජාතික මෙහෙවරක් ඉටු කළා. එදා හමුදාවට මහත් ශක්තියක් වුණේ මේ රටේ මහජනතාව. යුද්ධයේ දරුණුම අවස්ථාවේදී මහජනතාව හමුදාව පැත්තේ සිට ගත්තා. එය උතුරෙත් සිදුවුණා දකුණේත් සිදුවුණා. ලෝකේ හමුදාවක් විදිහට යුද ජයග්‍රහණයක් ලබන අවස්ථාවක ජාතික හමුදාවක් විශාල අභියෝගයන්ට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒත් අපේ හමුදාවේ තිබුන විනය සහ වගකීම නිසා අපි සිදුකළේ මානුෂික මෙහෙයුමක් බව ලෝකය පිළිගත්තා. ඒක ඉතිහාසයේ සිදුවුණු දෙයක් නොවෙයි. හමුදාවෙන් දැනුම අත්දැකීම් පළපුරුද්ද මානුෂික භාවයන් සහ සිවිල් සමාජය ගැන තිබුණ අවබෝධයේ නිසයි ඒ ගෞරවය ලැබුණේ. ඒ ගෞරවය රැකගන්න නම් හමුදාවක් විදියට අපි තවත් ජනතාව වෙනුවෙන් කැපකිරීම් වගකීම් ඉටුකළ යුතුයි.

පශ්චාත් යුද සමයත් හරිම අභියෝගකාරියි. එහිදී මුහුණ දෙන අභියෝග තමා විත්දිතයන් ආරක්ෂා කිරීම, අවතැන් වූවන් යළි පදිංචි කිරීම, සාමය හා සංහිඳියාව කෙරෙහි අලුත් දැක්මක් ඇති කර ගැනීම, සිවිල් ජනතාව දිනා ගැනීම, මේ අභියෝග අපේ රටේ හමුදාවන්ට සාර්ථක ලෙස ජය ගන්න ඉඩකඩ සැලසුණා. මේ කාර්යය ඉතිහාසයේ ඇති වුණ දෙයක් නොවේ. ත්‍රිවිධ හමුදාවට සිවිල් පරිපාලන කටයුතු පිළිබඳව තිබූ දැනුම පළපුරුද්ද සහ අත්දැකීම් නිසයි ඒ හැකියාව ලැබුණේ. මානව ධර්මතා මත පුනරුජ්ථාපන කාර්යයන් සිදුකරමින් නොමඟ ගියවුන් යළි සමාජ පුරවැසියන් බවට පත් කිරීමත්, පීඩනයට පත් වූවන්ට යම් සහනයක් ලබාදීමත් කැරැලිකරුවන්ට, යුධ සිරකරුවන්ට පොදු සමාව දීමත් ආදී සියල්ලක්ම අපගේ හමුදාවන් අතින් ඉටු වුණා. එවන් හමුදාවක් පිළිබඳව මහජනතාව තුළ විශ්වාසය ඇති කිරීම සඳහා අප කළ යුත්තේ කුමක්ද? කියන

එක අධ්‍යයනය කළ යුතුයි. ලෝකයේ බොහෝ රටවල වෛරය පැතිරවීම මෙන්ම ජාතීන් අතර සමගිය පැතිරවීම සඳහා බොහෝ අවස්ථාවලදී සිනමාව භාවිතා කර තිබුණා. හිට්ලර්ගේ කාලයේ නම් වෛරය පැතිරවීම සඳහා සිනමාව භාවිතා කර තිබුණා, එහෙත් මෑත භාගයේ දී වෛරය සංසිඳවීම මෙන්ම ජාතීන් අතර සමගිය පැතිරවීම සඳහා සිනමාව උපයෝගී කරගැනීමට කදිම නිදසුනක් ලෙස මෙරට නිපදවූ "සරෝජා" චිත්‍රපටය දැක්විය හැකියි. සංස්කෘතික වශයෙන් බොහොම සමාන ජාතියක් වන සිංහල දෙමළ ජාතික සංහිඳියාව සිනමා මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමේ හැකියාව තියෙනවා. අපේ මේ අරමුණ වන්නේ මානසික ධර්මතා පිළිබඳව මිනිසුන් දැනුවත් කරන ගමන් හමුදාවේ චිත්ත ධෛර්යය මානසික සංවර්ධනය මානව ධර්මතා දැක්මක් සහිතව ජනගත කිරීමේ අරමුණයි. එයින් මේ සමාජයේ යහපත් කිරීම සඳහා හමුදාවෙන් ලැබෙන දායකත්වය රටේ ඉදිරි ගමන් මඟට විශාල ශක්තියක් වෙනවා.

ප්‍රශ්නය :- යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් මේ දක්වා සිදුකරන ලද චිත්‍රපට ප්‍රදර්ශණයන් සම්බන්ධව ඔබට ලැබුණු ප්‍රතිචාර කවරේද? එම ප්‍රතිචාර සම්බන්ධව සහ අදාළ සිනමා ප්‍රදර්ශණයන් වෙනුවෙන් ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ සහභාගීත්වය සම්බන්ධව ඔබ සෑහීමකට පත්වේද?

පිළිතුර :- ඇත්තෙන්ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වශයෙන් ත්‍රිවිධ හමුදාවල චිත්ත ධෛර්යය සහ මානසික සංවර්ධනය වර්ධනය කිරීම සඳහා චිත්‍රපට වැඩසටහන අප ආරම්භ කළේ යුද ක්‍රියාන්විතය උපරිම තලයට පැමිණි කාල පරිච්ඡේදයේදී. එවකට එනම් වර්ෂ 1997 සිට 2000 දක්වා කාලය තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය ලෙස අපි උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින සොල්දාදුවන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීම සඳහා බංකර වලට ගොස් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ වැඩසටහනක් අපි ආරම්භ කළා. එදා ඒ ක්‍රියාන්විත පරිසරයේ සිටම චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් යුද හමුදා කඳවුරුවලට යෑමට අපි කටයුතු කළා. එහිදී ප්‍රදර්ශණය කරන ලද සිනමා පටවලට තේමාව වූයේ වියට්නාම ඇමරිකානු යුද්ධයයි. මෙහිදී හමුදාවල චිත්ත ධෛර්යය වර්ධනය කිරීමට මේ ක්‍රියාන්විත චිත්‍රපට උපකාරී වුණා. මේක අපි එදා කළේ යුද හමුදාවේ මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟින් ඒකාබද්ධවයි. එදා එම වැඩපිළිවෙළ වෙනුවෙන් යුද හමුදාව පැත්තෙන් නායකත්වය දුන්නේ ත්‍රිශේඩියර් ජයසුන්දරයි. එමෙන්ම ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පැත්තෙන් එය මා සංවිධානය කළා. එදා හමුදාවේ බොහෝ පිරිසක් යුද්දෙ දරුණුතම අවස්ථාවේදීත් නිර්භීතව හා අධිෂ්ඨානශීලීව සතුරා පරාජය කිරීම සඳහා ශක්තිමත් ව ඉදිරියට ගියා. මේවට ධෛර්යය දෙන්න තමයි අපි එදා යුද චිත්‍රපට ප්‍රදර්ශනය කළේ. අපි 2017 දී යළි ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය ආරම්භ කළා. ඒ අනුව මේ වන විට පුරා අවුරුදු හතරකට ආසන්න කාලසීමාවක් තුළ සෑම මසකට වරක්ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු සෙසුනිලයන්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීමේ අභිලාශයෙන් ලොව ඉතා උසස් මට්ටමේ සම්මානයට පාත්‍ර වූ විශේෂ සිනමා කෘතීන් මෙන්ම යුද විරෝධී සහ මානව ධර්මතාවයන් සහිත සත්‍ය සිදුවීම් අළලා නිර්මාණය වූ විශිෂ්ඨ ගණයේ සිනමා නිර්මාණ ප්‍රදර්ශනය කරන අතරතුර ආචාර්යවරුන් හා මහාචාර්යවරුන් ඇතුළු සිනමාවේ ප්‍රවීණයන් හා සාහිත්‍යවේදීන් සම්බන්ධ කරගනිමින් සිනමා කතිකාවතක්ද අප ආරම්භ කළා. යුද්ධ හමුදාධිපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාධිපතිවරුන්ගේ පූර්ණ ආශිර්වාදය හා අනුමැතිය මත ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් තුන්සියයකට ආසන්න පිරිසකට සෑම මසකට වරක්ම මෙවැනි විශ්ව සම්භාව්‍ය සිනමා කෘතියක් ප්‍රදර්ශනය කරනවා. මේක හමුදාව පැත්තෙන් ඉතාම ජනප්‍රිය වැඩසටහනක්. මේ වැඩසටහන ඉතාමත්ම සාර්ථකයි.

ප්‍රශ්නය :- වසර 30කට නොඅඩු කාලසීමාවක් පුරා මෙරට පැවැති යුද්ධයේ සැබෑ සිදුවීම් මෙන්ම යුද්ධයට සක්‍රියව දායකත්වය දැක් වූ සැබෑ රණවිරුවන්ගේ කථා පුවත් තේමා කරගත් චිත්‍රපට මෙරට නිපදවුනේ ඉතා අල්ප වශයෙන්, ඔබ මේ මතය හා එකඟද?

පිළිතුර :- අපේ රටේ සිනමා කර්මාන්තය පිළිබඳව විචාරාත්මකව යමක් පැහැදිලි කරනවා නම් අපේ රටේ සිනමාව ලෝක දියුණු රටවල සිනමාවත් සමඟ සංසන්දනය කිරීමට බැහැ. හොලිවුඩ්, බොලිවුඩ්, යුරෝපීය ආසියාතික දකුණු ආසියාතික වශයෙන් ගත්තත් අපේ රටේ සිනමා කර්මාන්තය තිබෙන්නේ ඉතාම පහළ තැනක යුරෝපය හා ආසියාව තුළ ඇතිවූ ප්‍රබල වෙනස්කම් සමඟින් සිනමාවේ ඇති වූ දියුණු ප්‍රවණතාවයන්

හොලිවුඩ් චිත්‍රපට අධ්‍යක්ෂ ස්ටීවන් ස්පිල්බර්ග් "ඉන්දියානා ජෝන්ස් ඇන්ඩ් ද ටෙම්පල් ඔෆ් දූම්" චිත්‍රපටයේ රූපගත කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී මෙරට චිත්‍රපට අධ්‍යක්ෂ නිහල් ජයමන්න හමුවූ අවස්ථාව.

"ඉන්දියානා ජෝන්ස් ඇන්ඩ් ද ටෙම්පල් ඔෆ් දූම්" චිත්‍රපටයේ ප්‍රධාන චරිතය නිරූපණය කළ හොලිවුඩ් නළු හැරිසන් ෆෝඩ්හි කොළඹ හිල්ටන්හි හැවත් හොටලයේ ලංකාවට පැමිණි අවස්ථාව. (1983 වර්ෂ)

වන ඉතාලි නව තාත්විකවාදය, ප්‍රංශ නව රැල්ල, ආදී න්‍යායාත්මක මූලධර්ම වල කිසිදු ආභාසයක් අවාසනාවකට මෙන් ශ්‍රී ලාංකික සිනමාවට ලැබුනේ නැහැ. අපේ රටේ සිනමා කර්මාන්තය ආරම්භ වෙන්නේම දකුණු ඉන්දියානු ආභාසයත් සමඟිනුයි. එය හුදෙක් සරුව පිත්තල සිනමාවක්. කොටින්ම කියතොත් බයිස්කෝප් සිනමාවක්. ආසියාවේ යුරෝපයේ ඇතිවෙච්චි යථාර්ථවාදී සිනමා කලාවේ බලපෑම

ජාතික නිලුපට සංස්ථා ශ්‍රවණාගාරයේදී ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් නිලුපට ප්‍රදර්ශණයක් පැවැත්වූ අවස්ථාව.

සහ ආශාසයන් අපේ රටට ලැබීමට වැඩි කාලසීමාවක් ගත වුණා. අදටත් අපේ සිනමාව තියෙන්නෙ බොහොම දුප්පත් තැනක. වසරකට චිත්‍රපට හතළිහක් නිපද වුණත් ඒවා ප්‍රදර්ශනය කර ගැනීමට තරම් ප්‍රමාණවත් සිනමා ශාලා පහසුකම් මේ රට තුළ නෑ. සිනමා ශාලා 450 කට අධික සංඛ්‍යාවක් තිබ්බ රටේ අද තියෙන්නේ සිනමා ශාලා හැටකටත් වඩා අඩු සංඛ්‍යාවක් අප රට සිනමා ප්‍රේක්ෂකයා අද සිනමා ශාලාවෙන් ඈත් වෙලා. අද අපි ඉන්නේ එවැනි අර්බුදයක.

නමුත් ලෝක සිනමාවේ එසේ වෙලා නැහැ. විශේෂයෙන් ඉන්දියාවේ කොලිවුඩ් සිනමාව හින්දි, කන්නඩ, බෙංගාල්, කේරල මලයාලම්, බෙන්ගාලි, තෙළිඟු වැනි සිනමාවන්හි ප්‍රබලතාවය දිනෙන් දින ඉහළ යනවා. එම ප්‍රාන්තයන්හි වසරකට චිත්‍රපට තුන්සියයකට එහා නිපදවෙනවා. දකුණු කොරියාව ඉරානය, ජපානය වැනි රටවල සිනමාව දිනෙන් දින ප්‍රබල මට්ටමකට පත් වෙනවා. එනමුත් අපේ රටේ සිනමා කර්මාන්තය දවසෙන් දවස ඇද වැටෙනවා. ඒ නිසාම සිනමාවේ යථාර්ථවාදී ගුණය සිනමාවේ පර්යේෂණාත්මක හා ගවේෂණාත්මක අත්දැකීම්, සමාජය පිළිබඳ පර්යේෂණ මිනිසුන් පිළිබඳ පර්යේෂණ අපේ කිසිවක් සැබෑ සිනමා කෘතීන් බවට පත් වන්නේ නැහැ. මේක අප රටේ සිනමාව මුහුණදී තිබෙන බරපතළ අර්බුදයක්. මේ නිසාම නිසාම කලාත්මක යථාර්ථවාදී විශිෂ්ට නිර්මාණයන් අපේ රටේ සිනමාවේ කිහි වෙන්නේ කලාතුරකින්. ලෝක සිනමාව තුළ යුදවාදී යුද විරෝධී මානව අත්දැකීම් මානව පර්යේෂණ සත්‍ය සිදුවීම්. මේ සියල්ල සිනමාව තුළ ප්‍රතිනිර්මාණය වෙනවා. ඒත් අපේ රටේ තත්ත්වය ඉතා වෙනස්. අපේ රටේ හොඳ සිනමා කෘති නිර්මාණය වීම ඉතාමත්ම අඩුයි. මෙයත් මෙරට ප්‍රේක්ෂකයන්ගේ රසාස්වාදය වැඩි දියුණු වීමට බෙහෙවින්ම බලපාන කරුණක්.

ප්‍රශ්ණය :- ලොව අනෙකුත් රටවල ඇති අනෙකුත් සිනමාවන් හා සංසන්දනාත්මකව බැලූකල මෙරට සිනමාව සහ එයට සම්බන්ධ සිනමා ශිල්පීන් හා කාර්මික ශිල්පීන් වෘත්තීය මට්ටමින් කටයුතු කරන බවක් දක්නට ලැබෙන්නේ නැහැ. ඇතැම් සිනමා ශිල්පීන්ට සිනමා නිර්මාණයන්ට දායකවීමට සිදුවන්නේ වෙනත් වෘත්තීයක නියැලෙන ගමනුයි. මේ සම්බන්ධව ඔබට පැවසීමට ඇත්තේ කුමක්ද?

පිළිතුර :- ශ්‍රී ලාංකිකයෝ සිනමා ශිල්පීන්ට කාර්මික ශිල්පීන්ට විදේශීය සිනමා කෘති නිෂ්පාදන කණ්ඩායම් සමඟ වැඩ කිරීමට හැකිවීම ශ්‍රී ලංකාවේ සිනමා කර්මාන්තයට සුබවාදී පියවරක්. හැබේ පනහේ දශකවල ලෝකයේ ප්‍රබල සිනමා සමාගම් ශ්‍රී ලංකාවේ රූගත කිරීම සඳහා තෝරා ගැනීමත් සමඟ මෙරට බොහෝ සිනමා ශිල්පීන්ට විදේශීය නිෂ්පාදන කණ්ඩායම සමඟ කටයුතු කිරීමට හැකිවීමෙන් ඔවුන්ගේ අත්දැකීම් දැනුම කුසලතා ජාත්‍යන්තරය සමඟ බෙදා හදා ගැනීමට ලැබුණු අවස්ථාව සිනමාව දියුණු වීමට එක් හේතුවක් දැනට ශ්‍රී ලංකාවේ ඇති ෆිල්ම් ලොකේෂන් සර්විසස් පුද්ගලික (Film Location Services Pvt Ltd) සමාගමේ සභාපති සහ ප්‍රවීණ සිනමාවේදී චන්දුන් රත්නම් මහතාට ජාත්‍යන්තර සිනමාවේ ප්‍රවීණ සිනමා අධ්‍යක්ෂවරුන්වන් ඩේවිඩ් ලීන්, ස්ටීවන් ස්පිල්බර්ග් මෙන්ම හොලිවුඩ් ජාත්‍යන්තර සිනමා නළුවන් වන හැරිසන් ෆෝර්ඩ්, බෙන් කින්ග්ස්ලි, බෙන් ක්‍රොස් වැනි සිනමා ශිල්පීන් සමඟ කටයුතු කරමින් සිනමාපට නිෂ්පාදනය කිරීමේ අවස්ථාවන්ට දායක වීමට හැකි වුණා. එය අප රටේ සිනමා අධ්‍යක්ෂවරයකුට හා කාර්මික ශිල්පීන්ට විදේශ සිනමා කරුවන්ගේ අත්දැකීම් ලබා ගැනීමට ලැබුණු අනගි අවස්ථාවක් වශයෙන් සැලකිය හැකියි.

ප්‍රශ්ණය :- ඔබගේ දැක්මට අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් සංවිධානය කරනු ලබන අදාළ සිනමා දර්ශණයන් ඔවුන්ගේ වෘත්තීය එලදායීත්වයට දායකවනුයේ කෙසේද?

පිළිතුර :- මම අර මුලින්ම කිව්වා වගේ හමුදාවේ චිත්ත ධෛර්යය සහ මානසික සංවර්ධනය දියුණු කිරීම සඳහා තෝරාගත් සම්භාව්‍ය චිත්‍රපට ප්‍රදර්ශනය තුළ හමුදා සෙබළුන්ට ජීවිතය හා සමාජය ගැන දැනගන්න ජීවිතයේ අභ්‍යන්තරික ක්‍රියාකාරීත්වය ජීවිතයේ යටි පෙළ අරුත, මානසික හැඟීම්, දැනීම් මානව ධර්මතා පිළිබඳ පිළිබඳ ව සමාලෝචනය කිරීමට සාකච්ඡා කිරීමට තමයි අපි මේ වේදිකාව නිර්මාණය කර ගත්තේ මේ තුළින් හමුදාවේ ඉහළම නිලධාරීන්ගෙ සිට සෙසු නිලයන් දක්වා බොහෝ පිරිසක් සහභාගී වෙනවා ඔවුන් මේ චිත්‍රපට ප්‍රදර්ශනය තුළින් ජීවිතයට අලුතෙන් දැනුමක් එක්කර ගන්නවා. අලුතෙන් යමක් සිතනවා. ඒක ජනමාධ්‍ය අමාත්‍යංශය පැත්තෙන් අපිට විශාල සතුටක්. අපට අවශ්‍ය වෙන්නේ මානව ධර්මතාවලට ගරු කරන, විනයගරුක අභිමානවත් හමුදාවක් ඒ සඳහා අපි ආකල්පමය වශයෙන් හොඳ පණිවිඩයක් ඔවුන්ට ලබා දෙනවා. ඒක අපේ හමුදාව ඉහළින් ඔසවා තබන්න අපට ලැබුණු අවස්ථාවක්.

සංවාද සවහනය :-
ශ්‍රීනිහාන් දුමින්දු පෙතෙරුන්,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

මානසික නිරෝගීතාවයෙන් තොර

කායික සැපතක් නැත

දුක් වේදනා හමුවේ නොසැලෙන මනස

ජීවිතයේ වේදනා හා පීඩා විඳීම ඇතිවන්නේ තෘෂ්ණාව හේතුකොටගෙන බවත්, එය නිමාකළ හැක්කේ උතුම් ආර්යඅෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් බවත් බුදුරජාණන් වහන්සේ අවබෝධකර ගත්හ. මෙම උතුම් මාර්ගය අනුගමනය කිරීමෙන් ජීවිතයේ දුක, වේදනාව හා පීඩාව පරිසමාප්ත වශයෙන්ම අවසාන කළහැකි බව උන්වහන්සේ පසක් කරගත්හ. එසේම තවදුරටත් බුදුන් අවබෝධ කරගත්තේ ජීවිතයේ දුක, පීඩාව මෙන්ම සතුට, ප්‍රීතිය නිර්මාණය කරගනු ලබන්නේද තමා විසින්ම බවයි.

දුක් වේදනාව හා මානසික පීඩාවලින් තොර ජීවිතයක් මිහිපිට නැත. දුක් වේදනා හෝ මානසික පීඩාවලට ලක්වන ප්‍රධාන හේතුව ලෙස දැසිය හැක්කේ අප ජීවිතයේ යාථාර්ථයට මුහුණදීම ප්‍රතික්ෂේප කිරීමයි. ඒ අනුව වයසට යාම, ජරාවට පත්වීම, අවසානයේ මරණය වැනි ජීවිතයේ පොදු සත්‍යයන් පිළිගැනීමට අකමැති වීම හේතුවෙන් වඩාත් ප්‍රබල ලෙස අප වේදනාවට හා ජීවිතයේ පීඩාවට පත්වේ.

ඕනෑම ජීවිතකාල පරිච්ඡේදය තුළදී පුද්ගලයන් මොනතරම් වේදනාවට හා පීඩාවට පත්වන්නේද යන්න පිළිබඳව උදාහරණයක් ලෙස ජර්මනියේ ශ්‍රේෂ්ඨ කවියකු හා නාට්‍ය දාර්ශනිකයකු වූ ගෝතේ වරක් පවසා ඇත්තේ තමාගේ ජීවිත කාලය තුළදී සැබෑ සතුටකින් ගතකළ සිය අවස්ථාවන් ගණන්කර එකතු කළහොත් ඒ සියල්ලෝම එකතුව වශයෙන් දැක්විය හැක්කේ සති දෙකකටත් අඩු කාලයක් බවයි. මෙයින් අදහස් වන්නේ ඕනෑම පුද්ගලයකු තම ජීවිත පුරාම සුළු සතුටක් ලබමින් ඉතිරි මුළු කාලය දුකෙන්, වේදනාවෙන් හා කනස්සල්ලෙන් ගතකරන බවයි.

ජීවිතයේ තමන් මුහුණපාන සිය ගැටළු හා දුක් ගැහැට මුදල් මගින් විසඳාගත හැකියැයි වැරදි සහගත අදහස් ඇති කරගෙන සිටින පුද්ගලයන්ද ඕනෑ තරම් සමාජයේ සිටිති. "සල්ලි තියෙනවනම් මොනව කරන්න බැරිද" ඔවුන්ගේ අදහසයි. එහෙත් පමණ ඉක්මවූ අධික ධනය සතුට ලබාදෙන දෙයක් නොවන බවත් එය අසහනය හා සංකාව වැඩිකරන මූලාශ්‍රයක් බවත් අවබෝධ වන විට මිනිසුන් විනාශයට පත්වී අවසන්ය. අප සමාජයේ සුව පහසු ජීවිතයක් ගත කිරීමට මුදල් අවශ්‍ය නමුත් එය පුද්ගල ගැටළු විසඳන්නේ නැත. ඒ වෙනුවට මුදල් අලුතින් ප්‍රශ්න නිර්මාණය කිරීමටද කටයුතු කරයි.

අපගේ ජීවිත කාලය පුරාවටම වේදනාවෙන් හා මානසික පීඩාවක් ඇතිවීම ස්වභාවිකය. එහෙත් සමාජයේ සිදුවන සිදුවීම් දෙස විමර්ෂණාත්මකව බැලීමේදී පැහැදිලි වන්නේ මෙම දුක් දොම්නස් දරාගැනීමේ හැකියාව පුද්ගලයාගෙන් තවත් පුද්ගලයකුට වෙනස්වන බවයි. ඇතැම් පුද්ගලයන්ට දරාගත හැකි වේදනාවන් හා පීඩාවන් තවත් පුද්ගලයකුට දරා ගැනීමට නොහැක. ඒ සඳහා ශක්තියක් නැත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සායනික මනොවිද්‍යාඥ ඒඑච්එස් ප්‍රේමරත්න මහතා තම ලිපියකින් පෙන්වා දෙන ආකාරයට වේදනාවෙන් මිදීමේ ක්‍රමය හුදු ආත්ම සාතනය නොවේ (සියදිවි නසාගැනීම)

ආත්ම සාතනයෙන් තවදුරටත් ගැටළු වැඩිවනවා මිස ගැටළු එකක්වත් නොවිසඳේ. තමාට අත්වූ වේදනාවෙන්, පීඩාවෙන් මිදීමේ පහසු ක්‍රමය ලෙස සියදිවි නසාගැනීම, දුර්වල මානසික තත්වයන් ප්‍රදර්ශණය කෙරෙන ආත්ම ශක්තියෙන් දුබල අභියෝග හමුවේ සැලෙන මානසික තත්වයන් ප්‍රදර්ශනය කිරීමකි.

ජීවිතයේ වේදනාවෙන්, පීඩාවන් විඳදරා ගැනීමේ හා පාලනය කර ගැනීමේ තම හැකියාවන් වර්ධනය කරගැනීමේදී සෘජුවම උපකාරීවන ප්‍රධාන මානසික සාධක දෙකක් මනෝවිද්‍යාඥයින් පෙන්වා දී තිබේ.

වේදනාව නැතිකර ගැනීමේ උපාය උපක්‍රම පිළිබඳව කුසලතා පුහුණුකර තිබීම.

වේදනාව දරා ගැනීමට හැකිවන ලෙස මානසික ශක්තීන් ඉහළ නංවාගැනීම

ඉහත දෙආකාරයෙන්ම තම කුසලතා වර්ධනය කරගෙන ජීවිතයට මුහුණ දෙනවිට එළඹෙන සිය වේදනාවෙන් ලෙහෙසියෙන් ජයගත හැකිය.

තථාගතයානන් වහන්සේ අපට දේශනාකර ඇති පරිදි සියළු අවාසනාවන්ත සිද්ධීන් හා වේදනාවෙන් ඇතිවන්නේ වැරදි සහගත හා නුසුදුසු දේවල් අපට අවශ්‍ය නිසාමය. එනම් භව සම්පත් භුක්ති විඳීමටත්, වැඩි වශයෙන් මුදල් සොයමින්, අලසව කල් ගෙවමින් සිටීමට ඇති කැමැත්ත, තම නිලය හා බලයේ ආධිපත්‍යය අන් පුද්ගලයන් මත හැරවීමට ඇති ආශාව ඒ අතර ප්‍රධාන තැනක් ගනී. එසේම යම් පුද්ගලයකු මියගිය පසු ඔහු හෝ ඇය තවදුරටත් ජීවත්වන්නේ යැයි සිතා සිතින් බැඳ තබාගෙන ජීවත්වීමද තව උදාහරණයකි. ඉහත කී කාරණාවන්ට අදාලව මිනිසුන් තුළ පවතින අධික ආශාව ඔවුන්ගේ ජීවිතයේ පීඩාවන් හා කළකිරුණු තත්වයන් ඇතිකරලීමේ හේතුකාරක වේ.

සෑම දෙනාගේම අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් දේවල් ලෝකය සතුව පවතී. එහෙත් එක් පුද්ගලයකුගේ ලෝභය හා දැඩි ආශාවටත් සෑහෙන තරම් ප්‍රමාණවත් දෙයක් ලෝකය සතුව නැත.

සෑම අයකුගේම ජීවිතයේ වේදනාවෙන් පීඩාකාරී සිදුවීම් හෝ කනස්සල්ල ආදී තත්වයන් නිර්මාණය වීමට මූලික වන ප්‍රධාන කාරණාවක් වන්නේ අපට ලබාගත නොහැකි දේවල් අප සතුකර ගැනීමට පවතින අධික ආශාවන් එමෙන්ම මෙතෙක් අප සතුව දැනටමත් තිබෙන බොහෝ දේවල් අපට යළිත් අවශ්‍ය නොවීමම යන කරුණු මත බව අවබෝධ කර ගැනීමට අපහසු නැත. අපගේ සතුට හා සොම්නස නැතිකරන, අනතුරුව වේදනා පීඩාවන්ට ඇද දමන, අපගේ හැකියාවන් නිර්බල කරන ප්‍රධාන සාධකය වන්නේ මිනිසුන් තුළ පවතින අධික තෘෂ්ණාව හොවත් නොසංසිඳෙන ආශාව බව අවිවාදයෙන් පිළිගන්නට සිදුවේ.

සුප්‍රකට කවියකු වන රඩියාඩ් කිප්ලිං විසින් රචිත පහත දක්වා ඇති පැදි පෙළ තුළින් වැරදි ක්‍රියාවන් වැළැක්වීමේ දැනුමුතුකම්, ගැටළු වලට ධෛර්යය සම්පන්න මුහුණ දිය යුතු අන්දම නොරිස්සුම් සහගත බව සහ අප්‍රසාදය බැහැර කිරීම යන කරුණු ගැන අපට අදහසක් ලබාදී තිබේ.

ඔවුන්ගේ අසාර්ථකත්වය ඇති කරගෙන, ඒ ගැන වරද ඔබ වෙත පටවන විට, ඔබට ඔබේ හිස කෙළින් තබාගෙන සිටිය හැකි නම්,

අනෙක් අය ඔබ ගැන සැකයෙන් යුතුව සිටින විට, ඔබට

සෑම අයකුගේම ජීවිතයේ වේදනාවෙන් පීඩාකාරී සිදුවීම් හෝ කනස්සල්ල ආදී තත්වයන් නිර්මාණය වීමට මූලික වන ප්‍රධාන කාරණාවක් වන්නේ අපට ලබාගත නොහැකි දේවල් අප සතුකර ගැනීමට පවතින අධික ආශාවයි...

ඔබ ගැන විශ්වාසය තබාගෙන සිටිය හැකි නම් සහ ඔවුන්ගේ ඒ සැකය වෙනුවෙන් ඔවුන්ටද අවස්ථාවක් පිරිනැමීමට ඔබට හැකිනම්,

නිසි අවස්ථාව එළඹෙනතුරු ඔබට බලාසිටිය හැකි නම් සහ ඔබ එයින් වෙහෙසට පත් නොවන්නේ නම්, ඔබ හාත්පස හැමදෙසම බොරු පැවසෙන විට එකී බොරුවලින් ඔබ ගණුදෙනු නොකරන්නේ නම්,

ද්වේශ කරනු ලබන අවස්ථාවන්හි ද්වේශය/ක්‍රෝධය නිසා පසු නොබසින්නේ නම්, ඕනෑවට වඩා යහපත් ලෙස විමසා බලන්නේ හෝ ඕනෑවට වඩා ප්‍රඥාවන්ත කතාවෙහි නිරත නොවන්නේ නම්,

ඔබට සිහින දකින්නට හැකි නමුත් ඒ සිහින ඔබේ ස්වාමියා බවට පත්කර නොගන්නේ නම්, ඔබට සිතන්නට හැකි නමුත් ඒ සිතුවිලි ඔබේ අරමුණු හා ඉලක්කය බවට පත්කර නොගන්නේ නම්, එසේම ඔබට ජයග්‍රහණයට මෙන්ම විපත්ති හා ව්‍යසනයන්ට මුහුණදීමට හැකි නම් සහ මේ ප්‍රයෝග කාරකයින් දෙකටම එක හා සමාන ආකාරයකට සලකන්නට හැකි නම්,

ඔබේ සියලු ජයග්‍රහණ එක ගොඩකට රැස් කරන්නට ඔබට හැකිනම් සහ ඒවා ඉහළ පහළ යාමටත්, මුනින් වැටීමට හා ඉහළට විසිවී යාමේ අවදානමටත් මුහුණ පෑමට ඔබට හැකිනම්, ඒ දේවල් හානියට පත්වූ විට ඒවා යළි මුල පටන්ම ආරම්භ කිරීමට ඔබට හැකිනම් සහ ඔබට සිදුවූ අලාභට හා රහසක් වශයෙන් රැකගන්නට ඔබට හැකිනම්,

ඔබ විසින් ප්‍රකාශ කරන ලද සත්‍යයය, වංචනික හා කපටි

පුද්ගලයන් විසින් විකෘති කොට දක්වමින් ඔවුන් මෝඩ හා අඥාන පුද්ගලයන් උගුලට හසුකර ගන්නා බව ඔබට අසන්නට ලැබුණු විට ඔබට එය සිහින් දරාසිටිය හැකි නම්,

බලාපොරොත්තු සුන් වී යාමට හේතු වූ මෙන්ම ඔබ විසින් ජීවිතය ලබාදුන් දේ ගැන අවබෝධ කර ගැනීමටත් ගෙවීගිය දේ යළිත් වැඩ ගැනීමට හැකියාවක් නොමැති මෙවලම් ලෙස සලකා ඒවා වර්ධනය වීම නතර කිරීමටත් ඔබට හැකිනම්,

වෙසෙහට පත්ව තිබෙන ධෛර්යයට, ඔබේ සිතට සහ බලපෑම් ඇතිකරන ශක්තියට, ඒවා විසින් සිදුකළ යුතු සේවය දිගු කලකට පසු වුවද ඉටුකරන ලෙස බලපෑම් කරන්නට ඔබට හැකිනම්,

එසේම කරන්නට යමක් නොමැති විට ඔබේ අභිමතය සහ චිත්ත බලය විසින් එකී උපාංගයන්ට එසේ නවතින ලෙස දන්වූ විටක හැරුණු විට ඒවා ක්‍රියාත්මකව පවත්වා ගැනීමට ඔබට හැකිනම්,

ඔබට ඔබේ යහගුණය පවත්වා ගනිමින් ජන සමූහය සමඟ කතා කළ හැකි නම් හෝ ඔබේ නිරවුල් ප්‍රායෝගිකව නුවණ අභිමිකර නොගෙන, රජුන් යමඟ ඇසුරු කළ හැකි නම්, ඔබේ සතුරන්ට හෝ ඔබ ප්‍රිය කරන මිතුරන්ට, ඔබට හිංසා කිරීමට හෝ ඔබේ සිත් රිදවීමට නොහැකි නම් සහ සෑම මනුෂ්‍යයෙක්ම වැදගත් කොට සලකන්නේ වී නමුදු, ඒ කිසිවෙකුත් පමණට වඩා සැලකිල්ලට නොගන්නේ නම්,

තප්පර 60 ක වැදගත්කමක් සහිත දුර ධාවනයක් තරම් වන සමාව දිය නොහැකි ඉතා කුඩා මොහොතක් වුවත් ඔබට සම්පූර්ණ කරගත හැකි නම්, මේ මහ පොළොවත් එහි ඇති සියලු දේත් ඔබගේය. ඉතින් වැඩි යමක් කුමටද?

මාගේ පුතුනී, ඔබ වනාහි සැබෑ මිනිසෙකි.

කර්නල් එම්.ඩී. පෙරේරා
(විශ්‍රාමික)

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය 73 වන සංවත්සරය සමරයි

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ 73 වන සංවත්සරය එහි බලකාධිපති මේජර් ජෙනරාල් එස්පිඒඅයිඑම්ඩී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 12 වන දින අභිමානවත්ව සමරනු ලැබීය. සංවත්සර දිනයට සමගාමීව පැවති රණවිරුවන් සිහිකිරීමේ උත්සවය, බලකාධිපති වෙත සම්මාන ආචාර පෙළපාළියක් පැවැත්වීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, වැටූ සංදර්ශණය සහ බළලත් නිලධාරී හා සැරයන් නිවස්න රාත්‍රී භෝජන සංග්‍රහය එම වැඩසටහන් අතර සුවිශේෂී විය.



පුදුකුඩ්ඉරිප්පු හිදී සිදුකරනු ලැබූ වීර ක්‍රියාව

හි/65746 කපිතාන් යුජිත්වස් සමරනායක
පීඩබ්ලිව්ඩී ආර්එස්පි
9 වන ගැමුණු හේවා බලඇණිය

මහනලා පරපුරේ වීරධීර අභිමානය දරා උපන් මානවකයකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 9 වන ගැමුණු හේවා බලඇණියේ කපිතාන් උඩහ ගෙදර අමිල සම්පත් සමරනායක හඳුන්වාදිය හැක්කේය.

මාතලේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩස්හිරිය ගමේ උඩහ ගෙදර සිරිල් සමරනායක පියාණන්ට දාව ගල්වැවේ ගෙදර ඇක්මන් විමලසිරි මාතාව 1980 වසරේ වෙසක් මස 31 වන දින අමිල සම්පත් මොලොවට කිහිකළාය.

අමිලට වයස අවුරුදු දෙක ඉක්ම යන්ම ඔහුගේ පියා හදිසි අනතුරකින් සිය ජීවිතයෙන් සමුගත්තේ ඔහුට පිය සෙනෙහස අහිමිකරමිනි. ඉන් අනතුරුව පුංචි අමිල සම්පත් දින සති මාස ගෙවා දමන්නේ බාධක දුක් කම්කටොලු බොහොමයක් මැදිනි.

තම අධ්‍යාපනයෙහි මුල් අත්පොත් අමිල සම්පත් උඩස්හිරිය නන්දන විදුහලෙන් තබන අතර, අනතුරුව ද්විතීය අධ්‍යාපනය සඳහා මාතලේ වීර කැප්පෙටිපොල මැදි විදුහල වෙත ඔහු ප්‍රවිශ්ට වන්නේය. අමිල සම්පත් පාසලේ පළමු කඩඉම වූ අ.පො.ස (සා/පෙළ) ඉහළින් සමත් වූයේ අධ්‍යාපනයේ දෙවන කඩඉම වූ අ.පො.ස (උ/පෙළ) කලා අංශයෙන් හැදිරීම සඳහා යොමුවිය.

ඔහුගේ නෙළිතුඩින් විචිත්‍රවත් වූ විදුහල් පවුර අමිල සම්පත්ගේ කලා හැකියාවන් පිළිබඳ කදිම නිදසුනක් බැව් ඔහුට අකුරු කල ගුරු මාතාවක වන තිළිණී කුමාරරත්න මහත්මිය පැවසුවාය. ආචාරශීලී විනයානුකූල හික්මීම තුළින් සහ තම මව සමඟ ලෙන්ගතු දිවියක් ගත කළ අමිල සම්පත්ගේ සිත දැහැමින් පෝෂණය වීමට ගමේ විහාරස්ථානය වෙත ඇදී ගියේ ඒ ඇසුරින්

දේශමාමක චින්තනය හුරුකර ගැනීම සඳහා විය යුතුය.

ඒ වනවිට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බාහිර උපාධි අපේක්ෂකයකු වශයෙන් ලියාපදිංචි වන අමිල සම්පත්ගේ ජීවිතයේ තීරණාත්මක දිනයක් වර්ෂ 2001 ඇසළ මස 19 වන දින උදාවිය. එදින ඔහු දියතලාව යුද්ධ හමුදා විද්‍ය පීඨයේ කෙඩෙට් නිලධාරි බඳවාගැනීම් පාඨමාලා අංක 54 හි කෙඩෙට් නිලධාරියකු ලෙස ඇතුළුවෙමින් යුද්ධ හමුදා දිවියට අත්පොත තබන්නට විය.

අමිල සම්පත් කෙඩෙට් නිලධාරියකු ලෙස පුහුණුව ලබාගත්තේ තම උපදේශකයන්ගේ දෙනෙත් නිරන්තරයෙන් තමා වෙත යොමුවන අයුරින්මය. ලුතිනන් කර්නල් රාජගුරු බණ්ඩාර තමා යටතේ පුහුණුව ලද කෙඩෙට් නිලධාරි අමිල සම්පත් පිළිබඳ මතකයන් වචනයට පෙරළමින් පැවසුවේ අමිල සම්පත් සෑමවිටම තම බණ්ඩයේ සියලු අභ්‍යාස හා ක්‍රියාකාරකම්වලදී සෙසු කෙඩෙට් නිලධාරීන්ට නායකත්වය හා සහෝදරත්වය වැඩිදියුණු වන අයුරින් ඔවුන් ධෛර්යයමත් කරමින් අභ්‍යාසවල නිරත වූ ශිෂ්‍යයෙක් බවයි. ඔහු පිළිබඳ මතකයන් අවදි කළ පාඨමාලා සගයෙක් වන මේජර් කොඩිකාර පවසා සිටියේ අමිල සම්පත් අපේ පාඨමාලාවේ සිටි දක්ෂතම ඉලක්කයට වෙඩිතබන්නා හා භූමි තරණය පිළිබඳ විශේෂ හැකියා පෙන්වන ලද අයකු බවයි.

එම කාලවකවානුව වනවිට ශ්‍රී ලංකා මාතෘ භූමියේ තැනින් තැන ගලායන රුධිර ගංගා මැද එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කෘරත්වය ව්‍යාප්ත කරමින් සිටියහ. ප්‍රෞඪ හෙළ පරපුරක ලේ උරුමය දරා සිටි අමිල සම්පත් සමරනායක 2003 උදුවප් මස 20 වන දින අධිකාරි ලත් නිලධාරියකු ලෙස සක්‍රීය ආරක්ෂක සේවයට ඒකාත්මික වන්නේ "මට පෙර රට" යන අභිමානාත්මක සිතුවිල්ලෙනි. ගැමුණු හේවා බලකායේ ඒකකයක් වන 9 වන ගැමුණු හේවා බළඇණිය, ලුතිනන් අමිල සම්පත්ගේ සේවයෙන් ගරු බුහුමන් ලබන බළඇණිය වන්නේ එම බළඇණියට තවත් එදිතර ශ්‍රී ලංකා පුත්‍රයකු පිළිබඳ ඉතිහාසයක් ලබාදෙමින් බව නොසිතෙන්නට ඇත. ලුතිනන් අමිල සම්පත් රණවිරුවා, හමුදා දිවියට අවශ්‍ය වෘත්තීය දැනුම ප්‍රවර්ධනය කරනුවස් කෙඩෙට් නිලධාරි පාඨමාලාවට අමතරව දේශීය තරුණ නිලධාරි පාඨමාලාවද සාර්ථකව හදාරා නිමකිරීමට සමත්විය.

ලුතිනන් අමිල සම්පත් එහිදී සිය ජීවිතය ගැනද නොතකමින් සැබෑ නායකයකුගේ ගති ලක්ෂණ විදහාපාමින් තම සහෝදර සෙබළුන්ගේ ජීවිත රැකගැනීමේ පරම අදිටනින් එකවරම සතුරු බංකර් වෙත කඩා පනිමින් ඉතා ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළේය. එහෙත් ලක්මවගේ දෙනෙතට කඳුළු බිඳක් එක්කරමින් ත්‍රස්තයන් එල්ලකළ සිත්පිත් නොමැති ලේ පිපාසිත වෙඩි උණ්ඩයක් ලුතිනන් අමිල සම්පත් සමරනායකගේ පපුව සොයා ආවේ මෙම අභිමානවත් රණවීරුවාට ඉතා දරුණු ලෙස තුවාල කරමින්ය.

වර්ෂ 2009 ජනවාරි මස 24 වන දින ජීවන ගමනේ සහකාරිය ලෙස කේ එච් ගයානි නන්දසිරි මෙනෙවිය අමිල තම ජීවිතයට එක්කර ගත්තේය. ලුතිනන් අමිල සම්පත් විවාහයෙන් දින කිහිපයකට පසු වහාම ක්‍රියාන්විත සේවයට වාර්තා කළේ තම ජීවිතයට ආලෝකය ගෙනදෙන ආදරණීය තිරිඳගේද ආශීර්වාදය සමඟිනි.

වර්ෂ 2009 ඇරඹෙන්නේ, උතුරු තල් අරණේ මන්නාරම් වැලි කතරෙන් සටනට බට අනෙකුත් ප්‍රහාරක බළඇණි සමඟ 9 වන ගැමුණු හේවා බළඇණි හේවායින් පිළිවෙළින් මන්නාරම් සහල්නැලිය සිට වෙඩිතලහිව්, වෙල්ලන්කුලම, නච්චිකුඩා සතුරු බළමුළු විනාශකර සිංහ කොඩිය පෙරටුකර ගනිමින් සතුරාගේ අවසාන බලකොටුව වූ කිලිනොච්චි හා මුලතිව් බලා විජයග්‍රාහී ගමන් ඇරඹූ කාලය සමඟය. 2009 මාර්තු මස 01 වන දින ලුතිනන් අමිල සම්පත් තම බළඇණියේ "සී" කණ්ඩායමේ නිලධාරී අණදෙන වශයෙන් රාජකාරි කරමින් සිටියදී පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ සතුරාගේ දැඩි ප්‍රහාරයකට ලක්වෙමින් සිටි තම කණ්ඩායමේ සහෝදර සෙබළුන් බේරාගැනීම සඳහා සෙසු පිරිස මෙහෙයවා සාමූහිකව එල්ල කරන ලද විස්මයජනක ප්‍රහාරය ඇගයීම් වස් ඔහුට විරත්වයේ පළමු පදක්කම වන "රණශූර" පදක්කම පුදනු ලැබිය. මෙකී කාලය තුළ දැක්වූ ජාතිමාමක දායකත්වය වෙනුවෙන් "පූර්ණභූමි" පදක්කම, "උතුරු නැගෙනහිර සංග්‍රාමික" පදක්කම හා "වන්නි මානුෂීය මෙහෙයුම්" පදක්කම්වලින්ද මොහු පිදුම් ලැබිය. ලැබූ සම්මානවලින් හා පදක්කම්වලින් තව තවත් ජාතිමාමක ප්‍රේමයෙන් සිත කය පුබුදුවාගත් ලුතිනන් අමිල සම්පත් රණවිරුවා සටන්කිම ජයගැනීම මිස අන් කිසිවක් නොමැති බව සිතමින් සටන්කිම තුළ දිගටම රැඳී සිටියේය.

වර්ෂ 2009 මැදින් මස 02 වන දිනය උදාවිය. මැදින් මාසයේ අඳුරු අභාග්‍යය උතුරුකරයේ ඔබමොබ සැරිසැරුවේය. ඒ සියලු අභියෝග හමුවේ මව්බිම කෙරෙහි කිසිවකින් කිඳිය නොහැකි අසීමිත ප්‍රේමය දරාගනිමින් ලුතිනන් අමිල සම්පත් සමරනායක පුදුකුඩිඉරිප්පු ප්‍රදේශය තුළ ත්‍රස්තවාදීන්ට එරෙහිව තීරණාත්මක සිය සෙබළුන් මෙහෙයවිය. ඒ වනවිට ත්‍රස්තවාදීන් අවසන් සටනට තමන් සතු සියලු ශක්තිය යොදාගනිමින් මුහුණුදෙමින් සිටි අවධියයි.

ලුතිනන් අමිල සම්පත් සිය සෙබළුන් සතුරු කඳවුරු කරා මෙහෙය වූයේ යුද අත්දැකීම් හා මනාව ලැබූ පුහුණුව තුළින් සතුරාගේ ඉදිරි ගමන වලක්වාලීමට ශක්තිමත් ප්‍රාකාරයක් වෙමින්ය. සටන, ක්‍රමක්‍රමයෙන් ඉතා තීරණාත්මක අවධියක් දක්වා විකාශනය වෙමින් පැවතුණි. අපේක්ෂා නොකරන අයුරු අනතුරුදායක ක්‍රියාන්විත උපක්‍රමයන් අනුගමනය කළ විරෝදාර රණවිරුවන් හමුවේ ත්‍රස්තවාදීන්ගේ චිත්ත ධෛර්යය සිඳී ගියේය. අත්වන පරාජය හමුවේ සතුරා වියරුවෙන් ඉදිරියට ඇදෙන්නට විය. සතුරු ප්‍රහාර ක්‍රමයෙන් දරුණු විය.

ලුතිනන් අමිල සම්පත් සටන්කිමේ ඉදිරියෙන්ම සිට තම සහෝදර සෙබළුන්ගේ අවිවලින් නික්මෙන උණ්ඩ එක එල්ලේම සතුරන්ගේ පපුව වෙත එල්ල කිරීමට නායකත්වය දෙමින් සැබෑ දේශමාමක පුත්‍රයකු ලෙස සටන මෙහෙයවිය. ලක්මවගේ පහසින් පෝෂණය වූ සෙබළුන් දෙදහස් පන්සිය වසරක ප්‍රෞඪ ඉතිහාසයේ රණශූරත්වය ප්‍රදර්ශනය කරමින් සතුරු ප්‍රහාර හමුවේ ඉදිරියටම ඇදුණි. එම අවස්ථාවේදී සතුරු ප්‍රහාරයන්ට නොබියව මුහුණදෙමින් තම කණ්ඩායමේ සෙබළුන් හට අවශ්‍ය නිසි නායකත්වය සහ මගපෙන්වීම ලබාදෙමින් ඒකක අණදෙන නිලධාරි සමඟ මනාලෙස සම්බන්ධීකරණය වෙමින් එම ප්‍රදේශයේ සතුරු බලය මුළුමනින්ම විනාශකර ත්‍රස්තවාදී භූමිය අත්පත් කරගැනීමට ක්‍රියා කළේය. මෙම බංකර් පද්ධතිය සහිත භූමිය අල්ලාගැනීමේ අවසන් සටන දෙපිරිස අතර ඉතා දිගු වේලාවක් පැවතී අතර, එහි උච්ඡතම අවස්ථාවට පැමිණීමෙන් පසු අදාළ නිලධාරි සිය ජීවිතය ගැනද නොතකමින් සිය රාජකාරි නිමාවෙන් ඔබ්බට ගොස් සැබෑ නායකයකුගේ ගති ලක්ෂණ විදහාපාමින් තම සහෝදර සෙබළුන්ගේ ජීවිත රැකගැනීමේ පරම අදිටනින් එකවරම සතුරු බංකර් වෙත කඩා පනිමින් ඉතා ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළේය. එහෙත් ලක්මවගේ දෙනෙතට කඳුළු බිඳක් එක්කරමින් ත්‍රස්තයන් එල්ලකළ සිත්පිත් නොමැති ලේ පිපාසිත වෙඩි උණ්ඩයක් ලුතිනන් අමිල සම්පත් සමරනායකගේ පපුව සොයා ආයේ මෙම අභිමානවත් රණවීරුවා හට ඉතා දරුණු ලෙස තුවාල කරමින්ය.

තමා ලද බරපතල තුවාල හේතුවෙන් සටන්කිම හැරගියහොත් තම සහෝදර සගයන්ට සිදුවන මානසික විඳවැටීම පිළිබඳ පමණක් මෙනෙහි කළ ලුතිනන් අමිල සම්පත් තවදුරටත් සටන්කිමේ රැඳී සිටිමින් තම බළමුළුවට ශක්තියක් වීමට තීරණය කළේ හුදු ජාති මාමකත්වයෙන් ඔබ්බට ගිය දෑ අභිමානය නිසාමය.

තමන්ගේ මග පෙන්වීම හමුවේ සටන් වදින බළඇණි සගයන්ගේ ආත්ම ශක්තිය බිඳ නොවැටී පවත්වා ගැනීම උදෙසා තම ජීවිතය පිළිබඳ පවතින වගකීම් කොන්දේසි බැහැරකර උත්තම තීන්දුවකට ලුතිනන් අමිල සම්පත් සමරායක එළඹුණි. යුද්ධකිමේදී ලත් බරපතල තුවාල සඳහා ප්‍රතිකාර ලබාගැනීමට යුද්ධකිමෙන් ඉවත් නොවී තමන්ගේ නායකත්වය හා අණදීම යටතේ හෙට දිනත් ලක්කිම රැකිමට සැරසී සිටින යුද සෙබළුන්ගේ ජීවිත රැකීමේ උත්තම කැපවීම වෙනුවෙන් ලුතිනන් අමිල සම්පත් සමරනායකගේ රණවීරු ආත්මය සදාකාලික නිහඬ විය. තවද, මෙම රණවීරුවාගේ සේවය ඇගයීමවත්, ඔහු ලුතිනන් නිලයේ සිට කපිතාන් නිලය දක්වා උසස් කරන ලද්දේ ඔහුට කරනු ලබන ගෞරවයක් වශයෙනි.

තම සෙබළුන්ට නිවැරදි නායකත්වය සපයමින් සතුරාගේ එල්ල වූ ප්‍රතිප්‍රහාරයන් හමුවේ දරුණු ලෙස තුවාල ලැබීමෙන් පසුවත් සටන්කිමෙන් ඉවතට නොගොස් රටේත් සිය සෙබළුන්ගේ චිත්ත ධෛර්යය ඇති කරමින් සිටි මොහොතේ සටන්කිමේදීම සිය අවසන් හුස්ම හෙළමින් සිදුකළ අද්විතීය හා අති උදාර සේවය අගයමින් වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් යුද සෙබළකු වෙත ජාතියෙන් පිදිය හැකි උසස්ම සම්මානය වන පරම වීර විභූෂණය පුදා උපහාර දක්වන ලදී.

කපිතාන් අමිල සම්පත් සමරනායක වැනි වීරුවනගේ අප්‍රතිහත කැපකිරීම් සහ වීරත්වය හමුවේ එල්ටිටිඊ ත්‍රස්තවාදය මුළුමනින්ම ලක් පොළවෙන් වැනසී ගියේය. මාතෘ භූමියට අභිමානවත් නිදහසක සිහිල් සුළං රැළි ගලා ආවේය.

ඒ සිහිල් සුළං රැළි තුළින් තම ජීවිතය පිළිබඳ සියලු අපේක්ෂාවන් මව්කිම ඉදිරියේ අත්හළ උත්තම මානවයන්ගේ මතක පණිවුඩයද මව්කිම පුරා විසිර ගියේය. ඒ උත්තම මිනිසුන්ගේ කැපකිරීම හමුවේ නිදහස් රටක කලු මල් පිබිදුනි. කපිතාන් සමරනායක සිහිවීම පිණිස ඔහු මිහිදන් කළ පලාපත්වල වහකෝපිවේ සුසාන භූමියේ සොහොන්කොතක් ඉදිකර පවුලේ ඥාතීන් හා ගම්මාවසීන් විසින් ඔහුට ගරු බුහුමන් දක්වනු ලබයි.

එසේ ජාතියට අභීත රණවීරුවකු ලෙස තම එකම පුත්‍රයා කැපකිරීමෙන් සිදුකලා වූ ජාතික මෙහෙවර උදෙසා දැනට ජීවතුන් අතර සිටින කපිතාන් අමිල සම්පත් සමරනායකගේ මැණියන් වන තල්වැටේ ගෙදර ඇක්මන් විමලසිරි මහත්මිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් "උත්තම පූජා" උපහාරයෙන්ද පුදනු ලද්දේය.

සටහන :-
"උත්තමාචාර්ය" ගුණවර්ධන අසුන්කි...

ක්‍රීඩා වින්න්

4 වන දකුණු ආසියානු "සේපක් වැක්රෝ" තරගාවලිය

ශ්‍රී ලංකා ජාතික "සේපක් වැක්රෝ" (*Sepak Takraw*) සංචිතය නියෝජනය කරමින් යුද්ධ හමුදාවේ ක්‍රීඩකයින් 5 දෙනකු සහ ක්‍රීඩිකාවන් 3 දෙනෙක් බංගලාදේශයේ ඩකා නුවර පැවැති 4 වන දකුණු ආසියානු "සේපක් වැක්රෝ" තරඟයට සහභාගී වූ අතර එහිදී, එම ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ලෝකඩ පදක්කම් 5 ක් දිනාගැනීමට සමත් වූහ. යුද්ධ හමුදා සෙපක් තක්රෝ කමිටුවේ සභාපති ලිගේඩියර් කෝල්යූ කොඩිකුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී විසින් යුද්ධ හමුදා "සේපක් වැක්රෝ" ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය මඟපෙන්වීම්, උපදෙස් සහ පරිපාලන පහසුකම් ලබාදෙන ලදී.

6 වන දකුණු ආසියානු කරාතේ ශූරතාවලියේ ලෝකඩ පදක්කම යුද්ධ හමුදාවට

6 වන දකුණු ආසියානු කරාතේ ශූරතාවලිය සඳහා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගී වූ 2 ශ්‍රීලංජාආබමු ඒකකයට අයත් සෙ/කිව්116191 සාජෙ සෙනරත් එච්ඩබ්ලිව්එච් අවුරුදු 21 න් පහල කි-ග්‍රෑම් 60 ට අඩු කුමිතේ කරාතේ ලෝකඩ පදක්කම හිමිකරගැනීමට සමත් විය.

59 වැනි ජාතික ජූඩෝ ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට

59 වැනි ජාතික ජූඩෝ ශූරතාවලිය නාවලපිටිය ජයසිලක ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් ජනවාරි 6 වන දින සිට 8 වන දින දක්වා පැවැත්විණ. එහි පිරිමි සහ කාන්තා යන දෙඅංශයෙහි සමස්ත ශූරතාවය හිමිකර ගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ. ශ්‍රී ලංකා ජූඩෝ සංගමය විසින් සංවිධානය කරන ලද මෙම තරඟාවලිය සඳහා දීපව්‍යාප්ත ජූඩෝ කණ්ඩායම් 39 ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 382 ක් සහභාගී වූ අතර, එහි අනුශූරතාව හිමිවූයේ ශ්‍රී ලංකා ගුවන් හමුදා කණ්ඩායමටය.

ජාතික කෙටි දුර පිහිනුම් ශූරතාවලිය - 2022

ජාතික කෙටි දුර පිහිනුම් ශූරතාවලිය - 2022, කොළඹ ඉසිපතන විද්‍යාලයීය පිහිනුම් තටාකයේදී ඉකුත් දෙසැම්බර් මස 26 - 30 යන දිනයන්හිදී පැවැත්විණ. ඒ සඳහා දිවයිනේ පාසල් සහ ක්‍රීඩා සමාජ 49 ක් නියෝජනය කරමින් පිහිනුම් ක්‍රීඩකයින් 378 දෙනකු තරඟ කරනු ලැබීය. එහිදී, යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩකයින් රත් පදක්කම් 7 ක්, රිදී පදක්කම් 12 ක් සහ ලෝකඩ පදක්කම් 3 ක් සමඟින් පිරිමි අංශය යටතේ අනුශූරතාවය හිමිකර ගත්හ. පිරිමි අංශයේ දක්ෂතම පිහිනුම් ක්‍රීඩකයා ලෙස ගජබා රෙජිමේන්තුවේ දෙවන ලුතිනන් එච්ඩීඒ පිරිස් තෙරී පත්විය.

ආරක්ෂක සේවා පාපැදි ශූරතාව - 2023, ජය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සංවිධානය කරන ලද ආරක්ෂක සේවා පාපැදි ශූරතාව - 2023 ඉකුත් ජනවාරි 08 වන දින කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු පරිශ්‍රය අසලින් ආරම්භ කරන ලදී. එම තරඟාවලියෙහි සමස්ත ශූරතාවය දිනාගැනීමට යුද්ධ හමුදා පාපැදි ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ. දුර කිලෝමීටර් 145 ක්වූ පිරිමි අංශයේ ප්‍රථම සහ දෙවැනි ස්ථාන යුද්ධ හමුදා පාපැදි ක්‍රීඩකයින් හිමිකර ගත් අතර, දුර කිලෝමීටර් 65 ක්වූ කාන්තා අංශයේ දෙවැනි, පස්වැනි සහ අටවැනි ස්ථාන යුද්ධ හමුදා කාන්තා පාපැදි ක්‍රීඩිකාවෝ හිමිකර ගත්හ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට තවත් ක්‍රීඩා ශූරතාවයක්

ඉකුත් ජනවාරි 10 වන දින සිට 13 වන දින දක්වා පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවති 2022 යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කරාතේ තරඟාවලියේදී ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විශිෂ්ට දස්කම් පාමින් සියලුම අංශයන්හි ශූරතාවයන් දිනාගනීමට සමත්විය. එහිදී, පැවති කරාතේ ඉසව්වන්හි 9/8/7 වර්ණ පටි, 6/5/4 වර්ණ පටි, දුඹුරු පටි, කළු පටි සහ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ජයග්‍රහණය ලබාගනිමින් සමස්ත ශූරතාවය දිනාගත්තා ලදී.

අන්තර් සේනාංක බැඩ්මින්ටන් තරඟාවලිය

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බලප්‍රදේශයේ රාජකාරි නියුතු යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) වෙතින් සංවිධානය කරන ලද අන්තර් සේනාංක බැඩ්මින්ටන් තරඟාවලියේ අවසන් මහා තරඟය ඉකුත් දෙසැම්බර් 28 වන දින 3 ඉසේරෙ ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉදිරි නඩත්තු පෙදෙස ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යුඑස්පී එන්ටීසී සහභාගී විය. එහිදී ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), 22, 23 සහ 24 වන පාබල සේනාංක සහ ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) වශයෙන් කණ්ඩායම් 05 ක් තරඟ වැදුණු අතර, එහි සමස්ත ශූරතාවය 23 සේනාංක මූලස්ථාන කණ්ඩායමද, අනුශූරතාවය ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) කණ්ඩායමද හිමිකර ගත්හ.

59 වන පාබල සේනාංක ක්‍රිකට්/වොලිබෝල් තරඟාවලිය

59 වන පාබල සේනාංකයේ 15 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද ක්‍රිකට්/වොලිබෝල් තරඟාවලියේ අවසන් තරඟය ඉකුත් දෙසැම්බර් 31 වන දින එම සේනාංක ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. 59 පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ ප්‍රධානත්වයෙන් සංවිධානය වූ මෙම තරඟාවලියේ ශූරතාවය 12 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව විසින් දිනාගන්නා ලදී.

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අත්පන්දු තරඟාවලිය

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක අත්පන්දු තරඟාවලිය මිරිගම නගරසභා ක්‍රීඩාංගනයේදී පසුගියදා නිමාවට පත්විය. ඉකුත් දෙසැම්බර් 19 වන දින ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවති එහි අවසන් මහා තරඟයේදී 15 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් ශූරතාව දිනාගන්නා ලදී. එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ක්‍රිගේඩියර් එන්පීඑන්ඒ මුතුමාල යූඑස්පී පීඑස්සී ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත කුසලාන පිරිනැමීම සිදුවිය.

වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලු දෙනාට දිරිය, වීරිය,රැකවරණය ලැබේවායි
"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.

54 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

මේජර් සේනරාල්
ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්ව්
එම්එන්ඩීසේනි කියංගොඩ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩීයූ පීඑස්සී

2022 දෙසැම්බර් මස **30** වන
දින සිට

641 වන පාබල බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

බ්‍රිගේඩියර්
ඩීඩීඑල් සොලොන්ගේ
යූඑස්පී

2023 ජනවාරි මස **02** වන
දින සිට

222 වන පාබල බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

බ්‍රිගේඩියර්
එන්එච් මල්සිංහ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී

2023 ජනවාරි මස **02** වන දින
සිට

කාලතුවක්කු බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

කර්නල්
එස්පී මලවරගේ
ආර්එස්පී යූඑස්පී අයිපී

2022 දෙසැම්බර් මස **21** වන
දින සිට

503 වන පාබල බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

කර්නල්
සේඩීඑල්සී විජේනායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී

2022 දෙසැම්බර් මස **10** වන
දින සිට

241 වන පාබල බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

කර්නල්
එල්එස්ඩීඑන් පතිරත්න
ආර්එස්පී යූඑස්පී

2022 නොවැම්බර් මස **26** වන
දින සිට

232 වන පාබල බලසේනාංකේ
බලසේනාධිපති ලෙස

කර්නල්
පේමී පුෂ්පකුමාර
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
පීඑස්සී

2022 දෙසැම්බර් මස **31** වන
දින සිට

අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා
කාර්යාලේ
කර්නල් පාබල හමුදා ලෙස

කර්නල්
එම්ජේ උඩේසේකර
ආර්එස්පී පීඑස්සී

2022 දෙසැම්බර් මස **29** වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම) කර්නල් ප්‍රබාහි ලෙස

කර්නල්
ඩබ්ලිව්එන්ජේ හේමචන්ද්‍ර
ආර්එස්පී පීඑස්සී

2022 දෙසැම්බර් මස **28** වන
දින සිට

21 වන පාබල සේනාංකයේ
කර්නල් (පාලන/ගනාස) ලෙස

කර්නල්
ඩීඩීඩී සේරසිංහ යූඑස්පී

2022 ජනවාරි මස **01** වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) කර්නල් ප්‍රබාහි ලෙස

කර්නල්
එඩබ්ලිව්එම්ඩබ්ලිව්සේඩී
අබේරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී පීඑස්සී

2022 දෙසැම්බර් මස **31** වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම)
කර්නල් (සම්බන්ධීකරණ) ලෙස

කර්නල්
එච්ඒආර්කේ අබේවික්‍රම
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

2022 ජනවාරි මස **04** වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(පාලනය) සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස

කර්නල්
යූඅයි ජයතිලක

2022 දෙසැම්බර් මස 19 වන
දින සිට

කාලතුවක්කු බලසේනාවේ
ප්‍රධානි 1 ලෙස

ලුතිනන් කර්නල්
බීඑටඑස්තේ බස්නායක
ආර්එස්පී ගුණස්පී අයිපී

2022 ජනවාරි මස 05 වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(පාලනය) බානි 1 (පාලන) ලෙස

ලුතිනන් කර්නල්
ආර්ඩීපී ලංකාතිලක ගුණස්පී

2022 දෙසැම්බර් මස 28 වන
දින සිට

2 වන ශ්‍රී ලංකා
රයිෆල් බලකායේ අණදෙන
නිලධාරි ලෙස

ලුතිනන් කර්නල්
එච්ඩබ්ලිව්ගේ
වැලිගෙපොල පීඩබ්ලිව්

2022 දෙසැම්බර් මස 10 වන
දින සිට

යුද්ධ හමුදා පොදුසේවා බලකායේ
ප්‍රධානි 1 ලෙස

ලුතිනන් කර්නල්
ඩීපී රණවීර එල්එස්සී

2022 දෙසැම්බර් මස 08 වන
දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම) සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස

ලුතිනන් කර්නල්
ජේඩීසූරි කුමාර ආර්එස්පී

2022 ජනවාරි මස 10 වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(පාලනය) බානි 1 (ගුණය) ලෙස

ලුතිනන් කර්නල්
යූඩීඩබ්ලිව් සෙනෙවිරත්න

2022 දෙසැම්බර් මස 20 වන
දින සිට

3 වන මළඇණිය
ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
එච්එම්එච්ඩබ් හේරත්
ඩබ්ලිව්ඩබ්ලිව් ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී ගුණස්පී පීඑස්සී

2022 දෙසැම්බර් මස 09 වන
දින සිට

ආරක්ෂක සේනා මූලස්ථානය
(බටහිර)
බානි 1 (පාලන) ලෙස

මේජර්
ජේඩබ්ලිව් මෙන්ඩිස් ගුණස්පී

2022 දෙසැම්බර් මස 23 වන
දින සිට

7 වන යුද්ධ හමුදා සේවා
බලකායේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
ජේඑම්එස්එන් ප්‍රේමරත්න
ගුණස්පී එල්එස්සී

2022 දෙසැම්බර් මස 18 වන
දින සිට

1 වන ශ්‍රී ලංකා
යුද්ධ හමුදා පොදුසේවා බලකායේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
ජේඩබ්ලිව්ජේඑම්
වන්නිආච්චි ගුණස්පී පීඑස්සී

2022 දෙසැම්බර් මස 01 වන
දින සිට

14(සෙවි) මළඇණිය
ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
ජේඩීපී අත්තනායක

2022 දෙසැම්බර් මස 08 වන
දින සිට

8 වන ශ්‍රී ලංකා
ජාතික ආරක්ෂක බලඝණයේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
ඊඩීඑස්සේ දෙනියාය

2022 ජනවාරි මස 05 වන
දින සිට

5(සෙවා) බළඇණිය
ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
ශුවම්ටයි ධර්මසිරි ආර්ඩබ්ලිව්පී

2022 දෙසැම්බර් මස 12 වන
දින සිට

15(සෙවා) ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
එච්ඩීඩබ්ලිව්ස් හිලසරත්න

2022 ජනවාරි මස 06 වන
දින සිට

11(සෙවා) ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරි ලෙස

මේජර්
එසේ හේවගේ පීඑස්සී

2022 දෙසැම්බර් මස 10 වන
දින සිට

4 වන ශ්‍රී ලංකා
විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු
බලකායේ රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

බළලත් නිලධාරි I

සෙ/628095
පීපීඩීවල් විජේමහනායක

2022 ඔක්තෝබර් මස 14 වන
දින සිට

4 වන ශ්‍රී ලංකා
විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු
බලකායේ ප්‍රධාන ලිපිකරු ලෙස

බළලත් නිලධාරි I

සෙ/627897
බීජීජේඩී බංඩාර

2022 දෙසැම්බර් මස 06 වන
දින සිට

4 (සෙවා) ශ්‍රී ලංකා
සුද්ධ හමුදා කෘෂි හා පසු සමීපක්
බලකායේ රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

බළලත් නිලධාරි I

සෙ/ඩබ්ලිව්00277
එච්එම්අයි තේරත් බංඩාර

2022 දෙසැම්බර් මස 12 වන
දින සිට

සුද්ධ හමුදා මූලස්ථාන
ගමන් පාලන අධ්‍යක්ෂ
මණ්ඩලයේ ප්‍රධාන ලිපිකරු ලෙස

බළලත් නිලධාරි II

සෙ/579127
නවරත්න එස්එම්එස්

2023 ජනවාරි මස 27 වන දින
සිට

15(සෙවා) ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

බළලත් නිලධාරි II

සෙ/4එස්01206
පුෂ්ප කුමාර පීඩීඑස්

2022 දෙසැම්බර් මස 06 වන
දින සිට

3(සෙවා) ශ්‍රී ලංකා
සුද්ධ හමුදා කෘෂි හා පසු සමීපක්
බලකායේ ප්‍රධාන සරඹ උපදේශක
ලෙස

බළලත් නිලධාරි II

සෙ/ඩබ්ලිව්00493
මධුසංක එච්ඩී

2022 දෙසැම්බර් මස 12 වන
දින සිට

2(සෙවා) ශ්‍රී ලංකා
සුද්ධ හමුදා කෘෂි හා පසු සමීපක්
බලකායේ ප්‍රධාන සරඹ උපදේශක
ලෙස

බළලත් නිලධාරි II

සෙ/ඩබ්ලිව්00808
රසාංක කේඑට

2022 නොවැම්බර් මස 11 වන
දින සිට

4 වන ශ්‍රී ලංකා
විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු
බලකායේ ප්‍රධාන සරඹ උපදේශක
ලෙස

මාණ්ඩලික සැරයන්

සෙ/628784
රාජපක්ෂ ආර්ඩීආර්සී

2022 ඔක්තෝබර් මස 26 වන
දින සිට

සෙබළ සිතුවිලි

පෝලිම...

තුන්පෙල සදයි නිතරම අපි ශ්‍රවුන්ඩ් එකේ
නිතරම වෙක් වෙනවා කව්රුත් පෙරඩ් එකේ
වැරදි ඊකක් තිබුණද අපේ සරඹ ඊකේ
පහදා දෙන්න ප්‍රළුවනි මට ඊකෙන් ඊකේ

අප පහුවෙලා මා ගියකළ මෙස් එකට
හොඳ හැඩ වැරෙන් පහරක් වැදුණා කනට
බඩගිනි නිසා ආවා කෝප්‍රල් මෙස් එකට
ගත්තද උඹ මම සෙල්ලම් බඩුවකට

නිවසට ගිය එවදී පෝලිම් සිහි වන්නේ
රෑ හීනෙනුත් මොනවද ඔබ දොඩ වන්නේ
දවසක් ඕරිඳ මාගෙන් එය එමසන්නේ
පෝලිම තමයි සෙබළෙකුගේ දාහකුක දන්නේ

සෙ/418559
කෝප්‍රල් රෝහිත එච්එස්එච්
4 ගැජේබ

සීතල වෙල් ගුරු පාර....

සීතල උදෑසනක්
දසතින් නැග එන
සුසිනිදු සුළං රැලි
දඟකාරකමින් නැටුවා
වෙල්යායේ තිළුවන්
ගුරු පාරේ
පුංචි දුවක් අත අල්ලා
අකුරට යන හැටි පෙනෙනා
මා හද හැඟුමන්
පුබුදු කළා
හිරිමල් යෞවනියේ නුඹ..

නි/70207
කපිතන් (ප්‍රපා) එම්එස් චන්ද්‍රසිරි
ආමාප්‍රකා තිල තිවස

නික්ම යමි දුර ඈතට...

පේවෙලා වෙන් කලත් පඬුරක් බැතිබරව ඔය සෙනෙහෙට
ඇතුත නැතුත වීලාසෙන් මුළු හදම පාරයි සදහට
ඉඳල හිටලා සඳක් වැඩියත් මගේ වැහිබර අහසට
පලක් නෑ මොහොතකින් අඳුරුයි මුරුගසන් වරුසාවට

නෙතක කඳුලැලි ගලායද්දී අනෝරාවක වැහියට
හදක රිදවුම් දරා ගන්නම් නුඹ අයිති ඇගෙ ලෝකෙට
සිතක ලියවුණු කවිය ඇය නම් හීන දුන්නද කුමකට
මතක බණවත් එපා තහනම් ඕයඇදුණු සෙනෙහසකට

අදින් පසු පෙරමඟ බැලුව මේ දාස් ගන්නම් ශ්‍රවතට
යොතින් තදකළ ප්‍රේමයය බැම් ලිහිල් කෙරුවෙම් සදහට
සිතින් පිටමන් කරනු බෑ මං ආදරෙයි මහමෙරකට
ඉතින් අවසර පා වඳින්නට නික්මයම් දුර ඈතට

එදරාශ පතිරත්න - කොබෙයිගනේ

මා ලඟින් සිටි ඇය...

මා ලඟින් සිටි ඇය
මා දමා යන්න ගිහින්
නොලැබුණත් ඔබේ ආදරේ
මා තවත් ආදරෙයි..

අද ගත් ඇමතුමෙන්
මට දැනුණා ඔබ
මාගේ ඇසුරෙන්
ඔබ සමු අරන් බව..

සෙ/653606
ලා/කෝ සම්පත්
ඩබ්ලිඑම්ඩීකෝ
විශේෂ බලකා පුහුණු පාසල

මගේ තාත්තා...

මා නුඹේ පුතු බව
ලොවටම කියන්නට
තාත්තේ මං හරි පිංකාරයි

නුඹ මට දුන් හැම
සෙනෙහසේ ඔඳකට
තාමත් මන් නුඹේ නමට
ණයයි..

නිමා නොවෙනා තරමට
දුන් සෙනෙහස
තවමත් මන් ගාවයි..

තාත්තේ නුඹ නැති
හෙටක් ගැන හිතන්නට
සත්තකින්ම මන් හරි
බයයි..

සෙ/ඒ1000662
තුෂ පුෂ්පකුමාර පේවම්සිපී
5(සෙව) රෙජි ශ්‍රීලංකා

මව...

සිනිඳු සියුමැලි අතැඟිලි
වෙලා ගිනියම් පසඟිලි
දරා දෝතින් දුක ගිරි
නොනග කිසිවක් මැසිවිලි

කුසට අහරත් නැතිවෙලා
ගමන නොනැවතී නිති සලා
නොදනි රැය දහවල් කියා
නිමක් නැති වැඩ නිම කළා

ගතට දැණුනත් දැඩි වඩා
නෙතට කඳුළක් නැති උනා
නැතිව උපදෙස් වුවමනා
සියලු වැඩ ඇත නිමවෙලා

රටම ගිනිගෙන දැවිලා
ඇසද ඇති සැටි මිරිකිලා
තනිව ගමනක යෙදිලා
හැකිද යනු දුර තනිවෙලා

සැඩ දියඹ සැදු තියමු
දුක ගැහැට කළ තියුණු
ළඳ බොළඳ මට සිළුවු
සඳ නුඹය වෙර වැඩුණු

ලුතිනන් කර්නල්
ඩිපීඊම්ආර්ඩී ධම්මන්තොට
පීඑස්සී
අණදෙන නිලධාරී
12 කාලාරෙ ශ්‍රීලංකා

අභිමානවත් 43 වන සංවත්සරය සමරයි

කොස්ගම, සාලාවෙහි පිහිටි යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන අණසක මූලස්ථානයේ අභිමානවත් 43 වන සංවත්සරය ඉකුත් ජනවාරි මස 01 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් එම මූලස්ථානයේ වැඩසටහන් රැසක් පැවැත්විණ.

එහිදී, ඉකුත් දෙසැම්බර් මස 31 දින කොස්ගම "සැඳෑ සෙවණ" වැඩිහිටි නිවාසයේ ශ්‍රමදාන වැඩසටහනක්, දානමය පිංකමක් සහ ත්‍යාග ප්‍රදානෝත්සවයක් සංවිධානය කරන ලදී. සංවත්සර දින සමාරම්භය සනිටුහන් කරමින් හටකාර්ය සම්පාදක අණසක ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒයිඑම්ඩී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී වෙත හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳුවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනමනු ලැබූහ. අනතුරුව, හටපිරිස් ඇමතීමට ක්‍රියාකළ ආඥාපති සියලුනිල දිවා භෝජන සංග්‍රහයටද එක්විය. මෙම අවස්ථාව සඳහා එම මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයන් විශාල පිරිසක් සහභාගී වූහ.

රණවිරුවා

අධීක්ෂණය

මේජර්ජනරල්
එම් වික්‍රමසූරිය ඩබ්ලියූ පීඑස්සී

උපදේශනත්වය

ඉතිහාස සරනල්
ආර්එම්එම්ජීගේ රත්නායක

ප්‍රධාන සංස්කාරක

ඉතිහාස සරනල්
සුජිත් චමින්ද එදිරිසිංහ

සහය සංස්කාරක

කපිතාන්
ඒඑම්ඩබ්ලියූ ඉමේශා

පරිගණක අකුරු සංයෝජනය,
තවර නිර්මාණය හා පිටු සැකසුම
කෙ/752158 කනි II සේනාරත්න ජීඩී - 3 ඉංජිනේරු
කෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජේඒඑම් - 11 ඉංජිනේරු
කෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉංජිනේරු

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ලුහ දිගුව

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය මත්තේ සියවීමට

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා හපනුන්ට ත්‍යාග හා කුසලාන

අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගිය ජනවාරි 04 වන දින සන්ධ්‍යාවේ පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

රටෙහි පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත යුද්ධ හමුදාව වෙතින් 2022 වසර පුරා පවත්වන ලද අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා තරඟාවලි ජයග්‍රාහකයින් වෙනුවෙන් සහතිකපත්‍ර සහ කුසලාන ප්‍රදානය කිරීම සඳහා මෙම ඒකාබද්ධ ත්‍යාග ප්‍රදානෝත්සය සංවිධානය කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ සිට ඉදිරියටත් එය ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

මෙම ත්‍යාග ප්‍රධානෝත්සවයේදී, අන්තර් රෙජිමේන්තු පැසිපන්දු ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු අත්පන්දු ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු කබඩි ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු හොකී ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු "PACE" ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු හොකි ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු කිලියඩ් සහ ස්නූකර් ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු බර ඉසිලීමේ සහ සවි එසවීමේ ශූරතාවලිය - 2022, අන්තර් රෙජිමේන්තු මුයිතායි ශූරතාවලිය - 2022 සහ අන්තර් රෙජිමේන්තු ෂූඩෝ ශූරතාවලිය - 2022 යන ශූරතාවලි නියෝජනය කරමින් තරඟ වැදුණු ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත කුසලාන සහ සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබූහ.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් සීඩී විරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ද ජයග්‍රාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත කුසලාන සහ සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට එක්වූහ.

ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් නියෝජනය කරමින් දස්කම් දක්වා යුද්ධ හමුදාව වෙත කීර්තියක් අත්කරදුන් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 28 දෙනකු වෙනුවෙන් මෙම අවස්ථාවේදී චෙක්පත්ද ප්‍රදානය කෙරිණ.



රට වෙනුවෙන් මඩ හැම

යුද්දෙ තිබුනෙ තුවක්කු පත්තුවුන තැන්වල විතරක්ම නෙවෙයි. ක්‍රියාන්විත බිමේ හැම තැනකම යුද්ද තිබුන. ඒත් ඒ සමහර යුද්ද තිබුනෙ ගිනිඅවි එක්ක විතරක් නෙවෙයි සොබාදහමත් එක්ක.

"මඩ" ගැන අපේ රටේ කතා බොහොමයි. මඩ ගාගැනීම, මඩ නාගැනීම, මඩ ගසා ගැනීම වගේ වචන පොදු ව්‍යවහාරෙදී ඕනතරම්. ඒත් මේ කියන්නෙ යුද බිමේ මඩ ගැන. අපේ රණවිරුවො ඒ මඩ ගාගත්තෙ රට වෙනුවෙන්. ගෙවුනු තිස්වස පුරාවට ලබපු හැම ජයග්‍රහණයක් පිටුපස්සෙම සොබාදහමේ අකාරුණික හැසිරීම්වලට එරෙහිවත් අපේ රණවිරුවො සටන් වැදුනු තැන් බොහොමයි. මේ මතක ඒ ගැනයි.